# තීර්ථ

කොවිඩ් මර්ධනය වෙනුවෙන්
වරාය අධිකාරියෙන්
මාර්ගෝපදේශ සංග්‍රහයක්

සුව විරු සමාජ සත්කාරය

පිටු 40 කින් සමන්විත විශේෂ කලාපය

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකා රජයේ ලියාපදිංචි කරන ලදී.

හයවන කාණ්ඩය / 08 වන කලාපය / 2020 ජූලි



# මානුෂීය මෙහෙයුමකින් වරාය කොවිඩ් ජය ගනී

Con. 04

# ආපසු හැරී බලමු

ආර්ථිකය සම්බන්ධයෙන් මෙන් ම ජාත්‍යන්තර සබඳතා සම්බන්ධයෙන් ද ලෝකය පුරා ම අද වන විට අලුත් සිතීමක අවශ්‍යතා පැන නැගී ඇත. එක් අතකින් බලන විට මෙම කොරෝනා ව්‍යසන තත්ත්වය අපේ ස්වභාවයට එල්ල වූ උවදුරකි. එයින් අපේ සංස්කෘතිය පවා යම් ආකාරයකින් වෙනස් කර ගැනීම ට අප ට බලපෑම් එල්ල කොට තිබේ. මෙවර අප සිංහල-හින්දු අලුත් අවුරුද්ද, වෙසක්, රාමසාන්, පොසොන් ආදී ආගමික සංස්කෘතික අවශ්‍යතාවයන් ද පෙර දා මෙන් සැමරුමට අවකාශ නොලැබුවෙමු.

මෙම ව්‍යසන තත්ත්වය අපේ දොරට තට්ටු කරනුයේ අතිශය දැවැන්ත අභියෝගයක් ලෙසිනි. එබැවින් එයට මුහුණ දීම වෙනුවෙන් අප සියලු දෙනා මනාකොට සූදානම් විය යුතු ය. සංවිධානය විය යුතු ය.

මෙවන් අර්බුදකාරී තත්ත්වයක් තුළ සමූහයක් ලෙසින් ආයතනයේ පැවැත්ම, චිර ජීවනය උදෙසා කටයුතු කළ ආකාරය පිළිබඳ ප්‍රථමයෙන් ම පැසසිය යුතු ය.

සමස්ථ දේශය ම පසුගිය මාර්තු මස 11 වැනි දින සිට අඳුරු කලාපයක් බවට පත් වි ය. එවන් තත්ත්වයක හිඳිමින් සිය බහලු මෙහෙයුම් ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යෑමට සිය උපරිම ශඛ්‍යතාව කැප කළ සියළු සේවක මහත්ම මහත්මීන් ට සමස්ථ වරාය අධිකාරියේ ම ප්‍රණාමය හිමිවේ. රණ විරුවන්, සුව විරුවන් කළ අපමණ මෙහෙවර නොදෙවනි ව ඔබ සියළු දේ කැප කරමින් සේවයට පැමිණි ආකාරය විස්මය ජනක ය. ඇතැම් සේවක මහතුන් දෙනියාය සිට, තිස්සමහාරාමයේ සිට යතුරුපැදියෙන් සිය සේවා මුරයට වාර්තා කළ බැව් අපට අසන්නට ලැබුණි. මේ කිසිඳු සේවක මහත්ම මහත්මියක් තම සේවය උපරිමයෙන් ඉටු කළා මිස ඒ පිළිබඳව මැසිවිලි නැගූවේ නැත. ඒ සඳහා දිවි හිමියෙන් කැප වී ය. ඒ සියළු දෙනා වෙත තීර්ථ ප්‍රනාමය පුදකර සිටින්නේ හද පිරි බැතියෙනි.

බහලු මෙහෙයුම් ක්‍රියාවලිය ට අනුසාංගික මෙහෙවරක් සපයමින් මුතුහරක මුතු සේ එකිනෙක ට පිළිවෙළ ට පෑහෙමින් සියළු කොට්ඨාශයන්ගේ සේවක මහත්ම මහත්මීන් නිසි ලෙසින් කළමණාකරණය කරමින් සිය කොට්ඨාශයේ රාජකාරි කටයුතු දාමය සීමිත සේවක පිරිසක් වෙතින් ඉටු කරමින් අනර්ඝ මෙහෙවෙරක් ඉටු කළ කොට්ඨාශ ප්‍රධානීන් ඇතුළු සියළු විධායක නිළධාරීන්, මෙන් ම බොහෝ දුක් දරාගෙන සිය රාජකාරි නොපිරිහෙලා ඉටු කළ සියළු සේවක මහත්මීන් හට තීර්ථ ප්‍රණාමය මෙලෙස පුද කර සිටින්නෙමු.

සාමූහිකත්වයේ අභිමානය පෙරදැරි කර ගනිමින් නායකත්වය සහ කණ්ඩායම් ක්‍රියාකාරීත්වය තුළින් අපගේ අනාගත ගමන් මග වෙනස් කිරීමට ශක්තිමත් පදනමක් සකස් වෙමින් තිබේ. අපේ සමාජයේ ධනාත්මක බලවේග යක් ලෙස පවිත්‍රතාව සහ පුරුදු පෙර ට ගෙන ඒම එලදායී සංස්කෘතිය සංකේතවත් කරන්නකි. මෙම බලවේගයන් පෙරටු කර අනාගතය සැලසුම් කිරීමේ අවශ්‍යතාවය ද අප ඉදිරියේ ඇත.

මේ මොහොතේ පවතින මෙම සමාජීය ම ය තත්ත්වය පුද්ගලික ව මෙන් ම කණ්ඩායමක් ලෙස අප සැමට ආර්ථික සමාජීය අර්බුදයේ විසඳුම් සඳහා යොමු වීමට අප සතු ශක්තිය අප වෙත ම පසක් කර දෙනු ඇත.

## පශ්චාත් කොවිඩ් වාතාවරණයෙන් පසු
## වරායේ ක්‍රියාකාරීත්වය පිළිබඳ අමාත්‍යවරයාගේ අවධානය





කොරෝනා වසංගත පශ්චාත් තත්ත්වයෙන් පසු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ සාකච්ඡා කිරීමේ විශේෂ හමුවක් මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතන පරිශ්‍රයේ දී පසුගිය දා පැවැත්විණි.

වරායේ මෙහෙයුම් ක්‍රියාකාරීත්වය පවත්වාගෙන යමින් ඉදිරි සංවර්ධන කටයුතු සඳහා කෙසේ සූදානම් විය යුතු ද යන්න පිළිබඳව මෙහි දී අමාත්‍ය ජොන්සටන් ප්‍රනාන්දු මහතා සාකච්ඡාවට ලක් කරන ලදී. විශේෂයෙන් ම මෙහි දී ආයතනික කාර්මික සාමය පවත්වාගෙන යමින් වරායේ මෙහෙයුම් ධාරිතාව ප්‍රශස්ථ ලෙසින් පවත්වාගෙන යාමට උපායමාර්ගික කළමණාකරණ ක්‍රමෝපායන් ඔස්සේ කෙසේ කටයුතු කළ යුතු ද යන්න පිළිබඳ අමාත්‍යවරයාගේ විශේෂ අවධානයට යොමු වි ය.

මෙම අවස්ථාවට වරාය හා නාවික අමාත්‍යංශ ලේකම් එම්.එම්.පී.කේ. මායාදුන්නේ, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සභාපති ජෙනරාල් දයා රත්නායක, අතිරේක කළමණාකාර අධ්‍යක්ෂ උපාලි ද සොයියා ඇතුළු කළමණාකාරීත්වයේ උසස් නිළධාරීන් රැසක් එක් වි ය.


කළමණාකරණ කර්තෘ
නලින් අපොන්සු

නිරීක්ෂණය
නිලන්ත ඉලංගමුව
හර්ෂ උදයකාන්ත පීරිස්
කාව්‍ය ඉන්ද්‍රජිත්

සංස්කරණය
උපුල් ගුරුගේ

පිටු සැකසුම
උදිත චන්දන

සහාය පිටු සැකසුම
දිමුතු තෙන්නකෝන්

පරිගණක අකුරු ඇමුණුම
රේණුකා දමයන්ති

තාක්ෂණික සහාය
රුක්ෂාන් සමරධීර
අසංක රාජපක්ෂ
ලක්ෂ්මන් ඩයස්

ඡායාරූප
ඩී.කේ. වැලිකල
මහින්ද තෙන්නකෝන්

සම්බන්ධීකරණය
දිල්රුක් ජයසේකර
සංජීව විජේසේකර
දේවිකා හෙට්ටිආරච්චි
සන්ධ්‍යා විතාන
එම්.එෆ්.එෆ්. ෆර්සානා

ශ්‍රී ලංකා වරාය අධිකාරිය
සන්නිවේදන හා මහජන සම්බන්ධතා
කොට්ඨාශයේ ප්‍රකාශනයකි



https://news.slpa.lk/theertha
Tel : 011 2483460
Fax : 011 2481917

CONTENT

06



ජාතියේ හදවත නම් වූ අපේ ආයතනය නියම ශ්‍රී ලාංකේය හදවත බවට පත් කිරීම අපේ අරමුණයි - සභාපති ශ්‍රී.ලං.ව.අ.

# මැද පිටුව

## රන් තිළිණ ප්‍රදානය



**පිටු 40 කින් සමන්විත**
**විශේෂ තීර්ථ කලාපය**


කොරෝනා සමය තුළ තීර්ථ මුද්‍රණයට අවකාශය අහිමි විය. එකී සමයේ සුවිශේෂී විස්තර, තොරතුරු, විශේෂාංග යන් මෙන්ම වරායේ කොවිඩ්-19 මර්ධනය සම්බන්ධයෙන් කළමණාකාරිත්වයේ අදහස් කැටිව මෙවර තීර්ථ පිටු 40කින් යුතුව ඔබ වෙත පිරිනමන බැව් දන්වා සිටින්නේ සතුටිණි.

15




15

පහන් කණුවක අමතක නොවන දවසක්



30

කාන්තා දින සැමරුම් උළෙල



38




39




12 අපේ සුව විරුවෝ....



### කවරයේ කතාව

ගෝලීය ආර්ථිකය අඩපණ වීම ලොව සෑම රටක ම ආර්ථිකයන් කෙරෙහි අයහපත් බලපෑම් එල්ල කළේ ය. ආනයන අපනයන ආර්ථිකය කෙරෙහි ඉතා දැඩි නැඹුරු තාවයක් ශ්‍රී ලංකා ආර්ථිකයට ගෝලීය ආර්ථික අවපාතයන් ඉතා තදින් බලපාන්න ට වි ය. මෙවන් තත්ත්වයක් හමුවේ වුව ද නොසැලී, නොබිය ව සිය සේවය ට වාර්තා කරමින් වරාය යනු අත්‍යවශ්‍ය සේවාවක් බැව් පසක් කළ, අපගේ සහෝදර සේවක ප්‍රජාව සමස්ථ වරාය ට ම අභිමානයකි. ඔවුහු කිසිදු විටෙක වරාය පරිශ්‍රයේ මෙහෙයුම් අඩාල නොකළ හ. නියමු මධ්‍යස්ථානයේ සේවක පිරිසක් නෞකාවක ට සිය සේවා ව සපයන අයුරු කැටි වූ මෙම තෙවැනි ඇසේ කතාව ද, කොරෝනා සමයේ සේවක දායකත්වය සිහිපත් කරවයි.

කවරයේ ඡායාරූපය - මහින්ද තෙන්නකෝන්

16-17

වරායේ ප්‍රසන්න පරිසරක් ගොඩනැංවීමට ඇමතිවරු හා සභාපතිතුමා පෙරමුණ ගනී

24 ගිනි නිවන අංශය



# කොළොම්තොට කොවිඩ් මර්ධන මානුෂීය මෙහෙයුම

> සේවක මහත්ම මහත්මීන් විසින් සිය අභිවෘද්ධිය සඳහා ලබා ගත් දසමස්, ප්‍රවාහන, බහුකාර්ය සහ ආපදා ණය සඳහා වන වාරික හා පොළිය අප්‍රේල් සහ මැයි මාස සඳහා අය නොකිරීම ට කළමණාකාරීත්වය විසින් ගත් තීරණය ද දැඩි සේවක පැසසුමට ලක්වීම අරුමයක් නොවන්නේ එපමණකින් ම ආර්ථික බංකොලොත්භාවයට පත් ජනතාව වෙත එය අපමණ සහනයක් වූ හෙයිනි.

මාර්තු මස 11 වැනි දින ශ්‍රී ලංකේය අර්ථ ක්‍රමය උඩු යටිකුරු කළ දවසක් වි ය. ශ්‍රී ලාංකික පළමු කොරෝනා (කොවිඩ් 19) ආසාදිතයා හමුවන්නේ එදින ය. මෙතෙක් චීනයේ වුහාන් වල සිට පැතිරී ඉතාලිය ඇතුළු රටවල ට පමණක් සීමා වූ මාරාන්තික රෝග භය මුළු ශ්‍රී ලංකාව පුරා අසුරු සැනෙන් පැතිරෙන්නට වි ය. මෙවන් තත්ත්වයක් තුළ කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ හුදෙක් අප පමණක් නොව මුළු ලෝකය ම මුහුණ පා සිටිනුයේ ඉතාම බරපතල උවදුරකට ය. මෙවන් ව්‍යසන වල දී වෙනත් රජයන් ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳ රටක් ලෙස අපට අවබෝධයක් ඇත. ඒ අනුව බලන කළ වත්මන් රජය ඉතාමත් සාධනීය, ධනාත්මක, ප්‍රායෝගික හා ඉදිරිගාමී ආකෘතියක් තුළ හිඳිමින් මෙම උවදුරට මුහුණ දුන් බව මැනැවින් පහැදිලි වේ. කෙසේ වෙතත් මෙවැනි උවදුරු අවස්ථා වල දී කිසිවෙකුට තම සිතැඟි අනුව ක්‍රියාත්මක වීමේ හැකියාවක් නැත. මක්නිසාද යත් මෙය වසංගත තත්ත්වයක් බැවිනි. සුදුසු වෛද්‍ය උපදේශනයන් තුළ හිඳිමින් මේ සම්බන්ධව තීන්දු තීරණ ගනු ලැබුවේ එබැවිනි. මේ සඳහා තිරසාර කාර්ය සාධක බලකායක් නිර්මාණය කිරීමේ දී ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමන් විසින් වෛද්‍ය ක්ෂේත්‍රය සහ ආරක්ෂක අංශ මුල්කර ගැනීමට හේතු වූයේ ද මෙය වෛද්‍යම ය ඇසකින් බැලිය යුතු අර්බුදයක් වීම ය. ඇඳිරි නීතිය පැනවීම පවා වෛද්‍ය විද්‍යාත්මක පදනමක් තුළ සිටිමින් කරන ලද්දේ එබැවිනි.

මේ මොහොතේ වෛද්‍ය උපදේශනය මත ක්‍රියාත්මක වීමේ වැදගත්කම හඳුනාගත් ශ්‍රී ලංකා වරාය අධිකාරිය ද වෛද්‍යමය වශයෙන් මෙම අර්බුදය කළමණාකරණය කරන්නට අවැසි දේ ලබා දෙමින් තීන්දු තීරණ ගනු ලැබීම සැබැවින් ම වරාය අධිකාරිය ලෙසින් ලැබූ සමස්ථ ජයග්‍රහණයකි.

කොවිඩ් 19 පැතිර යාමේ අවදානම දින ගණනක් වසා දමා තිබෙන විට ඇති විය හැකි අර්බුද සඳහා විසඳුම් ලබා දීම වෙනුවෙන් දෙවන කාර්ය සාධක බලකායක් ද පිහිටුවන ලදී. මෙම දෙවන කාර්ය සාධක බලකාය පිහිටවනු ලැබූයේ ජනතාවට අත්‍යවශ්‍ය සේවාවන් සපයනු පිණිස ය. විදුලිය, ජලය විදුලි සංදේශ ආදී සියළුම අත්‍යවශ්‍ය සේවාවන් අතර වරාය සේවාවන් ද අත්‍යවශ්‍ය සේවා ලෙසින් නම් කිරීම තුළ වරාය කිසිසේත් නිද්‍රාවට පත් කිරීමට නොහැකි වි ය. එබැවින් මෙහි දී ප්‍රධාන ත ම අභියෝගය බවට පත් වූයේ මෙවන් ව්‍යසන අවස්ථාවක දී මේ අත්‍යවශ්‍ය සේවාවන් කළමණාකරණය කරන්නේ කෙසේ ද යන්න ය. එහි දී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ගරු සභාපති ජෙනරල් දයා රත්නායක මහතා මේ කාර්යය නිශ්චිතව සහ නිවැරදි ව ඉටු කිරීමට කටයුතු කළ බව කිය යුතු ය.

පසුගිය අඳුරු සමය පුරා ම අවශ්‍ය නිළධාරීන් සහ සේවක මහත්ම මහත්මීන් නිසි ලෙස සංවිධානය කරමින් සෞඛ්‍ය අමාත්‍යංශයේ නීති රීති වලට අනුගත ව කොළඹ වරායේ කටයුතු පවත්වාගත් අයුරු සැබැවින් ම විස්මය ජනක ය.

වරාය හා නාවික විෂය භාර ගරු අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතාගේ උපදෙස් මත වරාය හා නාවික අමාත්‍යංශය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා නාවික හමුදාව මෙන් ම ජය බහලු පර්යන්තයේ සහෝදර පර්යන්තයන් වන එස්.ඒ.ජී.ටී හා සී.අයි.සී.ටී පර්යන්ත සමාගම් වල සුසංගත දායකත්වයෙන් මෙම ක්‍රියාවලිය සාර්ථකව ක්‍රියාවට නැංවිනි.

පළමුව ක්‍රියාවට නැංවූයේ කොවිඩ් 19 පිළිබඳව නිසි දැනුවත් භාවයක් සේවක මහත්ම මහත්මීන් තුළ ඇති කිරීම ය. ජාතියේ හදවත ට ජීවය සලසන සේවක ප්‍රජාව කොරෝනා උවදුරෙන් රැක ගැනීමේ අරමුණෙන් පසුගිය මාර්තු 10 වැනි දින එහි පළමු පියවර තැබිණි. මහපොළ අභ්‍යාස ආයතනය වෙත සියළු කොට්ටාස නියෝජනය කරමින් සේවක මහත්ම මහත්මීන් ඒකරාශී වූයේ නිරෝධායනය පිළිබඳ පුළුල් ලෙස දැනුවත් වීමේ අරමුණිනි.

මාර්තු මස 13වැනි දින පැවැති කළමණාකරණ හමුව සුවිශේෂී වන්නේ ඒ තුළින් වරාය පරිශ්‍රයේ කොවිඩ් 19 මර්ධනයෙහි ලා බෙහෙවින් ඉවහල් වූ තීන්දු තීරණ රැසක් ගත් හෙයිනි. කාර්යාල පරිශ්‍රයන්ගේ සහ වැඩබිම් වල සේවක මහත්ම මහත්මීන්ගේ සෞඛ්‍යාරක්ෂාව සඳහා වූ මූලික අඩිතාලම සකස් කිරීමට ඒ තුළින් සෙත සැලසුණු හෙයිනි. ඒ යටතේ මූලික විෂබීජහරණය ට අදාල උපකරණ හා ආරක්ෂිත දියර මෙන් ම සියලු සේවක ප්‍රජාව උදෙසා මුඛ ආවරණ ලබා දෙමින් එහි භාවිතයේ ඇති සෞඛ්‍යාරක්ෂිත බැව් පිළිබඳ සියළු වරාය සේවක මහත්ම මහත්මීන් වෙත පුළුල් දැනුමක් ද ලබා දෙන ලදී. සේවක මහත්ම මහත්මීන්ගේ සියළුම විදේශ සංචාරයන් ද අත්හිටුවීමට ක්‍රියාකරන ලද්දේ රජයේ නියාමනයන්ට අනුකූලව ය.

වත්මන් කළමණාකාර අධ්‍යක්ෂ ඩබ්ලිව්.එස්. වීරමන් මහතාගේ සහ අතිරේක කළමණාකාර අධ්‍යක්ෂ උපාලි ද සොයිසා මහතාගේ සම්බන්ධීකරණයෙන් කොවිඩ් 19 නිවාරණ කමිටුවක් ආරම්භ කිරීම ද වරායේ සේවක මහත්ම මහත්මීන් ගේ සෞඛ්‍ය ස්ථායිතාව උදෙස් සිදු කරන







# සේවයට පැමිණෙන පිරිසගේ කැපවීමට කළමණාකාරීත්වයේ ප්‍රතිචාර

ලද ප්‍රශස්ථ පියවරකි. මෙම කමිටුව තුළින් රජය හා සෞඛ්‍ය අමාත්‍යංශය ලබා දෙන උපදෙස් හා නියෝගයන් ආයතනය තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නියාමනය සැලසිනි. වරාය පරිශ්‍රයේ කොවිඩ් 19 ආශ්‍රිත සියළු තොරතුරු එක්රැස් කිරීම, වාර්තා කිරීම, අවශ්‍ය පරිදි ඉහළ කළමණාකාරීත්වය දැනුවත් කිරීම, නෞකා සම්බන්ධයෙන් පැන නගින ගැටළු කළමණාකරණය කිරීම, ආයතනික අවශ්‍යතා සම්බන්ධීකරණය, වරාය ගාස්තු, සේවා සැපැයුම් ගැටළු සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය සැපයීමේ අරමුණෙන් 'කොරෝනා නිවාරණ මෙහෙයුම් මධ්‍යස්ථානය' ඇරඹෙන්නේ ද කොවිඩ් 19 නිවාරණ කමිටුවේ ප්‍රතිඵලයක් ලෙසිනි. ආරක්ෂක කොට්ඨාශය තුළ 'විෂ බීජහරණ ඒකකය' ස්ථාපිත වන්නේ ද මෙම කාල වකවානුවේ දී ම ය.

වරාය පරිශ්‍රයන් හි කොවිඩ් 19 ව්‍යසනය පාළනය කිරීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ කොවිඩ් 19 නිවාරණ ඒකකය සමග අත්වැල් බැඳගනිමින් කටයුතු කිරීමට වෛද්‍ය කොට්ඨාශය මැදිහත් වි ය. මේ සඳහා ආරක්ෂක කොට්ඨාශය වෙතින් ද නොමඳ සහායක් ලැබුණි. ආරක්ෂක නිලයන් විසින් සියළුම පිවිසුම් දොරටු වෙතින් වරාය පරිශ්‍රය වෙත ඇතුල් වන සෑම පුද්ගලයෙකුගේ ම ශරරීර උෂ්ණත්වය අදාල සංවේදන උපකරණ මගින් පරික්ෂා කිරීමට කටයුතු කරන ලදී. එලෙස පරික්ෂා කිරීමේ දී කිසියම් පුද්ගලයෙකුගේ ශරීර උෂ්ණත්වය සෙල්සියස් අංශක 37.5/ ෆැරන්හයිට් අංශක 99 ($37.5^0c$/ $99^0F$) ට වැඩි අගයකින් පවතින බව නිරීක්ෂණය වුවහොත් එම පුද්ගලයා වරාය සේවකයෙකු නම් නොපමාව ප්‍රධාන වෛද්‍ය නිළධාරී වෙත යොමු කිරීමට ද, නැවත ඇතුල් වීමට අවසර නොදීමට ද, එම පුද්ගලයා ආයතනයේ සේවකයෙකු නෙවේ නම් වරාය පිවිසුම් දොරටු වලින් ඇතුල් වීමට අවසර නොදීම ට ද ආරක්ෂක අංශ වෙත උපදෙස් ලබා දීම ද සිදු වි ය.

වරාය පරිශ්‍රය තුළ පවත්නා පෙරට්ටුපෙළ, ක්ෂේත්‍ර රාජකාරි ස්ථාන, විවේකාගාර හා කාර්යාල යන ස්ථානයන් වෙත ක්ෂණිකව පැමිණ ඒවායේ රැඳි සිටින සේවක මහතුන්ගේ ශරීර උෂ්ණත්වය සංවේදන උපකරණ මගින් පරීක්ෂා කිරීමට ද, ආරක්ෂක අංශ විසින් පියවර ගනු ලැබී ය. එය අද දවසේත් අඛණ්ඩව ක්‍රියාත්මක වන්නේ වරායේ මානව සම්පත නිසි සෞඛ්‍යාක්ෂිත තත්ත්වයෙන් පවත්වා ගැනීම වරාය කළමණාකාරීත්වයේ මුඛ්‍ය අරමුණ බැවිනි.

දීර්ඝ කාලීන අසනීප (දියවැඩියා, අධි රුධිර පීඩනය, රුධිරගත කොලෙස්ටරෝල්) සඳහා මාසිකව ඖෂධ ලබා ගන්නා සේවක මහත්ම මහත්මීන් දිනපතා පෙ.ව. 07.00 සිට පෙ.ව. 10.00 දක්වා ක්‍රියාත්මක හදිසි ඇමතුම් අංකයෙන් වෛද්‍ය මධ්‍යස්ථානය



අමතා ඖෂධ ලබා ගැනීමේ වැඩපිළිවෙළ ද එහි ම දිගුවකි.

නියමිත සේවා මුර/ රාජකාරීන් අවසන් කර නිවෙස් වෙත ගමන් ගන්නා සේවක මහත්ම මහත්මීන් ඇඳිරි නීතිය පවත්නා කාලය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් නිකුත් කර ඇති රාජකාරි හැඳුනුම්පත් භාවිත කරමින් අයථා ලෙස ගමන් බිමින් කිරීමේ අවධානම පිළිබඳව ද සේවක මහත්ම මහත්මීන් නිරන්තර යෙන් දැනුවත් කිරීම් කරන ලදී. එහි මුඛ්‍ය වෑයම වූයේ ද වරාය සේවක මහත්ම මහත්මීන්ගේ සෞඛ්‍ය තත්ත්වය නංවාලමින් වරායේ මෙහෙයුම් ක්‍රියාකාරීත්වය පෙර සේම පවත්වා ගැනීම ය.

රජය විසින් පනවා ඇති ඇඳිරි නීතිය හේතුවෙන් වරාය අධිකාරියේ සේවක මහත්ම මහත්මීන් ට ද සාමාන්‍ය පරිදි සේවය පැමිණීමට නොහැකි වූ වකවානුවක තම පුද්ගලික වාහනයෙන් හෝ වෙනත් ප්‍රවාහන ක්‍රම භාවිතා කරමින් සේවයට පැමිණෙන සේවක මහත්ම මහත්මීන්ගේ කැපවීම පිළිබඳව සැලකිල්ලට ගත් වරාය අධිකාරියේ කළමණාකාරීත්වය 2020.03.16 දින සිට ඔවුන්ට සේවයේ යෙදීම වෙනුවෙන් සාමාන්‍ය නිවාඩු දිනයක දී මෙන් අතිකාල ගෙවීමට තීරණය කිරීම ආයතනයක් සිය සේවක ප්‍රජාව උදෙසා සිදු කළ ගෞරවණීය ප්‍රණාමයකි. තව ද මෙහි දී මහජනතාව එක් රැස්වීම වළකාලමින් හා මහා මාර්ග වලින් ඇත් කර නිවෙස් වලට සීමා කිරීමේ අරමුණින් රජය විසින් පනවා ඇති පොදු නීති රීති වලට අනුකූලව අත්‍යවශ්‍ය රාජකාරීන් හි යෙදිය යුතු සේවක පිරිස් පමණක් සේවයට කැඳවීමට ද කටයුතු සම්පාදනය කෙරිණි.

සේවා අවශ්‍යතාව මත සේවයට වාර්තා කරන ලද, එහෙත් ඉරිදා දින සේ සලකා ගෙවනු ලබන විශේෂ අතිකාල දීමනාව නොලබන නිළධාරී/ සේවක මහත්ම මහත්මීන් හට රු.500.00ක දීමනාවක් ගෙවීමට කටයුතු කිරීම ද එහි ම දිගුවක් ලෙසින් සැලකිය හැකි ය.

කිසියම් සේවක මහත්ම මහත්මියක විසින් කොට්ඨාශ ප්‍රධානීන්ගේ අනුමැතිය සහිතව සේවා අවශ්‍යතාවය මත සේවයට වාර්තා කිරීමේ දී, ප්‍රථමයෙන් ම වෛද්‍ය කොට්ඨාශය වෙත යොමු කිරීමටත්, එහි දී මූලික සෞඛ්‍ය නිර්දේශයන් ලබා දීමටත් කටයුතු කරනු ලබයි. තව ද රජයේ චක්‍රලේඛ ප්‍රකාරව නිවසේ සිට රාජකාරි සිදු කිරීමේ පහසුකම ද අත්‍යවශ්‍ය සේවකයන් හා නිළධාරීන් වෙත මෙතුළින් සලසා ඇත.

කොට්ඨාශයේ සිටින මුළු සේවක පිරිසෙන් 1/3ක සේවක පිරිසක් දිනකට කැඳවීමට පියවර ගත් අතර, රාජකාරි ස්වභාවය මත සේවක මහත්ම මහත්මීන් විද්‍යුත් පණිවුඩ හුවමාරු ක්‍රමවේදය (EDI) යටතේ සිදු කළ හැකි කාර්යයන් නිවසේ සිට ඉටු කරවා ගැනීමට පියවර සලසාලමින් සේවක ආරක්ෂාව මෙන් ම ආයතනීය කාර්යක්ෂමතාවය ද එකසේ පවත්වාගෙන යෑම වෙසෙසින් පැසසිය යුතු ම ය.

දිනකට කැඳවන සේවක පිරිස සතියේ මුර පදනම මත කණ්ඩායම් සකසා කැඳවීමට අවකාශය සැලසුණු අතර, කැඳවන සේවක පිරිස සේවා ස්ථානයට ආසන්නව පදිංචි අයට ප්‍රමුඛතාව ලබා දීම ද සිදු වි ය.

සේවයේ නියුතු සේවක මහත්ම මහත්මීන් ගේ සුභ සාධනය ද ප්‍රශස්ථ මට්ටමකින් පවත්වා ගැනීමට පියවර රැ




සක් ගනු ලැබූ අතර, සේවක අභිප්‍රේරණය නංවාලමින් සිදු කළ එම වැඩපිළිවෙළ සේවක මහත්ම මහත්මීන් ගේ ද දැඩි ප්‍රසාදයට ලක් වි ය. රටේ පවතින කෙරෝනා වසංගතය හේතුවෙන් රජය විසින් පනවා ඇති ඇඳිරි නීති කාල සීමාව තුළ අපනශාලා වසා තැබීම හේතුවෙන් කළමණාකාරීත්වයේ නිර්දේශ මත සේවයට වාර්තා කළ සේවක මහත්ම මහත්මීන් සඳහා මධ්‍යම මුළුතැන්ගෙවල් අංශයෙන් උදේ ආහාර, තේ සහ කෙටි කෑම වේල් ලබා දීමට කටයුතු කිරීම මෙන් ම ප්‍රතිශක්තිකාරක කොත්තමල්ලි පානයක් ලබා දීම, ප්‍රධාන සෑම මාර්ගයක් සඳහා ම ප්‍රවාහන පහසුකම් සැලසීම, ඉන්දන සහන ලබා දීම ඒ අතර විශේෂිත ය.

සේවක මහත්ම මහත්මීන් විසින් සිය අභිවෘද්ධිය සඳහා ලබා ගත් දසමස්, ප්‍රවාහන, බහුකාර්ය සහ ආපදා ණය සඳහා වන වාරික හා පොළිය අප්‍රේල් සහ මැයි මාස සඳහා අය නොකිරීම ට කළමණාකාරීත්වය විසින් ගත් තීරණය ද දැඩි සේවක පැසසුමට ලක්වීම අරුමයක් නොවන්නේ එපමණනින් ම ආර්ථික බංකොලාත්භාවයට පත් ජනතාව වෙත එය අපමණ සහනයක් වූ හෙයිනි.

වරායේ මෙහෙයුම් ක්‍රියාකාරීත්වය නිසි පරිදි පවත්වාගෙන යමින් නාවික හා සමුද්‍රීය වෙළඳ පාර්ශවයන් වෙත අවශ්‍ය සහන සැලසීමට ද, වාරය හා නාවික අමාත්‍යංශය

**සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශයේ නිරීක්ෂණයකි**

28 පිටුවට

# ජාතියේ හදවත නම් නියම ශ්‍රී ලාංකේය අපේ ජෙනරාල් දයා

සංලාපය - උපුල් ගුරුගේ

ශ්‍රී ලංකා යුධ හමුදාවේ 20 වන හමුදාපතිවරයා ලෙසින් ඉතිහාසයේ සිය නම සනිටුහන් කළ ඔහු වීර වික්‍රම විභූෂණ, රණ වික්‍රම, රණ ශූර, උත්තමසේවා, දේශ පුත්‍ර සම්මානයන්ගෙන් පිදුම් ලැබූ ජෙනරාල් වරයෙකි. 2013 වසරේ අගෝස්තු 15 වැනිදා සිට 2015 වසරේ පෙබරවාරි 21 දක්වා යුද හමුදාපති ලෙසින් කටයුතු කළ ඒ මහතා කලෙක පුනුරුත්තාපන කොමසාරිස් ධූරයේ ද කටයුතු කළේය.

අද දවසේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ධූරය හොබවන එතුමා ජාතික කොවිඩ් මර්ධන මෙහෙයුම් කමිටුවේ ද සක්‍රීය දායකත්වයක් සපයන්නෙකි. මේ ජෙනරාල් දයා රත්නායක නම් වූ අග්‍රේසර නියමුවා සමගින් කොරෝනා හමුවේ වරායේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තීර්ථ කළ සංලාපයකි.

**ඔබතුමා වරාය අධිකාරියේ සභාපතිවරයා ලෙසින් වැඩභාරගත් අවස්ථාවේ කොළඹ වරාය සම්බන්ධයෙන් දැනුණු ආකල්පය කුමක්ද..?**

මෙහෙමයි, වරාය කියන්නේ ලංකාවේ හදවත කියන කාරණාව මම දැන සිටියා. ලංකාව ලෝකයේ පිහිටා ඇති තැනත්, එයට නාවික ක්ෂේත්‍රය තුළ පවතින ඉල්ලුම පිළිබඳ වගේම දේශපාලනික, ආර්ථික, සමාජයීය සියලු අංශයන්ගෙන් සලකා බැලුවත් වරාය කියන්නේ ඉතාම වැදගත් මේ රටේ මර්මස්ථානයක් බැව් මං දැන සිටියා. හමුදාවේ සේවය කළ අයෙක් විදියට ජාතික ආරක්ෂාව පිළිබඳ නිරන්තරයෙන් කතා කරන විට, ඒ පිළිබඳ සාකච්ඡා කරන විට, ඒ පිළිබඳ විවිධ සම්මන්ත්‍රණ තියෙනවිට මේ පිළිබඳ අපි ගැඹුරින් අධ්‍යයනය කර තිබෙනවා. ඒ නිසා සමස්ථයක් වශයෙන් වරායේ වැදගත්කම කියන කාරණාව පිළිබඳ මට ගැඹුරු අවබෝධයක් තිබුණා. ලෝකයත් සමග සම්බන්ධ වන ආයතන දෙකයි අපට තිබෙන්නේ. ඒ තමයි ගුවන්තොටුපොල සහ වරාය. නමුත් වරායේ සේවයට පැමිණීමත් සමග මම දැනගත්තා 99.7% අපේ ආනයන අපනයන සිදුවෙන්නේ වරායෙන්. අපි දන්නා පරිදි ගුවන්තොටුපල මේ කොරෝනා තත්වයත් සමග මාස කිහිපයක සිට වසා දමා තිබෙනවා. එය එතරම් සාමාන්‍ය ජනජීවිතයට බලපෑමක් නැහැ. නමුත් වරාය ඒ ලෙසින් මාස කිහිපයක් වසා දැම්මොත් රටේ තත්ත්වය සහමුලින්ම වෙනස් වේවි. ආහාර පාන, ඇඳුම් පැලඳුම්, බේත් හේත් වැනි බොහෝ දේවල් සම්බන්ධයෙන් අපි පිටරටින් යැපෙන නිසා වරායේ මෙහෙයුම් කටයුතු නතර කර වසා දැමීම කිසිසේත් කළ හැකි දෙයක් නොවේ. ඉතින් ඒ නිසා වරායේ වටිනාකම පිළිබඳව, වරායේ රාජකාරිය පිළිබඳව ගත් විට මට ඒ පිළිබඳ යම් අවබෝධයක් තිබුණා. මම මෙතැනට ආවේ ඒ අවබෝධයත් සමග බොහෝම කැමැත්තෙනුයි. එයයි මට වරාය සම්බන්ධයෙන් තිබුණු අවබෝධය.



"කියන්න සතුටුයි වරාය පරිශ්‍රයේ අපේ කිසිදු සේවකයෙකුට කොරෝනා වැළඳුනේ නෑ. එයයි අපට තිබෙන ලොකුම ශක්තිය. අපේ රාජකාරි මට්ටමෙන් අපෙන් කිසිවෙකුට ඒ රෝගය වැළඳීමේ අවස්ථාවක් තිබුණෙත් නැහැ. ඒ වගේම මෙහෙයුම් කටයුතු වලදී කිසිම නැවකට අපෙන් කිසිදු ප්‍රමාදයක් සිදු නොවී මෙහෙයුම් කටයුතු සිදු කිරීමටත් අපිට හැකි වුණා."

**වරාය අධිකාරියේ කටයුතු විශාල වශයෙන් පසුබෑමකට ලක්ව ඇති බවත්, අභියෝග ජය ගැනීමට කටයුතු කළ යුතු බවත් ධූරයේ රාජකාරි භාර ගැනීමෙන් අනතුරුව ඔබ පැවසුවා...?**

ඔව්. වරාය අධිකාරියේ කටයුතු විශාල වශයෙන් පසුබෑමකට ලක්ව ඇති බවයි මූලික වටහා ගැනීමේදී මට පැහැදිලි වුණේ. ඉක්මනින්ම කරන්නට ඕනෑ කටයුතු රාශියක් තිබෙනවා. අපේ වරායයන්ට තිබෙන ඉල්ලුම විශාල වශයෙන් වැඩිවෙලා තියෙනවා. එයට සාපේක්ෂව සැපයුම් කරන්න අපට විශාල බාධක තිබෙනවා. ඒ බාධක අපි ඉඳුරාම ජයගන්නට කටයුතු කරන්නට ඕනෑ. එය තමා අපිට තිබෙනව ප්‍රධානම අභියෝගය හැටියට පැහැදිලි වුණේ.

**කොරෝනා වසංගතය මෙරටේ හිස එසවීමට පෙර සිටම ඔබතුමා ඒ සඳහා කටයුතු කළා...?**

ඔව්. කොළඹ වරාය පිළිබඳ ලෝකයේ ඇති කීර්තිනාමය ඉහළ නංවා ගැනීමට අපි නිරන්තරයෙන් කටයුතු කළ යුතුයි. වූහාන්වල මෙම තත්ත්වය පිළිබඳ දැනගත් මොහොතේ සිටම මම ඒ පිළිබඳ විමසිලිමත් වුණා. කොළඹ වරාය මගී පර්යන්තය වෙත පැමිණෙන සංචාරක මගී නෞකාවන්ගෙන් මෙරටට පැමිණෙන සංචාරකයින්ගේ සෞඛ්‍ය පහසුකම් නංවාලීමේ විශේෂ වැඩපිළිවෙලක් දියත් කිරීමට කටයුතු කළේ ඒ අරමුණෙන්. මට මතක විදියට ඒ 2020.02.05 වැනි දවසක. මේ විශේෂ වැඩසටහන තුළින් සංචාරකයින්, නිසි ලෙසින් වෛද්‍ය පරීක්ෂාවට ලක් කරනු ලබන අතර කිසිඳු අයුරකින් සංචාරකයින් අපහසුතාවයට පත් නොකර වෛද්‍ය පරීක්ෂණ වෙත යොමු කරා. ආසාධිත හෝ ආසාධිත බවට සැක කටයුතු වූ රෝගීන් පරීක්ෂණ කිරීමට හා හුදෙකලා කර නිසි ප්‍රතිකාර ලබා දීමට වගේම සෞඛ්‍යාරක්ෂිතව හා ප්‍රවේසම් සහගත ලෙස නිර්දේශිත රෝහල් කරා යැමට අවශ්‍ය සියලු පහසුකම් සම්පාදනයට ද මේ යටතේ විශේෂ අවධානය යොමු කළා.

# වූ අපේ ආයතනය හදවත බවට පත් කිරීම අරමුණයි

## රත්නායක - සභාපති ශ්‍රී ලංකා වරාය අධිකාරිය

කොළඹ වරාය පරිශ්‍රයේ මගී පර්යන්තය තුළ විශේෂිත කුටියක් ඉදිකර මෙම කටයුතු සිදුකළා. සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිරෝධායන වැඩසටහන් අධ්‍යක්ෂ වෛද්‍ය එස්.එම්. ආනල්ඩ් මහතාගේ සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ රෝෂාන් සම්පත් මහතාගේ පූර්ණ දායකත්වයෙන් මෙම නිරෝධයන වැඩසටහන සාර්ථකව පැවැත් වූවා. ඒ වගේම කොළඹ වරායෙන් පැමිණෙන සියලු මගී නැව් දැඩි පරීක්ෂාවට ලක් කළා.

**ඔබතුමා කොරෝනා වසංගතය පවතින මොහොතේදීත් වරාය සක්‍රීයව පවත්වාගෙන යාමට විශාල පරිශ්‍රමයක් දැරුවා. අපි එතැනින් පටන් ගනිමු...?**

ඔව්. කොරෝනා වසංගත තත්ත්වය අපි මීට පෙර නොවිඳි දෙයක් නිසා මේ පිළිබඳ කිසිවෙකුටවත් අවබෝධයක් තිබුණේ නැහැ. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉහළ නිළධාරින් සමගින් අපි මේ පිළිබඳ සාකච්ඡා කළා. කෙසේ වෙතත් සූදානම් ශරීරය කෝකටත් හොඳයි කියන්නා වාගේ අපි මෙහි පරතෙරක් දැන නොසිටියාට අපි මේ තත්වයට මුහුණ දෙන්නේ කෙසේද කියන කාරණාව එක්ක ඒකරාශි වුණා. මෙවැනි වසංගතයකින් වරාය වසාදමන්න සිදු වුණොත් මොන වාගේ තත්වයක්ද ඇතිවෙන්නෙ කියන කාරණාව එක්ක මෙය මැඩලීමට ඉතා සැළසුම් සහගත ලෙස කටයුතු කිරීමේ අවශ්‍යතාවය අපට දැනුණා. පැය 24 ම රාජකාරියේ යෙදෙන ආයතනයක් ලෙසින් වරාය කොරෝනා වලින් මුක්ත කලාපයක් කර ගැනීමට නම් කෙසේ කටයුතු කළ යුතුද යන්න පිළිබඳ අපි කඩිනමින් වාගේ ම ගැඹුරින් සොයා බැලුවා. මෙය දේශීය වශයෙන්, කලාපීය වශයෙන්, ජාත්‍යන්තර වශයෙන් කොහොමද අපිට බලපාන්නේ කියන කාරණාවත් අපි සැලකිල්ලට ගත්තා. වරායට මෙම වසංගතයෙන් ගැටුම්කාරී තත්වයක් ඇතිවෙනවා නම් එය ප්‍රබල ලෙසින්ම බලපාන්නේ කිනම් අංශ වලට ද යන්න පිළිබඳ අපේ සැලකිල්ල යොමු වුණා. උදාහරණයක් හැටියට ගතහොත් අපේ නියමු මධ්‍යස්ථානය. අපිට සිටින්නේ ඉතා සුළු නියමුවන් පිරිසක්. නියමුවෙක් නිසි පුහුණු ක්‍රමවේදයන් ඔස්සේ පුහුණු කර ගැනීමට වසර පහක පමණ කාලයක් ගතවෙනවා. එවැනි ශිල්පීන් ආරක්‍ෂා කර ගන්නේ කෙසේද යන්න පිළිබඳ අපට සිතන්නට වුණා. අවසානයේ අපිට නිසි විසඳුම් ඒ සඳහා ලබා දෙන්නට හැකි වුණා. අපි එම නියමුවන් කොටස් හතරකට බෙදා සේවාවට යොදා ගැනීමට සැලසුම් යෙදුවා. එක කොටසක් රාජකාරියේ යෙදෙන විට තවත් කොටසක් නිවෙස්වල ගත කිරීමට අවකාශය සැලසුවා. මෙම තත්ත්වය සමස්ත වරාය පරිශ්‍රය තුළම ක්‍රියාත්මක කිරීමට ක්‍රමවේද සකස් කළා.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියාමනයන්ට අනුකූලව අපි මාර්ගෝපදේශන සංග්‍රහයක් සම්පාදනය කළා. එම මාර්ගෝපදේශනය ප්‍රකාරව කටයුතු කිරීමට අපි රාජකාරියේ යෙදෙන සේවක කොටස් දැනුවත් කළා. 100% ක් ම සෞඛ්‍ය තත්වය ආරක්‍ෂා කරමින් අපගේ රාජකාරි කරගෙන යාමට අවශ්‍ය පසුබිම අපි සකස් කළා. සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිළධාරින්, වෛද්‍යවරුන් ඇතුළු කාර්ය මණ්ඩලය සේවක මහතුන් සමග නිරන්තරයෙන් සාකච්ඡා කරමින් ගැටළු පැන නැගෙන ආකාරයට ඒවාට විසඳුම් ලබා දෙමින් අපි ජයග්‍රහණය කරා ළඟාවීමට හැකිවුණා. කියන්න සංතෝසයි වරාය පරිශ්‍රයේ අපේ කිසිදු සේවකයෙකුට කොරෝනා වැළඳුනේ නෑ. එයයි අපට තිබෙන ලොකුම ශක්තිය. අපේ රාජකාරි මට්ටමෙන් අපෙන් කිසිවෙකුට ඒ රෝගය වැළඳීමේ අවස්ථාවක් තිබුණෙත් නැහැ. ඒ වගේම මෙහෙයුම් කටයුතු වලදී කිසිම නැවකට අපෙන් කිසිදු ප්‍රමාදයක් සිදු නොවී මෙහෙයුම් කටයුතු සිදු කිරීමටත් අපිට හැකි වුණා.

මේ සඳහා දායකත්වය ලබා දුන් සියලුම සේවක මහත්ම මහත්මීන්ට මාගේ ගෞරවණීය ස්තුතිය පුද කරන්න මම කැමතියි.

**සමුද්‍රීය කලාපයේ තරගකාරි වරායයන් අතර ශ්‍රී ලංකා වරාය අධිකාරිය ලෙසින් කටයුතු කළ ආකාරය පිළිබඳ කොහොමද ඔබතුමාගේ තක්සේරුව...?**

මේ පිළිබඳ නම් අපිට එතරම් සෑහීමකට පත්වෙන්න බැහැ. මේ කලාපයේ සිටින හොඳම ප්‍රති නැව්ගත බහලු මෙහෙයවන වරාය හැටියට අපේ කොළඹ වරාය හඳුන්වන්න පුලුවන්. නමුත් අපේ වරායේ භූගෝලීය පසුබිමට, අපේ තිබෙන හැකියාවට, අපේ සේවක පිරිසේ දක්‍ෂතාවලට සාපේක්‍ෂව අපි සිටිනා ස්ථානය බොහොම මදි කියා මම විශ්වාස කරනවා. මීට වඩා දෙතුන් ගුණයක් ඉදිරියන් අපි සිටිය යුතුය කියන ස්ථාවරයක මම සිටිනවා.

දකුණු ආසියානු කලාපයේ පමණක් නොවෙයි සමස්ත ආසියාකරයේ ම තිබෙන හොඳම වරාය හැටියට පත්වීමට අපිට ඕනෑතරම් අවකාශය තිබෙනවා. ඒ සඳහා ''එහෙන් - මෙහෙන්'' කටයුතු කරන්නේ නැතිව විධිමත් ප්‍රමිතිගත සැලසුමක් ඔස්සේ ඉලක්ක කරා යොමුවීමයි මෙහිදී වැදගත් වන්නේ.

**ඔබතුමා කොවිඩ්-19 ජාතික කාර්ය සාධක බලකායේ සාමාජිකයෙක්. එම ක්‍රියාකාරී කමිටුවේ තීන්දු තීරණ තුළින් අපේ රට සෙසු රටවලට සාපේක්‍ෂව ජන ජීවිතය සාමාන්‍ය තත්වයට පත්කර ගැනීමට හැකිවුණා. ඒ පිළිබඳවත් අපි කතා කරමු...?**


ඔව්. ඇත්තටම එය අපගේ ජනාධිපතිතුමාගේ දැක්ම තුළින් අපට ලැබුණු දායාදයක් හැටියටයි මම සලකන්නේ. මෙම වසංගත තත්වය චීනයේ වූහාන් නගරයේ ඇතිවෙන කාල වකවානුවේ ම එතුමා මේ පිළිබඳව දූරදර්ශීව කටයුතු කළා. ඊට පසු විවිධ ක්ෂේත්‍රයන්ගේ එකතුවෙන් කාර්ය සාධක බලකායක් පත් කළා. රෝගී තත්වය දරුණු වීමත් සමගම මෙහි පාලන කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශයට සහ ආරක්‍ෂක අංශ යටතේ පවත්වාගෙන යාමට භාර දුන්නා. සෞඛ්‍ය අමාත්‍යාංශයේ සියලු වෛද්‍යවරුන් ඒකරාශි කර, ක්ෂේත්‍රයේ වැඩ කළ හැකි දක්‍ෂයින් සමගින් කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කර ඒ සඳහා අවශ්‍ය සියලු පහසුකම්, සංවිධාන ශක්තිය සලසා දුන්නා.

එතුමා සතු වූ අත්දැකීම් වල පරිචය වගේම උපායමාර්ගික ශක්‍යතාව මේ කටයුත්තේ සාර්ථකත්වයට බෙහෙවින් ඉවහල් වුණා. හමුදාවේ සියලු අංශ හා සෞඛ්‍ය අමාත්‍යාංශයේ දායකත්වය ඔස්සේ මේ කටයුතු මනාව විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ කටයුතු කරමින්, ලෝකයේ මේ සඳහා කෙසේ කටයුතු කරන්නේද ඒ සඳහා කවරාකරයේ ක්‍රියාමාර්ග ගන්නේද යන්න පිළිබඳවත් නිරන්තර යාවත්කාලීන වෙමින් ඉතාම හොඳින් මේ කටයුතු කළමණාකරණය කළා. එතුළින් ඔබ ඔය කියන ආකාරයට ජන ජීවිතය සාමාන්‍ය තත්ත්වයට පත්කර ගැනීමට අපිට හැකියාව ලැබුණා.

**මේ වනවිට වරායේ විශාල පිරිසක් නිවෙස්වල සිට තම රාජකාරියේ නියැලෙනවා. ඔවිනුට සුපුරුදු පරිදි රාජකාරියට වාර්තා කිරීමට කෙතරම් කාලයක් ගතවේද..?**

අද වනවිට මේ තත්ත්වය සාමාන්‍ය

28 පිටුවට



**පුළුල් පරාසයක පැතිරුණු දැනුම් සමුදාය ආයතන රැසක මුල් පුටු හොබවන්නට ඔහුට ශක්තිය ගෙනාවේය. වෘත්තීමය නෛතික දැනුමෙන් ද සන්නද්ධව ජාතියේ ප්‍රමුඛ ආයතනයේ කළමණාකාර අධ්‍යක්‍ෂ ධූරය මෙන්ම උපසභාපති ධූරය හොබවන්නට ද එතුමා භාග්‍යවන්ත විය. මේ ඩබ්.එස්.වීරමන් නම් වූ ඇසූ පිරූ දැනුමෙන් සපිරි නීතිවේදියා සමග තිර්ථ කළ සංවාදයකි.**



# “වරායේ සිටින්නේ ආයතනයට ආදරය කරන සේවක පිරිසක්”

## ඩබ්.එස්. වීරමන් - උපසභාපති/කළමණාකාර අධ්‍යක්‍ෂ ශ්‍රී ලංකා වරාය අධිකාරිය

**පිළිසඳර - උපුල් ගුරුගේ**

**ජාතියේ මර්මස්ථානයක කළමණාකාර අධ්‍යක්‍ෂධුරය සහ උපසභාපති ධුරයේ කටයුතු කිරීම අභියෝගාත්මකයි. කෙසේ ද ඔබතුමාට මෙය දැනෙන්නේ ?**

මම මුලින්ම පත්වෙන්නේ වරාය අධිකාරියේ උපසභාපති ධූරයට. එය වගකීම් රැසක් පිරුණු ධූරයක්. එහි කටයුතු කරන අතරවාරයේ කෝවිඩ් - මර්ධන ක්‍රියාවලියටත් උපරිමයෙන් කැපවෙන්නට සිදුවුණා. වරාය අධිකාරියේ මෙහෙයුම් ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වා ගනිමින් ගරු ඇමතිතුමාගේත් සභාපතිතුමාගේත් උපදෙස් පරිදි කටයුතු කරමින් වරායේ සෞඛ්‍ය රාමුව නිසි පරිදි පවත්වා ගැනීමට එහිදි අපිට කණ්ඩායමක් ලෙස හැකි වුණා.
ඔය අතරවාරයේ වරාය අධිකාරියේ හිටපු කළමණාකාර අධ්‍යක්‍ෂ කපිතාන් අතුල හේවාවිතාරණ මහතා සේවයෙන් සමුගත්තා. ඉන් ඇති වූ පුරප්පාඩුව සපුරාගන්නට කළමණාකර අධ්‍යක්‍ෂ ධුරයේත් කටයුතු කිරීමට සිදු වුණා.
මීට පෙර ශ්‍රී ලංකා නැව් සංස්ථාවේ සභාපති ලෙසින් කටයුතු කිරීමත් මේ සඳහා ඉවහල් වන්නට ඇති කියා මං හිතනවා. මෙම ධුර දෙකෙහිම උපරිම කැපවීමෙන් කටයුතු කරමින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට මාගේ උපරිම දායකත්වය දීමට මං බලාපොරොත්තු වෙනවා.

**ඕනෑම ආයතනයක මානව සම්පත ඒ ආයතනයට සම්පතක්. වරායේ මානව සම්පත පිළිබඳව කෙසේද ඔබට හැගෙන්නේ ?**

සැබවින්ම පසුගිය කාලයේ වරායේ සේවක මහත්ම මහත්මීන්ගේ කැපවීම මම අත්දුටුවා. ඔවුන් කොරෝනා සමයේ සේවයට කැපවුණේ තමන්ගේ ජීවිතය පවා දෙවැනි කරමින්. එපමණ කැපවීමෙන් ඔවුන් කටයුතු කළා. ඒ සියලු දෙනා වෙත මාගේ ප්‍රණාමය හිමිවිය යුතුයි. එවන් සේවක පිරිසක් ආයතනයකට සම්පතක්. කළමණාකාර අධ්‍යක්‍ෂ ලෙසින් මම වරායේ බොහෝ පරිශ්‍රයන්ගේ සේවක පිරිස් හමුවුණා. ඔවුන් එක හඬින් පවසා සිටියේ ''අපි ආයතනයට ආදරෙයි. ආයතනයේ දියුණුව වෙනුවෙන් දීමනා නැතත් අපි වැඩ කරනවා'' කියා. එවැනි සේවක පිරිසක් ආයතනයකට ශක්තියක් කියා මම හිතනවා. නිසි ක්‍රමවේදයක් ඔස්සේ වරාය මහපොළ සමුද්‍රීය විද්‍යායතනය හරහා වරාය මානව සම්පත නංවාලන්නට නවමු සැලසුම් ක්‍රියාත්මක කිරීමට කළමණාකාරීත්වය ලෙසින් අපි බලාපොරොත්තු වෙනවා.

**නැගෙනහිර පර්යන්තය අද දවසේ රටේ ප්‍රධාන පුවත් මවන භූමිකාව බවට පත්වෙලා. නැගෙනහිර පර්යන්තයේ හෙට දවස පිළිබඳ ඔබතුමාගේ තක්සේරුව කෙසේද ?**

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්‍ෂ මැතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම තුළ සඳහන් වෙනවා. නැගෙනහිර පර්යන්තයේ මෙහෙයුම් අප විසින්ම සිදු කරන බවට. ඒ වාගේ ම අපේ රටට අවාසි සහගත කොන්දේසි සහිත ගිවිසුම් වලින් රට ජාතියේ දේපළ සුරක්ෂිත කිරීමටත් කටයුතු සලසන බැව් එහි සඳහන් වෙනවා.
පසුගියදා කොළඹ වරායට ගෙන ආවේ ජයබහලු අදියර V සඳහා යෝජිත ග්‍රැන්ට් දොඹකර. නමුත් පසුගි ය රජය ජයබහලු අදියර V ක් පිළිබඳව කතා කළාට එය ගොඩ නැංවූනේ නැහැ. නමුත් ඊට අදාල දොඹකර ගෙන්වූවා. එය කොතරම් හාස්‍යජනක කටයුත්තක් ද? ඒ වගේම පසුගිය රජය සමයේ නැගෙනහිර පර්යන්තය සම්බන්ධ සහයෝගීතා ගිවිසුම අත්සන් කර ඇත්තේත් සේවකයින් නොමඟ යවලා.
නැගෙනහිර පර්යන්තය වරාය අධිකාරිය විසින් මෙහෙයුම් සිදු කරන ස්ථාවරයක අපි සිටිනවා. එය අවිවාදිතයි.


**කොරෝනා පසුබිම තුළ ප්‍රාදේශීය වරායයන්ගේ ක්‍රියාකාරීත්වය බොහෝ අඩපණ වුණා. මෙම වරායන් සංවර්ධනයට කරනු ලබන ඉදිරි සංවර්ධන කටයුතු පිළිබඳව කතා කරමු.**

ඔව්, අපගේ ප්‍රාදේශිය වරායයන් අතරින් ගාල්ල වරාය සැලකිල්ලට ගැනීමේ දී එහි ප්‍රධාන ආදායම් ඉපැයීම් සිදුවන්නේ සිමෙන්ති කර්මාන්තය ආශ්‍රිත ක්‍රියාදාමය තුළින්. නමුත් ඉන් විශාල ආදායමක් ලැබෙන්නේ නැහැ.
නමුත් අපි ගාලු වරායේ භූගෝලීය පිහිටීම හා සංස්කෘතික පිහිටීම පදනම් කරගෙන ගාල්ල වරායේ රුවල් යාත්‍රා කලාපයක් ස්ථාපිත කිරීමට අදාල යෝජනා කැඳවා තිබෙනවා. විශේෂයෙන්ම ගාලු කොටුව හා බැඳුණු සංචාරක ප්‍රවර්ධන වරායක් ලෙස භාවිත කිරීමට ඒතුළින් අවකාශය සැලසේවි.
ත්‍රි'මලය වරායෙන් ආදායම් ලැබීම සඳහා වරාය සතු ඉඩම් අක්කර 5000 කට ආසන්න ප්‍රමාණයක් විවිධ සංවර්ධන හා ආයෝජන ක්‍රියාමාර්ග සඳහා යොමු කිරීමට බලාපොරොත්තු වෙනවා.
ඔළුවිල් වරාය සඳහා වැයකළ මුදල් පියවා ගනිමින් ප්‍රදේශයේ ජන ජීවිතය යථාවත් කිරීමට සහාය සැලසීමට වරාය තුළින් අපේක්‍ෂා කරනවා. උතුරු වරායයන්ගේ සංවර්ධන කටයුතු නංවාලීමට කටයුතු කිරීමට නියමිතයි. දැනටමත් කන්කසන්තුරේ සහ තූත්තුකුඩි අතර මගී ප්‍රවාහන සේවාවක් ආරම්භ කිරීමට සැලසුම් කරමින් තිබනවා.

**හෙට දවසේ වරායේ සේවක මහත්ම මහත්මීන්ගේ රැකියාවන් අවිනිශ්චිත බවට විවිධ කතා පැතිරෙනවා. කෙසේද එහි සත්‍යතාවය?**

කොවිඩ් කතන්දරය සමග මුළු ලෝකය පුරා නැව් ගමනාගමනය අඩු වුණා. ඒ වාගේම බොහෝ වරායයන්ගේ මෙහෙයුම් කටයුතු අඩාල වුණා. නමුත් අපි කොළඹ වරාය ලෙසින් අඛණ්ඩව අපේ මෙහෙයුම් කටයුතු සිදු කළා. ඒ තුළ කොළඹ වරාය පිළිබඳ විශ්වාසය තව වැඩි වුණා. නැව් සමාගම් තුළ අපි ගැන තිබූ විශ්වාසය නිසා අපේ ව්‍යාපාර කටයුතු පිළිබඳ බිය වීමට කාරණාවක් නැහැ.

වරාය හා නාවික කටයුතු අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමා. අපේ සභාපතිතුමා ඇතුළු කළමණාකාරීත්වයේ මැදිහත්වීමෙන් නිසි තීන්දු තීරණ ගනිමින් නිරතුරුවම පෙරට යනවා. ඒ නිසා සේවක මහත්ම මහත්මීන්ට අනවශ්‍ය බියක් ඇතිකර ගත යුතු නැහැ කියා මම අවධාරණයෙන් කියනවා. ඒ වගේම මං සියලු සේවක මහත්ම මහත්මීන්ට ආදරයෙන් කියා සිටිනවා ඔබේ උපරිම ශක්‍යතාවයෙන් සේවයේ යෙදෙන්න. CICT, SAGT සමග තරඟකාරීව කටයුතු කිරීමට උපරිමයෙන් කැප වෙන්න කියා.



# වරාය පරිශ්‍රයේ කොරෝනා මර්ධනයට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ සෑහීමකට පත්විය හැකියි

## උපාලි ද සොයිසා - අතිරේක කළමණාකාර අධ්‍යක්ෂ

> සේවක මහත්ම මහත්මීන් සඳහා ප්‍රවාහන පහසුකම් පුළුල් කරමින් සුභ සාධක බස්රථ සියලු ප්‍රධාන මාර්ගයන්හි ධාවනය කිරීමට කටයුතු සලසා තිබෙනවා. ඒ වගේම ඇඳිරි නීති කාල සිමාව තුළදී තම මෝටර් රථ වලට අවශ්‍ය ඉන්ධන ගෙවීම් පදනම මත ලබාදීමට කටයුතු කළා.

පිළිසඳර - උපුල් ගුරුගේ

කොවිඩ් -19 දරුණු ගෝලීය වසංගතය අප මාතෘ භූමිය ද ආක්‍රමණය කළ මොහොතේ එයට මුහුණදීම සඳහා පිහිටවනු ලැබූ කොවිඩ් -19 වසංගත පාලන කාර්ය සාධන බලකායට සමගාමීව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පිහිටවනු ලැබූ කොවිඩ් මර්ධන කමිටුවේ සභාපතිවරයා ඔහුය. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අතිරේක කළමණාකාර අධ්‍යක්ෂ ධූරය ද හොබවන උපාලි ද සොයිසා නම් වූ වරාය හා සමුද්‍රීය ක්ෂේත්‍රයේ අත්දැකීම් සපිරි කෘතහස්ත නිළධාරියා සමගින් තීර්ථ කළ සංලාපයකි මේ..

**ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කොරෝනා වසංගතය මැඩලීම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ වරාය කොවිඩ් මර්ධන කමිටුවේ සභාපති ලෙසින් ඔබ සෑහීමකට පත් වෙනවාද...?**

ඔව්. සැබවින්ම ඒ පිළිබඳ සෑහීමකට පත්වීමට පිළිවන්. විෂයභාර අමාත්‍යතුමා, අමාත්‍ය ලේකම්තුමා සේවකයන් අතරට ගියා. ඔවුන්ගේ හඬට සවන් දුන්නා.

ඒ හා සමගාමීව කොවිඩ් -19 වසංගත පාලන කාර්ය සාධක බලකායේ සාමාජිකයෙක් ලෙස කටයුතු කරන අපේ සභාපතිතුමා කොවිඩ් වෛරසය වූහාන් වල සිට පැතුරුණු මොහොතේ සිටම ඒ පිළිබඳ සෑම අංශයකින්ම දැනුවත් වෙමින් අපට සියලු උපදෙස් ලබා දුන්නා. විශේෂයෙන්ම ඇඳිරිනීතිය ක්‍රියාත්මක වීමත් සමග ම ශ්‍රී ලංකා රේගුව, වරාය සෞඛ්‍ය කාර්යාලය, ආගමන විගමන කාර්යාලය ඇතුළු සියලු පාර්ශවයන් සමග සාකච්ඡා කිරීමෙන් පසු වරාය කොරෝනා වෛරසයෙන් ආරක්ෂා කර ගැනීමට විශේෂ වැඩ පිළිවෙලක් දියත් කළා.

**එම විශේෂ වැඩපිළිවෙල පිලිබඳ කතා කරමු...?**

මානුෂීය මෙහෙයුමකට ජීවය දුන් ගරු සභාපතිතුමාගේ ජීවිත අත්දැකීම් සමගින් වරාය පරිශ්‍රය තුළ කොරෝනා මර්ධනය ප්‍රශස්ත ලෙසින් කිරීමට එතුමා හට අවශ්‍ය වුණා. ඒ සඳහා එතුමා අපව නිසි ලෙසින් මෙහෙයවමින් මේ සම්බන්ධයෙන් ක්‍රියා කල යුතු ආකාරය පිළිබඳ පුළුල් දැනුමක් අපවෙත ලබා දුන්නා. ප්‍රථමයෙන්ම අපි කොවිඩ් -19 මෙහෙයුම් මැදිරියක් ආරම්භ කළා. එහි සම්බන්ධීකාරක ලෙසින් සහකාර කළමණාකරු (පරිපාලන) ඒ.ඩී.එම්.කේ. රහුමාන් මහතා පත්කරනු ලැබුවා. සියලු නව මාධ්‍යයන් ඔස්සේ සම්ප්‍රේෂණය කර ගන්නා තොරතුරු මත පදනම් වෙමින්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදෙස් අනුව සියලු කටයුතු ක්‍රියාවට නැංවුවා.

**කෙසේද ඒ සඳහා සේවක මහත්ම මහත්මීන් දැනුවත් කළේ...?**

පළමුව අප ඒ පිළිබඳ සේවක මහත්ම මහත්මීන් සඳහා පුළුල් ලෙසින් දැනුවත් කිරීම් ක්‍රියාවට නැංවුවා. මහපොළ අභ්‍යාස ආයතනය වෙත සියලු කොට්ඨාශ නියෝජනය කරමින් සේවක මහත්ම මහත්මීන් ඒකරාශි කළේ ඒ වෙනුවෙනුයි. ඉන්පසු කාර්යාල පරිශ්‍රයන්හි සහ වැඩ බිම් වල සේවක මහත්ම මහත්මීන්ගේ සෞඛ්‍යාරක්ෂාව සඳහා වු මූලික අඩිතාලම සකස් කිරීමට පියවර ගත්තා. ඒ යටතේ මුලික විෂබීජ හරණයට අදාල වූ උපකරණ හා ආරක්ෂිත දියර මෙන්ම සියලු සේවක ප්‍රජාව සඳහා මුඛ ආවරණ ලබාදීමට පියවර ගත්තා. ඒ වගේම මුඛ ආවරණ පැළඳීම, නිසි ලෙස අත්සෝදා පිරිසිදු කිරීමේ වැදගත්කම පිළිබඳ නිරන්තරයෙන් දැනුවත් කිරීම් සිදුකළා. සැපයුම් කොට්ඨාශයේ පතිරාජ මහතා, වෙනුර මහතා ඇතුළු කාර්ය මණ්ඩලය ප්‍රධාන ඉංජිනේරු (සිවිල්) සමන් මහතා ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලය, සෞඛ්‍ය පරීක්ෂක රණසිංහ මහතා ඇතුළු පිරිස නිරන්තරයෙන් ඒ සඳහා ඇප කැප වී කටයුතු කළා. සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශයේ දායකත්වයෙන් හඬ පට නිෂ්පාදනය කර ශබ්ද විකාශන යන්ත්‍ර මගින් වරාය පරිශ්‍රය පුරා ප්‍රචාරය කරනු ලැබුවා.

**විෂබීජහරණ කුටි වරාය පරිශ්‍රයේ ඉදි කිරීමත් එහිම දිගුවක්....?**

ඔව්. විෂබීජහරණ කුටි සෑම පිවිසුම් දොරටුවකම සෑම වැඩබිමකම ඉදිකිරීමට කටයුතු කළා. මෙහිදී ප්‍රධාන ඉංජිනේරු (විදුලි) ප්‍රධාන ඉංජිනේරු (යාන්ත්‍රික) ඇතුළු සමස්ත කාර්ය මණ්ඩල ස්වකීය දායකත්වය නොපිරිහෙලා ඉටුකළ බැව් මං සිහිපත් කරන්නේ බොහොම සතුටින්. ඒ වගේම සෞඛ්‍යාරක්ෂිතව අත් සෝදා ගැනීමට අවශ්‍ය පහසුකම් වරාය පුරාම ස්ථාපිත කරන්නටත් කටයුතු සම්පාදනය කළා. මෙහිදී වෛද්‍ය මධ්‍යස්ථානයේ කාර්ය භාරයත් නොකියාම බැහැ. නි. ප්‍රධාන වෛද්‍ය නිලධාරිනිය ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලය විශිෂ්ඨ දායකත්වයක් ලබාදෙමින් සිටිනවා. රෝගීන්ගේ තත්ත්වය පරීක්ෂා කර බලා අසාධ්‍ය රෝගීන් ජාතික රෝහල් පරිශ්‍රය කරා යොමු කිරීමටත් දින පහකට වරක් සේවක මහත්ම මහත්මීන් පරීක්ෂාවට ලක් කිරීම තුළින් කොරෝනා වසංගත රෝග තත්වය සමහන් කිරීමට ගතහැකි සියලු ක්‍රියා මාර්ග අද දවසේදීත් ක්‍රියාත්මක කරනු ලබනවා.

**සෞඛ්‍යාරක්ෂිත බව නංවාලීමේ අරමුණෙන් සේවක සුබසාධන පහසුකම් නංවාලිමට පියවර රැසක් ගෙන තිබෙනවා...?**

ඔව්. මෙවැනි අනාරක්ෂිත වටපිටාවක් තුළ සේවක පිරිසට ආහාර පාන ලබා ගැනීමට තිබෙන අපහසුව පිළිබඳ අපි හොඳින් අවබෝධ කර ගත්තා. සේවක මහත්ම මහත්මීන්ට කිසිදු අපහසුතාවක් නොවන ලෙසට උදේ, දිවා, රාත්‍රී ආහාර සහ තේ පැන් රසකැවිලි ලබාදීමට කටයුතු කළා. මෙහිදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මානුෂීය මුහුණුවර තව දුරටත් පුළුල් කරමින් රේගු නිවාරණ අංශය, ශ්‍රී ලංකා පොලීසිය, ආගමන විගමන දෙපාර්තමේන්තුව ඇතුළු ශ්‍රී ලංකා වරාය පරිශ්‍රයේ ආයතනයන්හි සේවක මණ්ඩල වෙතත් මෙම ආහාරපාන ලබාදීම සිදු කරනු ලැබුවා.

සේවක මහත්ම මහත්මීන් සඳහා ප්‍රවාහන පහසුකම් පුළුල් කරමින් සුබ සාධක බස්රථ සියලු ප්‍රධාන මාර්ගයන්හි ධාවනය කිරීමට කටයුතු සලසා තිබෙනවා. ඒ වගේම ඇඳිරි නීති කාල සිමාව තුළදී තම මෝටර් රථ වලට අවශ්‍ය ඉන්ධන ගෙවීම් පදනම මත ලබාදීමට කටයුතු කළා. ඒ අතරතුරේදීම සේවක අවශ්‍යතා පරිදි අත්‍යවශය භාණ්ඩ ආයතනිය පරිශ්‍රය තුළදීම ලබා ගැනිමේ පහසුකම් සලසාදීමට සතොස, කාගිල්ස් ආයතන සමග සම්බන්ධීකරණය කරමින් එකී අවශ්‍යතාවන් සපුරාදීමටත් අපි කටයුතු කළා. මෙම කාල වකවානුව තුළ සේවක ආතතිය දුරලීමටත් අපි කටයුතු කළා.

18 පිටුවට

**සාකච්ඡා සටහන - උපුල් ගුරුගේ**

කොවිඩ් - 19 ඔබටත් මටත් බොහෝ පාඩම් ඉගැන්වී ය. අපි ට අපි පිළිබඳ නැවත සිතන්නට අවකාශය සැලසී ය. වල් වැදී තිබූ හර පද්ධතීන්, දේශිය සෞඛ්‍ය ක්‍රමෝපායන, ආචාර සමාචර විධි ක්‍රම පිළිබඳ ගෞරවණීය හැඟීමෙන් යුතු ව කටයුතු කිරීමේ අවකාශයක් නිර්මාණය කරවී ය. නිවැරදිව අත සෝදා ගැනීමේ සිට සියළු සෞඛ්‍ය පුරුදු පිළිබඳ පුංචි සන්දියේ අපි උගෙනගත් දේ ශික්ෂණයකින් යුතු ව ඉටු කිරීමට කාල වේලාව පැමිණ ඇති සේ ය. මෙවන් තත්ත්වයක් තුළ වරායේ හෙට දවස කෙසේ සකස් විය යුතු ද, ඒ සඳහා අප විසින් තබා ඇති පියවර කොතරම් නිවැරදි ද යන්න පිළිබඳ දැන ගැනීමේ අදිටනින්, සමුද්‍රීය ක්ෂේත්‍රයේ ඇසූ පිරූ අත්දැකීම් සපිරි, අලෙවි හා ප්‍රවර්ධන ක්ෂේත්‍රයේ හසල දැනුමැති, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධක්ෂ (සේවා සැපැයුම්) උපුල් ජයතිස්ස මහතා සමඟ කළ සංලාපයකි.



# ජාත්‍යන්තර මට්ටමේ විශිෂ්ට සේවාවක් සැපයීමට අත්වැල් බැඳගනිමු

## උපුල් ජයතිස්ස
### අධ්‍යක්ෂ (සේවා සැපැයුම්)

**1 කොවිඩ් - 19 බොහෝ දේවල් වෙනස් කළා. විද්‍යුත් ගෙවීම් (e-payment), විද්‍යුත් ලිපිගොනු (e-documentation), විද්‍යුත් ප්‍රකාශන (e-manifest) සියල්ල මීට බොහෝ කාලයකට පෙර සැලසුම් කළත් අපි ට ඒ දේවල් කරන්නට හැකි වූයේ නැහැ. නමුත් මේ මාරාන්තික වසංගත වෛරසය ඒ සියල්ල ඉක්මන් කර වෙනස් කළා.**

ඔව් මං හිතන්නේ කොරෝනා අපිට බොහෝ දේ හිතන්න අවකාශය සලසා දුන්නා. හිතන්න ට බොහෝ දේ ඉතිරි කළා. අපේ ආචාර සමාචාර විධි වල සිට සරල ව ජීවත් වීමේ කලාව දක්වා සෑම දෙයක් ම වෙනස් ම තැනකට රැගෙන ආවා. ඉහත සඳහන් කළ විද්‍යුත් ගෙවීම් ක්‍රම ආදිය පිළිබඳ ක්‍රියාත්මක වීමට සැලසුම් කළේ මීට බොහෝ කලකට පෙරයි. නමුත් විවිධ හේතූන් මත ඒ තත්ත්වය ක්‍රියාත්මක වූයේ නැහැ. නමුත් මේ වසංගත රෝග තත්ත්වය සමගින් දුරස්ථභාවය පවත්වා ගැනීම, නිවසේ සිට රාජකාරි කටයුතු සිදු කිරීම ආදී කරුණු මත තාක්ෂණික ප්‍රවේශයක් ඔස්සේ සියළු දේ කිරීමට විශේෂයෙන් පරිගණක තාක්ෂණික ක්‍රියාකාරකම් ඔස්සේ අපගේ ජීවිතයේ බොහෝ කටයුතු පවත්වා ගැනීමට සිදුවුණා. ඒ තුළින් ආයතනීය ක්‍රියාකාරීත්වයට විද්‍යුත් තාක්ෂණය යොදා ගැනීමේ මැලිකමක් දැක්වූ අය පවා මේ කාල වකවානුවේ විද්‍යුත් තාක්ෂණික ක්‍රියාමාර්ග වලට යොමු වීම සාධනීය ප්‍රවනතාවයක් හැටියට මම සඳහන් කරන්න කැමතියි.

**2 1999 වසරට පෙර වරාය අධිකාරියේ පැවැති බහලු මෙහෙයුම් ස්වභාවය වැනි තත්ත්වයකට අපිට නැවත ළඟා වීමට හැකි වේවි ද?**

1999 වසරට පෙර වරාය අධිකාරියේ බහලු මෙහෙයුම් ක්ෂේත්‍රයේ පැවතියේ ඒකාධිකාරි තත්ත්වයක්. බහලු මෙහෙයුම් සිදු කළේ වරාය අධිකාරිය පමණයි. ඒ සඳහා රැජින පර්යන්තය (QCT) සහ ජය බහලු පර්යන්තය (JCT) හොඳට ම ප්‍රමාණවත් වුණා. පසුව වරාය අධිකාරිය පෞද්ගලික ආයෝජකයන් ට අවස්ථාව සැලසුවා. එහි ප්‍රතිඵලයක් ලෙසින් දේශීය හා විදේශිය ආයෝජකයන් එකතු වුණා. SAGT සමාගම ඇමරිකානු ඩොලර් මිලියන 240ක ආයෝජනයක් සමග බහලු පර්යන්ත මෙහෙයුම්ට එකතු වුණා. ගොඩනංවා, මෙහෙයවීම් සිදු කර, භාර දීමේ ක්‍රමවේදය (Built, Operation, Transfer - BOT) මත, රජයේ හා පුද්ගලික අංශයේ දායකත්වයෙන් (Public - Private Partnership - PPP) SAGT පර්යන්තය කොළඹ වරායේ බහලු මෙහෙයුමට එකතු වුණා. ඒ වරාය අධිකාරියේ 15%ක දායකත්වක් හා SAGT 85%ක් වශයෙන්. SAGT ආගමනයත් සමග වරාය අධිකාරියේ බහලු මෙහෙයුමේ පැවැති ඒකාධිකාරි තත්ත්වය වෙනස් වී ගැණුම්කරුගේ වෙළඳපොළ (Buyer's Market) තත්තවයක් දක්වා විකාශනය වුණා.

SAGT ආගමනයත් සමග බහලු මෙහෙයුම් ක්ෂේත්‍රයේ තරගකාරීත්වයක් ඇතිවුණා. ජය බහලු පර්යන්තය වෙත එන බහලු ප්‍රමාණය අඩු වුණා. මොක ද SAGT පැමිණ ජාත්‍යන්තර මෙහෙයුම් ක්‍රම අපට හඳුන්වා දුන්නා. අපි 1999ට පෙර අඛණ්ඩව පැය 24 ම වැඩ කළේ නැහැ. අවුරුද්ද ට දවස් පහක් නිවාඩු. මැයි පළවෙනිදා දිනයත් නිවාඩු. නමුත් SAGT ඇවිත් ලංකාවේ සේවකයන් සමග පැය 24ම, දින 365 ම වැඩ කරන්න පටන් ගත්තා. අවසානයේ මොකද වුණේ. අපේ බහලු මෙහෙයුම් ධාරිතාවය අවුරුදු පතා අඩු වෙමින් ගියා. මට මතකයි ඒ කාලේ මහපොළ අභ්‍යාස ආයතනයේ අපේ සේවක මහතුන් 1000 කට පමණ 'වරායේ එදා අද සහ හෙට' මැයෙන් සේවක මහතුන් දැනුවත් කිරීමට කටයුතු කළා. එහි දී මම අවධාරණය කළේ අපි වෙනුවෙන් අපි වෙනස් වන්නේ කොහාමද කියන කාරණයයි.

මට මතකයි එදා එම වැඩසටහනට පැමිණි ඇතැම් සේවක මහතුන් කිව්වා 'මේ මහත්තයා ඇවිත් ඉන්නේ අපේ රස්සාව නැති කරන්න' කියලා. මම ඔවුන් ට 1993 වසරේ නෙදර්ලන්තයේ රොටර්ඩෑම් වරාය ස්වයංක්‍රීය පර්යන්තයක ක්‍රියාකාරීත්වය පිළිබඳ වීඩියෝ දර්ශනයක් පෙන්වූවා. ස්වයංක්‍රීයව බහලු මෙහෙයවන ආකාර,ය, රියදුරන් නොමැතිව ප්‍රයිම් මූවර් රථ ක්‍රියාතමක වන අයුරු එහි අන්තර්ගත වුණා. මම එදා ඒ ලෙසින් සේවක මහතුන් 1000කට කතා කළා. ඔබ සිතනවා ද සේවක මහතුන් වෙනස් වුණා කියලා? ඇත්තට ම සේවකයින් වෙනස් වුණා. ඔවුන් අදහාගත නොහැකි තරමට වෙනස් වුණා. නිවාඩු නොලබා වැඩ කරන්නට ඔවුන් පෙළඹුණා. එවකට අපේ වැඩ සංස්කෘතිය වෙනස් කළේ කවුද? SAGT ය. එදා අපි ඔවුන් සමග තරගකාරීත්වයට මුහුණ දීමට කෙසේ කටයුතු කළ යුතු ද කියන කාරණාව සමගින් පෙළ ගැසුණා. මෙහි දී සිදු ව තිබුණේ මෙතෙක් කල් අපේ සේවක මහතුන් ට අමතක වෙලා තිබුණ අපි මේ සිදු කරන්නේ ජාත්‍යන්තර සේවාවක් ලබා දෙන බව. ආරක්ෂක හිස් වැසුම්, සපත්තු නොමැතිව සේවයට දිව එන අපේ සේවක මහතුන් හා SAGT හි නව ආරක්ෂිත හිස් වැසුම් , පාවහන්, නිල ඇඳුම් නිසි පිළිවෙළට හැඳ සේවයේ යෙදෙන සේවක මහත්වරු අතර වෙනස අපට දැනෙන්නට වුණා. මොක ද අපේ වරායේ දැක්මේ තිබෙන අපි ජාත්‍යන්තර මට්ටමේ විශිෂ්ට සේවාවක් ලබා දීමට කටයුතු කරන බව අපට අමතක වෙලා තිබුණේ.

**3 ඉන් අනතුරුව මොකද වුණෙ?**

ඊට පස්සේ CICT ආවා. නිකම්ම නොවේ ඔවුන් පැමිණියේ ඩොලර් මිලියන 500කට වඩා ආයෝජනයක් රැගෙනයි. කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය යටතේ ඉදි කළ දකුණු පර්යන්තය අපි වසර 35කට අපි CICT වෙත දුන්නා. අපි 15%ක කොටස්කරුවන් වුණා.

ආසියානු සංවර්ධන බැංකුව මේ සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දුන්නේ අපි ඉහතින් සඳහන් කළ BOT/PPP ක්‍රමවේදයන්ට අනුකූලවයි. එබැවින් දිය කඩනය ඉදිකර පර්යන්ත තනා දකුණු පර්යන්තය වරායට තනිව පවත්වාගෙන යෑමට හැකියාවක් තිබුණේ නැහැ. වරාය අධිකාරිය ස්වයං ලාභ ලැබිය යුතු ආයතනයක් ලෙස කටයුතු කළ යුතු බැව් වරාය පනතේත් දක්වා තිබෙනවා. මෙවන් තත්ත්වයක දී කලාපයේ සමුද්‍රීය වෙළඳාම අඛණ්ඩව පවත්වාගෙන යෑමට අපට තිබුණු හොඳ ම උපයෝගීතාවන් භාවිත කරමින් කටයුතු කළ යුතුයි. අපේ පර්යන්ත රැක ගැනීමට තරගකාරීත්වය හමුවේ අපි වෙනස් විය යුතුයි කියන කාරනාව මම ඔබට නැවතත් මතක් කරන්න කැමතියි.

මං කැමතියි ඒක උදාහරණයකින් පැහැදිලි කරන්න. 'පුංචි කඩයක් තියෙනවා. මට පුළුවන් ඒ කඩය මා විසින් ම පවත්වාගෙන ගිහින් ආදායමක් ලබා ගන්න. ඒ වගේ

> මම එදා ඒ ලෙසින් සේවක මහතුන් 1000කට කතා කළා. ඔබ සිතනවා ද සේවක මහතුන් වෙනස් වුණා කියලා? ඇත්තට ම සේවකයින් වෙනස් වුණා. ඔවුන් අදහාගත නොහැකි තරමට වෙනස් වුණා. නිවාඩු නොලබා වැඩ කරන්නට ඔවුන් පෙළඹුණා.

ම මට පුළුවන් මගේ කඩය කුලියට හෝ බද්ද ට දී ලාබ ගන්න. මෙහි දී අපි ලාභය මත පදනම් විය යුතුයි. මා විසින් වෙහෙස මහන්සි වී කඩය පවත්වාගෙන ගන්නා මුදලට වඩා කඩය කුලියට හෝ බද්දට දීමෙන් මට හිමි වන මුදල වැඩි නම් ඇයි මම වෙහෙස මහන්සි වෙමින් මම ම මේ කඩය කරන්නේ? මට පුළුවන් වෙන්න ඕනෑ වඩා ලාභදායී කුමක් ද කියන තීරණය කරන්න.' එයයි ව්‍යාපාරයේ ස්වභාවය. මෙතැන දී අපි ට මතු වූ තත්ත්වයත් ඒ වගේ මයි.

ඒ වගේ ම අපේ කඩ සියල්ල කුලියට දී නිකම් බලා සිටිනවා ද කියා ඔබට සිතෙන්නට පුළුවන්. නමුත් මින් අපි බලාපොරොත්තු වන්නේ ඒක්සත්ව කැපවීමෙන් වැඩ කිරීම තුළින් අපේ පර්යන්ත රැක ගැනීමට කටයුතු කිරීම.

ඉස්සර සන්තෝසම් දීලා අපෙන් සේවාව ගන්නට උත්සහ කළේ ගැණුම්කරුවන්. නමුත් අද අපිට ඒ ගැණුම්කරුවන් ළඟට යෑමට සිදු වෙලා. නමුත් රජයේ ආයතනයක් ලෙසින් වරාය අධිකාරියට එසේ කරන්න බෑ. ආයතනීය සමාජීය වගකීම් (CSR) විනෝදාස්වාදජනක කටයුතු කිරීට අපහසුයි. රජයේ මුදල් වැය කරමින් නමුත් පෞද්ගලික පර්යන්ත වලට මේ කිසිම ගැටළුවක් නැහැ. ඔවුන් ගැණුම්කරුවන් උපරිමයේන් තෘප්තිමත් කිරීමට කටයුතු කරනවා. ගැණුම්කරුවන් රිසි ලෙසින් ඔවුන් සංතර්පණය කරනවා.

**4 මේ අභියෝගය ජය ගන්නේ කෙසේද? කුමක් ද ඒ සඳහා කළ යුත්තේ?**

ඒ පැනයට පිළිතුරු තියෙන්නේ සේවක ඔබ ළඟමයි. කළමණාකාරීත්වය විසින් සප්තවිධ අලෙවි උපක්‍රම උපයෝගී කර ගනිමින් සිදු කරන බහලු වෙළඳාම හොඳ ම ගුණාත්මක තත්ත්වයෙන් යුතුව විශ්වාසනීයත්වයෙන් යුතුව අපගේ සේවාලාභීන් වෙත ලබා දීමේ කර්තව්‍යය තිබෙන්නේ ඔබ අතේ. ආයතනයේ දියුණුව ළඟා කර තමාගේ දියුණුවත් සලසා ගන්නට සේවක ඔබට සුවිසල් වරමක් තිබෙනවා. එය මැනැවින් ඉටු කිරීම ආයතනයේත්, ඔබේත් දෙපාර්ශවයේ ම දියුණුවට බොහෝ ම වැදගත්. ඉතින් අපි වෙනස් වෙමු. ජාත්‍යන්තර මට්ටමේ විශිෂ්ට සේවාවක් ලබා දීමට අත්වැල් බැඳ ගනිමු.

**5 වරායේ අලෙවිකරණය පිළිබඳ කතා බහට ලක්වන්නේ SAGT පර්යන්තය වරායට එකතු වූ පසුවයි**

ඔව්. ඒක ඇත්ත අලෙවිකරණය තුළ අපිට ප්‍රධාන වශයෙන් මාන 2ක් හැඳින ගන්න පුළුවුන්. ඒ තමයි අභ්‍යන්තර අලෙවිකරණය (Internal Marketing) සහ බාහිර අලෙවිකරණය (External Marketing)

අභ්‍යන්තර අලෙවිකරණය ගැන අපිට මෙහෙම දෙයක් කියන්න පුළුවන්. ඔබ මොහාතකට සිතන්න කිසියම් සේවාවක් ලබා ගන්නට ආයතනයේ ම සේවකයෙක් ඔබ වෙත පැමිණෙනවා කියා. එම සේවකයා අභ්‍යන්තර ගනුදෙනුකරුවෙක්. ඔහුට හෝ අයට තම උපරිමයෙන් උදව් කිරීම, සැලකීම ඔබේ යුතුකමක්. ඔතැනට බාහිර පුද්ගලයෙක් පැමිණුනොත් ඔහු බාහිර ගනුදෙනුකරුවෙක්. මෙතැන දී අපි හැමෝ ම සිතාගත යුතු වැදගත්ම දේ තමයි අපි වෙතට පැමිණෙන පුද්ගලයා බාහිර ද අභ්‍යන්තර ද කියා සෙවී ම නෙවෙයි. ඔහුට/ ඇයට උපරිම සේවාවක් සැලසීමයි අප විසින් කළ යුත්තේ. බොහෝ වේලාවට අපි වරාය අධිකාරියේ කළමණාකාරීත්වය ලෙසින් ගනුදෙනුකරුවන් ට විවිධ පොරොන්දු ලබා දෙනවා. මොනවා ද අපි ලබා දෙන පොරොන්දු? ඔබේ සමාගමට අයත් නැව කිසි ම ප්‍රමාදයකින් තොරව වරායට ගෙන්වා ගෙන උපරිම සේවයක් ලබා දීමට අපි පොරොන්දු වෙනවා. මේ පොරොන්දු ඉෂ්ට කිරීම ට සියළු ම පාර්ශවයන්ගේ දායකත්වය ඉතා ම වැදගත් ඉංජිනේරු කොට්ඨාශය සියළු අංගන කටයුතු, නඩත්තු කිරීම් සිදු කරලා කිසිදු ප්‍රමාදයකින් තොරව නැව නැංගුරම්පොළ වෙත රැගෙන ඒමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරනවා. එපමණක් නෙවෙයි, බඩු බාන අතරේ නෞකාවට අවශ්‍ය සෙසු පහසුකම් ලබා දීමටත් කළමණාකරීත්වය පොරොන්දු වෙනවා. කවුද මේ පොරොන්දු ඉටු කරන්නේ. මේ වරාය අධිකාරියේ සේවයේ නියුතු 9900 තමයි ගනුදෙනුකරුවන්ගේ පොරොන්දු ඉටු කරන්නේ.

නැවට යන්නේ අපේ සේවක මහතුන්. නැව පණගන්වන්නේ අපේ සේවක මහතුන්, ටග් යාත්‍රාවේ, බත්තලේ මේ හැමදේම කරන්නේ වරායේ සෙවයේ යෙදෙන අපේ සේවක මහත්වරුන්. මේ හැම දෙනා ම අන්තර්ක්‍රියාකාරී අලෙවිකරණයේ (Interactive Marketing) ක්‍රියාකාරී සාමාජිකයින් කියා මා දකිනවා. මේ හැම දෙනා ම වරායේ ආදායම් ලබන හෝ අදායම් ලබන ප්‍රභවයක ට සහාය දක්වන අයෙක්. මේ තත්ත්වය වරායේ සේවයේ නියුතු සෑම සේවක මහත්ම මහත්මියකගෙ න් ම ඇති විය යුතුයි. මට මතකයි කොරෝනා තත්ත්වය උත්සන්න වූ කාලයේ කිසිම නෞකාවක් ප්‍රමාද වීම් නොමැතිව විශිෂ්ට සේවාවක් ලබා දීමට සේවකයින් ලෙසින් ඔබ සියළු දෙනාගේ ම දායකත්වය ඉතාමත් වැදගත් වුණා.

**6 ලෝකයේ බහලු වෙළඳාමේ තත්ත්වය පිළිබඳ කතා කළොත්**

ලෝකයෙ පුරා පැවැති රජයේ බහලු පර්යන්ත මෙහෙයවීමෙන් ඉවත් වන ස්වභාවයක් දකින්න පුළුවන්. 1995 වසරේ 40%ක් වූ රජයේ පර්යන්ත දායකත්වය 2005 වසර වන විට 20% දක්වා පහළට වැටිලා. ඒ වගේ ම ඇතැම් රටවල පුද්ගලික ආයතන විසින් පවත්වාගෙන ගිය පර්යන්ත වල තත්ත්වය 50% සිට 20% දක්වා අවප්‍රමාණය වී තිබනවා. විශේෂයෙන් ම රජයේ පර්යන්ත ක්‍රම ක්‍රමයෙන් වැසීයාමේ තත්ත්වයක් තිබෙනවා. එසේ වීමටත් විවිධ හේතු කාරණා ඉවහල් වී තිබෙනවා. බොහෝ අවස්ථා වල රජයේ පර්යන්තයන්ගේ සංවර්ධන කටයුතු වල දී ඍජු තීරණ ගැනීමට නොහැකි වීම, ආයෝජන ගැටළු, සේවකයන් තුළ පවතින වෙනස් වීමට ඇති අකමැත්ත, ඵලදායී කර්යක්ෂමතාව නංවාලීමේ දී නම්‍යශීලී නොවීම, ගැටළු ඇති වීම, වට්ටම් ලබා දීමට නොහැකි වීම ආදී කරුණු හේතුවෙන් රජයේ පර්යන්ත වල තත්ත්වය ඉතා ම ඛේදනීය ඉරණමකට මුහණ පා තිබෙනවා.

නමුත් බහලු මෙහෙයුම් ක්‍රියාවලියේ 10%ක ප්‍රතිශතයක සිටි ගෝලීය මෙහෙයුම්කරුවන්ගෙ (Global Operators) ප්‍රමාණය 60% දක්වා වැඩිවීම අපි ට විශේෂයෙන් හැඳින ගන්නට පිළිවන්. සමස්ථ ලෝකයේ ම බහලු මෙහෙයුම් පාලනය කරනා ප්‍රබල ගෝලීය පර්යන්ත මෙහෙයුම්කරුවන් ප්‍රධාන වශයෙන් 07ක් හැඳින ගන්නට පුළුවන්. 2018 වර්ෂයේ මුළු ලෝකයේ ම බහලු මෙහෙයුම් මිලියන 818ක් සිදු කර තිබෙන බව Drewery මූලාශ්‍ර දක්වනවා. ඉන් 37%ක් ම කරන්නේ මම ඉහත සඳහන් කළ ගෝලීය මෙහෙයුම්කරුවන් හත් දෙනා. දැන් බලන්න අපේ සහෝදර පර්යන්ත වන SAGT හා CICT හි බහලු මෙහෙයුම් සිදු වන්නේ මෙවැනි ගෝලීය මෙහෙයුම්කරුවන්ගෙ දායකත්වය සමගින්. SAGT හි ගෝලීය මෙහෙයුම්කරුවන් දෙදෙනකු හැඳින ගන්න පුළුවන්. ඒ තමයි 32%ක දායකත්වය උසුලන AP Mollar (Mearsk Line) හා 10%ක දායකත්වයක් උසුලන Evergreen සමාගම්. CICT හි වැඩි ප්‍රතිශයක්, 85%ක් ම බහලු මෙහෙයුම් China Merchant Ports ආයතනය විසින් සිදු කරනවා.



ආයතනයේ දියුණුව ළඟා
කර තමාගේ දියුණුවත්
සලසා ගන්නට සේවක ඔබට
සුවිසල් වරමක් තිබෙනවා.
එය මැනැවින් ඉටු කිරීම
ආයතනයේත්, ඔබේත්
දෙපාර්ශවයේ ම දියුණුවට
බොහෝ ම වැදගත්. ඉතින්
අපි වෙනස් වෙමු. ජාත්‍යන්තර
මට්ටමේ විශිෂ්ට සේවාවක් ලබා
දීමට අත්වැල් බැඳ ගනිමු.

අපගේ සමුද්‍රීය කලාපයේ ම ප්‍රබලයෙක් වන සිංගප්පූරු වරාය අධිකාරිය (PSA) විසින් ටියුටිකොරීන්, චෙන්නායි හා නවශිවා වරායයන්ගේ මෙහෙයුම් කටයුතු සිදු කරනවා. හචිසන් පෝර්ට් (Hutchison Ports) පකිස්ථානු වරාය මෙහෙයුම් කරගෙන යනවා. Cosco Shipping Ports ගල්ෆ් සහ අබුඩාබි වල වරාය බහලු මෙහෙයුම් කටයුතු සිදු කරනවා. DP World ඩුබායි වරාය, ඉන්දියාවේ චෙන්නායි වරායේ එක් පර්යන්තයක්, කොචින් වරායේ හා නවශිවා වරායේ එක් පර්යන්තයක් ලෙස බහලු මෙහෙයුම් සිදු කරනවා. APMT පිපා වරායේ එක් පර්යන්තයක් හා නවශිවා වල එක් පර්යන්තයක් ද බහලු මෙහෙයුම් සිදු කරනවා.

AP Mollar APM පර්යන්ත මෙහෙයවීම් සිදු කරනවා. SAGT හි 32%ත් ආයෝජනය කර තිබෙන්නේ මොවුන්. China Merchant Ports ආයතනය CICT හි 85%ක් හා හම්බන්තොට වරායේ 85%ක දායකත්වය උසුලනවා. ඔවුන් අද දවසේ වරාය කළමණාකරණයට පවා යොමු වී තිබෙනවා.

මේ තත්ත්වය කිසිදු අයෙකුට, කිසිදු රජයකට මැඩපවත්වන්න බැහැ. මොක ද මෙය ගෝලීය වශයෙන් ම ව්‍යාපාරයේ ව්‍යාප්ත වී ඇති නිසා.

**7 මම කැමතියි අපේ අසල්වැසි රට වන ඉන්දියාව ඇසුරින් මේ තත්ත්වය වඩාත් පැහැදිලි කර ගන්න.**

ඔව් අපේ අසල්වැසි රට වන ඉන්දියාව දිහාවට හැරුණොත් ටියුටිකොරීන් හි වරාය දෙක ම පුද්ගලික අංශය යටතේ පවත්වාගෙන යනවා. නවශිවා වරාය බහලු පර්යන්ත 5ක් (JNPT, NSIGI, NSICT, APMGT, BMCT) තිබෙනවා. ඉන් 4ක් ම පෞද්ගලික අංශය යටතේ යි මෙහෙයුම් සිදු කරන්නේ. ගුජරාට් හි කුච් දිස්ත්‍රික්කයේ පිහිටි මුන්ද්‍රා වරාය ඉන්දියාවේ විශාලත ම පෞද්ගලික වරාය ලෙසින් සැලකිය හැකියි. මුන්ද්‍රා වරායේ ඇති පර්යන්ත සංඛ්‍යාව 04ක්. මේ සියල්ල ම පාළනය වන්නේ Adani Ports & SEZ සමාගම යටතේ එපමණක් නොවෙයි ඉන්දියාවේ වරාය ඉදිකිරීමට පවා පෞද්ගලික අංශයට අවස්ථාව ලබා දී තිබෙනවා.

මට මතකයි Maersk Line 1999 අවුරුද්දට

28 පිටුවට

සටහන - උපුල් ගුරුගේ

# කොළොම්තොට කොරෝනා මුක්ත කලාපයක් කිරීමේ

# අපේ සුව විරුවෝ



වරාය පරිශ්‍රයෙන් කොරෝනා මැඩලීමට සියලු කොට්ඨාශ එක්සත්ව එක්සිත් ව පෙරමුණ ගත්තේ ය. ඒ අතර විසල් දායකත්වයක් ලබා දුන් වෛද්‍ය කොට්ඨාශයේ කාර්ය භාරය අතිමහත් ය. වෛද්‍ය කොට්ඨාශයේ 'අපේ සුව විරුවන්' රැයක් දවාලක් නොබලා රෝග මර්ධනයට අවැසි සියළු කටයුතු නොපිරිහෙලා ඉටුකර, වරායේ මෙහෙයුම් ක්‍රියාවලිය ට ජීවය සැලසූ හ. මේ පිළිබඳ විස්තර තොරතුරු දැනගනීම සඳහා අප වෛද්‍ය කොට්ඨාශයේ ප්‍රධාන වෛද්‍ය නිළධාරිණී යූ.එස්. ජයසේකර මහත්මිය හමුවුණෙමු.

සැබැවින් ම කොරෝනා කාලේ ජය ගන්නට වෛද්‍ය කොට්ඨාශයේ අපේ සුව විරුවන් හා වරායේ සෙසු කොට්ඨාශ සියල්ලේ ම දායකත්වය නොඅඩුව ලැබුණි. වාරය විෂය භාර අමාත්‍යතුමා, සභාපතිතුමා, කළමණාකාර අධ්‍යක්‍ෂතුමා, අතිරේක කළමණාකාර අධ්‍යක්‍ෂතුමා ඇතුළු කළමණාකාරීත්වයේ උසස් නිළධාරීන් සිය උපරිමයෙන් කැපවීමෙන් කොරෝනා මර්ධනයට සිය දායකත්වය දැක්වී ය.

සභාපති ජෙනරාල් දයා රත්නායක මහතාගේ මෙහෙයවීම මත වෛද්‍ය කොට්ඨාශයෙන් සිදු වූ මෙම සියළු කටයුතු සඳහා ආරක්‍ෂක කොට්ඨාශයේ දායකත්වය ද නොඅඩුව ලැබුණි. වරායේ සියළු දොරටු වල උෂ්ණත්වමාන උපකරණ තබා ගනිමින් වරායට පිවිසෙන සේවක මහත්ම මහත්මීන්ගේ උණ තත්ත්වය පරික්‍ෂා කිරීමෙන් අනතුරුව වරාය පරිශ්‍රයට ඇතුළු වීමේ අවස්ථාව සලසා දීමට පියවර ගැණිනි. මේ කටයුතු සිදු කෙරුණේ ආරක්‍ෂක අංශයේ නිලයන් වෙතින් ම වීම විශේෂත්වයකි. මෙහි දී උෂ්ණත්වය $37.4^{0}C$ ට වැඩි කිසිදු සේවක මහත්ම මහත්මියක් වරාය පරිශ්‍රයට නොගැනීමේ ක්‍රියාවලිය තුළ වරායේ මෙහෙයුම් ක්‍රියාවලිය ට ජීවය සලසන සේවක ප්‍රජාවගේ ආරක්‍ෂාව පිළිබඳ සහන් එළියක් පැතිරිණි. දවස් තුනකට වඩා වැඩි කාලයක් නිවසේ සිට සේවයට පැමිණෙන සියළු සේවක මහත්ම මහත්මීන් සේවක කොට්ඨාශයට ඇතුළු වීමට පෙර වෛද්‍ය මධ්‍යස්ථානයට ගොස් වෛද්‍ය පරීක්‍ෂණයකට ලක් වීම ට සිදු වි ය. මේ තුළින් අපේක්‍ෂා කරන ලද්දේ සමස්ථ සේවක ප්‍රජාවගේ ම සෞඛ්‍ය අයිතීන් සුරක්‍ෂිත කිරීමයි.

සේවක මහත්ම මහත්මීන්ගේ සෞඛ්‍ය ම ය ආරක්‍ෂාව උදෙසා පොරොත්තු ලේඛණ (රෝස්ටර්) රාජකාරි ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලැබී ය. ඒ අනුව ආරක්‍ෂක කොට්ඨාශයේ දින 07ක අඛණ්ඩ සේවා ව ඉටු කර ඊළඟ දින 07 නිවසේ ගත කිරීමට ද, ඉංජිනේරු කොට්ඨාශ වල දින 03ක් සේවයේ නිරතව දින 05ක් නිවසේ ගත කිරීමට ද අවකාශ සලසමින් සේවක මහත්ම මහත්මීන්ගේ සෞඛ්‍ය තත්ත්වය ස්ථායිතාවයෙන් යුතුව පවත්වා ගැනීමට කටයුතු කෙරිණි. මේ ලෙසින් කිසියම් කොට්ඨාශයක මුළු සේවක සංඛ්‍යාව ගෙන්වා ගැනීමෙන් වැළකී පොරොත්තු

ඇතැම් දිනෙක වෛද්‍ය පරීක්‍ෂණ සඳහා වෛද්‍ය කොට්ඨාශයට ට පැමිණි සේවක සංඛයාව 800කට අධික වේ. එවැනි තත්ත්වයක් තුළ වුව ද සිය දායකත්වය නොපිරිහෙලා ඉටු කිරීමට වෛද්‍ය කණ්ඩායම දැක් වූ දායකත්වය සමස්ථ වරාය මෙහෙයුමේ ඵලදායීතාවය උදෙසා කරනු ලැබූ බුහුමනකි.

ලේඛණයක ට අනුකූල ව අව ම සේවක පිරිසකගෙන් උපරිම ඵලදායීතාවයක් ලබා ගැනීමට සියළු කටයුතු සම්පාදනයේ මුඛ්‍ය අරමුණ වූයේ වරායේ සේවක මහත්ම මහත්මීන් ආරක්‍ෂා කර ගනිමින් වරාය පරිශ්‍රය කොවිඩ් - 19 මුක්ත කලාපයක් ලෙස පවත්වා ගැනීම ය. සැබැවින් ම මෙය කිසිසේත් ලෙහෙසි පහසු කටයුත්තක් නොවී ය. වෛද්‍ය කොට්ඨාශයෙහි සේවක සංඛ්‍යාව ද 20% දක්වා සීමා කෙරිණි.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සභාපති ජෙනරාල් දයා රත්නායක මහතාගේ මග පෙන්වීම යටතේ ලේකම් කාර්යාලයේ ස්ථාපිත කරන ලද තොරතුරු මධ්‍යස්ථානය ඔස්සේ කොවිඩ් - 19 වෛරසය සම්බන්ධයෙන් ගතයුතු සියළු ක්‍රියාමර්ග පිළිබඳ කටයුතු යාවත්කාලීන කිරීම ට විගසින් පියවර ගැණිනි.

ප්‍රධාන වෛද්‍ය නිළධාරිනී යූ.එස්. ජයසේකර මහත්මිය පවසන පරිදි දින කීපයක් නිවසේ සිට සේවයට වාර්තා කරන කිසියම් සේවක මහත්ම මහත්මියක් උණ රෝග යෙන් පෙළෙන බැව් තහවුරු වුණි නම් එම සේවක මහතා හෝ මහත්මිය වෙත දින 05ක නිවාඩු ලබා දෙමින් වරාය පරිශ්‍රයෙන් බැහැර කිරීමට කටයුතු කරන ලදී. වරාය පරිශ්‍රයේ දී උණ රෝගය වැළඳුණු සේවකයන් හට ද මේ නියාමනය ක්‍රියාත්මක කෙරිණි. මෙහි දී ඒ සේවක මහතා හෝ මහත්මිය සම්බන්යෙන් ඔහු/ඇය අයත් කොට්ඨාශය මෙන් ම කොවිඩ් තොරතුරු මධ්‍යස්ථානය ද දැනුවත් කිරීමට වෛද්‍ය කොට්ඨාශය නිරන්තරයෙන් වගබලා ගත්තේ කොවිඩ් - 19 එතරම් ම මාරන්තික වූ හෙයිනි.

කිසියම් සේවකයෙකු උගුරේ අපහසුතාවයකින්, සෙම්ප්‍රතිශ්‍යාව, කිව්සුම් යෑම වැනි ස්වසනාබාධ වලින් පෙළේ නම් ඔහු ට/ඇය ට දින 03ක නිවාඩු ලබා දී ප්‍රතිකාර ලබා ගැනීමට කටයුතු සැලසී ය. වරාය පරිශ්‍රයේ දී එවැනි අයෙකු හමුවුවහොත් ඔහු/ ඇය රෝගීන් වෙන්කර තැබීමේ ස්ථානයේ තබා 1990 සුවසැරිය සේවා ව ඔස්සේ කොළඹ ජාතික රෝහලට යැවීමට වෛද්‍ය කොට්ඨාශයේ කාර්ය මණ්ඩලය කටයුතු කරන ලදී.

ඉනිඳු නොනැවතී රෝගියාගේ තත්ත්වය පරික්‍ෂා කරමින් ඔහු ඇතුළත් වූ වාට්ටුව, සිදු කරන ලද පරීක්‍ෂණ - විශේෂයෙන් PCR පරීක්‍ෂණ සිදුකර තිබේ ද, එසේ නම් එම පරීක්‍ෂණයේ ප්‍රතිඵල තත්ත්වය ඇතුළු සියළු කරණු සොයා බැලීම ද වෛද්‍ය කොට්ඨාශයේ වෛද්‍යවරුන්ගේ දෛනික රාජකාරි අතර ට එක් වි ය. වරාය පරිශ්‍රයේ දී කිසියම් රෝගී තත්ත්වයක් මත හෝ ජාතික රෝහල ට ඇතුළත් කරන ලද කිසිම සේවකයෙක් කෝවිඩ් - 19 රෝගී තත්ත්වයෙන් නොවී ම සමස්ථ වරාය අධිකාරිය ලෙසින් ම ලැබූ ජයක් ලෙස සැලකිය හැකි ය. මෙහි දී සේවක ප්‍රජාවගෙන් ද වෛද්‍ය කොට්ඨාශයට ලැබුණේ නොම ද සහායකි. කිසියම් සේවක මහතෙකු පැනඩෝල් පෙත්තක් ගත්ත ද එය පවා අප වෙත දැණුම් දෙන තරමේ අවබෝධයක් ඔවුන් සතු වි ය.

ජය බහලු පර්යන්තය, නියමු මධ්‍යස්ථානය, බණ්ඩාරනායක පාළම, ඉංජිනේරු කොට්ඨාශයේ වැඩබිම් වෙත යමින් නිරන්තරයෙන් ම සේවක මහත්වරුන්ගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ පරික්‍ෂා කිරීමට ප්‍රධාන වෛද්‍ය නිළධාරී යූ.එස්. ජයසේකර මහත්මියත්, වෛද්‍ය චින්තක සේමසිංහ මහතා ත් නිරතුරුව ඇප කැප වි ය.

දින 07කට වරක් නිවෙස් වල සිට පැමිණෙන සේවක පිරිස් සේවයට වාර්තා කිරීමට පෙර වෛද්‍ය කොට්ඨාශයේ පරික්‍ෂාවට ලක් වි ය යුතු වි ය. එබැවින් එවැනි දින වල පෙරවරු 06.00 කණිසමේ සිට වෛද්‍ය කොට්ඨාශය සේවක මහත්ම මහත්මීනගෙන් පිරී ඉතිරී ගොසිනි. වෛද්‍ය කොට්ඨාශයේ වෛද්‍යවරුන් සිය මෙහෙවර අළුයම 06.00 සිට ම ආරම්භ කිරීමට කටයුතු කල අතර, එහි සහාය ට ආරක්‍ෂක කොට්ඨාශයේ නිලයන්ගේ ද සුවිසල් සහයෝගයක් ලැබීම කණ්ඩායම් හැඟීමේ අපූර්වත්වය හෙළි කරන්නකි.

එසේ පැමිණෙන සේවක මහතුන් නිසි ලෙසින් විෂ බීජහරණයට ලක් කර පරීක්‍ෂා කිරීමේ කටයුතු සඳහා ගිනි නිවීමේ ඒකකයේ සේවක කැළගේ දායකත්වය ද ලැබුණි. සෞඛ්‍ය අමාත්‍යංශයේ උපදෙස් මෙන් ම වරාය මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල ව මෙම සියළු ආරක්‍ෂණ කටයුතු ක්‍රියාත්මක වීම සමස්ථ වරාය සේවක මහත්මීන් ම ලැබූ ජයග්‍රහණයකි.

ඇතැම් දිනෙක වෛද්‍ය පරීක්‍ෂණ සඳහා වෛද්‍ය කොට්ඨාශයට ට පැමිණි සේවක සංඛයාව 800කට අධික වේ. එවැනි තත්ත්වයක් තුළ වුව ද සිය දායකත්වය නොපිරිහෙලා ඉටු කිරීමට වෛද්‍ය කණ්ඩායම දැක් වූ දායකත්වය සමස්ථ



> වරාය අධිකාරියේ කොරෝනා මැඬලීමේ නියමුවා හැටියට අපේ සභාපතිතුමා හඳුන්වන්න පුළුවන්. එතුමාගේ ඍජු තීරණ හා ක්‍රියාකලාපය තුළින් අපි ට මේ සඳහා කැපවීම බොහෝ ම පහසු වුණා. වරායේ කිසිදු කොරෝනා රෝගියෙක් හමු නොවීම අපේ සාර්ථකත්වය හෙළි කරනවා.

ප්‍රධාන වෛද්‍ය නිළධාරිනී
**යූ.එස්. ජයසේකර**

වරාය මෙහෙයුමේ ඵලදායීතාවය උදෙසා කරනු ලැබූ බුහුමනකි.

කොවිඩ් තත්ත්වයට පෙර වෛද්‍ය මධ්‍යස්ථානයට සාමාන්‍ය දිනක දී පැමිණි (රෝගී) සේවක මහත්ම මහත්මීගේ සංඛ්‍යාව දළ වශයෙන් 150ක් පමණ වි ය. නමුත් මෙම කොරෝනා වෛරසය හමුවේ වෛද්‍ය මධයස්ථානයට පැමිණෙන පිරිසේ අඩුවීමක් දක්නට ලැබිණි. සමස්ථයක් ලෙස මාර්තු මාසයේ පැමිණි රෝගීන් සංඛ්‍යාව 1627කි. එය අප්‍රේල් මාසයේ 7126 දක්වා වර්ධනයක් පෙන්නුම් කරන ලදී. මැයි මාසයේ දී කාර්යාල පරිශ්‍රයන් ගේ තත්ත්වය සමහන් වීමත් සමග වෛද්‍ය කොට්ඨාශ ට පැමිණ පිරිස ඉහළ අගයක් පෙනවයි. එය සංඛ්‍යාත්මක ව 9781ක් වි ය.

වරායේ මුළුතැන්ගේ පරිශ්‍රයේ ස්වස්ථතාව නංවාලීමට ද වෛද්‍ය කොට්ඨාශය නිරන්තර කටයුතු කරන ලදී. ඒ පිළිබඳව නිරන්තර ක්ෂේත්‍ර නිරීක්ෂණ වලට සහභාගී වෙමින් මෙන් ම එම පරිශ්‍රයේ සේවක මහතුන් නිරන්තර දැනුවත්භාවය ට පත්කරමින් මෙම කටයුතු සිදු කෙරිණි.

මෙහෙයුම් කොට්ඨාශයේ සේවක මහතුන් ඇමතීම ට ඔවුන්ගේ විවේකාගාර වෙත යමින් නිරන්තර ඒ පිළිබඳ දැනුවත් කිරීමට ප්‍රධාන වෛද්‍ය නිළධාරිනී ජයසේකර මහත්මිය හා වෛද්‍ය චින්තක සේමසිංහ මහතා රැයක් දවාලක් නොබලා සිය මෙහෙවර ඉටු කිරීමට පෙළ ගැසුණේ කිසිසේත් වරාය පරිශ්‍රය තුළ කොවිඩ් - 19 වසංගත රෝගියෙකු ඇස නොගැටීමේ මුඛ්‍ය පරමාර්ථයෙනි.



වෛද්‍ය මධ්‍යස්ථානය වෙතින් මාසික ඖෂධ ලබා ගන්නා සේවක මහත්ම මහත්මීන් හට ක්ෂණික ඇමතුම් සේවාවක් (Hot Line) තුළින් සිය ඖෂධ ලබා ගැනීමේ ක්‍රියා පිළිවෙතක් ක්‍රියාවට නැංවුණි. ලේකම් කාර්යාලයේ පිහිටි කොවිඩ් මෙහෙයුම් මධ්‍යස්ථානය හා වෛද්‍ය කොට්ඨාශය සම්බන්ධ කරමින් සිදු වූ මෙම කටයුත්ත උදෑසන 07.00 සිට 09.00 දක්වා ක්‍රියාවට නැංවුණි. වෛද්‍ය කොට්ඨාශයට ඇමතුමක් ලබා දීමෙන් අනතුරුව ප්‍රමාදකින් තොරව තමාට හිමි ඖෂධ ලබා ගැනීමට සේවක මහත්ම මහත්මීන් හට අවස්ථාව සැලසුණි. දන්ත වෛද්‍ය අංශය තාවකාලිකව වසා දැමීම ට තීරණය කළ අතර, දන්ත ශල්‍ය වෛද්‍යවරිය මගින් උපදෙස් ලබා ගැනීමට, උපදේශනය පමණක් එහි කටයුතු සීමා කිරීමට කටයුතු කරන ලදී.

වෛද්‍ය කොට්ඨාශයේ සේවා අවශ්‍යතාව මත එහි සේවය කරන සේවක මහත්ම මහත්මීන් හට උදෑසන 06.00ට පෙර සේවයට වාර්තා කිරීමට සිදු වි ය. එබැවින් එහි කාර්ය මණ්ඩලය පෙරවරු 06.00-12.00 ලෙසින් කටයුතු කිරීමටත්, රෝස්ටර් රාජකාරියේ නියුතු සේවක පිරිස සුපුරුදු පරිදි සේවයේ යෙදීමටත් පියවර ගැණිනි.

වරාය පරිශ්‍රය තුළ කොරෝනා සම්බන්ධයෙන් නාවික හමුදාව යම් කිසි ගැටළුකාරී තත්ත්වයකට පත් වී ය. මෙහි දී ගරු සභාපතිතුමන්ගේ මැදිහත්වීමෙන් වරාය පිවිසුම් දොරටු වල සේවයේ නිරතව සිටි නාවික නිලයන් එම රාජකාරි කටයුතු වලින් නිදහස් කිරීමට කටයුතු කළේ ය. ඉන් නොනැවතී ඔවුන් නැගෙනහිර පර්යන්ත පරිශ්‍රයේ ජය බහලු සේවක මහතුන් සඳහා ඉදි කළ විවේකාගාරයේ නේවාසික පහසුකම් ලබා දී සාමාන්‍ය වරාය පරිශ්‍රයෙන් බැහැරව තැබීමට පියවර ගන්නා ලදී. ඔවුන් ට අවශ්‍ය ආහාර පාන, ඉන්දන ආදී සියළුම අවශ්‍ය ද්‍රව්‍යයන් ද වරාය අධිකාරයෙන් ම ලබා දී ඔවුන් වරාය පරිශ්‍රයේ සංසරණය වීම මුළුමනින් ම නවතා ලීමට පියවර ගන්නා ලදී. මෙම කාල සීමාව තුළ ඔවුන් හට රංගල නාවික හමුදා කඳවුර සමගින් කිසිදු සම්බන්ධතාවයක් පවත්වා නොග ැනීමට වගබලා ගැණුනි. එසේ ආරක්ෂාකාරී ක්‍රමවේදයක් ස්ථාපිත නොකරන්න ට මේ වන විට වරාය පරිශ්‍රය බොහෝ අභාග්‍ය සම්පන්න තත්ත්වයකට මුහණ පාන්නට ඉඩ තිබුණි. නිවැරදි නායකත්වය හා ඍජු තීරණ මැදින් එම තත්ත්වය සමහන් කර ගැනීමට වරාය අධිකාරියට හැකි වි ය. වරායේ සේවක මහත්ම මහත්මීන් ගේ වැඩිදුර සෞඛ්‍යාරක්ෂාව උදෙසා එම නාවික නිලයන් සියල්ල PCR පරීක්ෂා වෙත යොමු කිරීමට ද වෛද්‍ය කොට්ඨාශයේ මැදිහත්වීමෙන් පියවර ගන්නා ලදී. එම නාවික නිලයන් ගේ පරීක්ෂණ වාර්තා සුභදායී වුව ද ඔවුන් සමග ගනුදෙනු කළ වරාය සේවක මහත්ම මහත්මීන් වෙත ද PCR පරීක්ෂණ සිදු කිරීමට පියවර ගැණින.

මෙහි දී වරායේ සේවක මහත්ම මහත්මීන් පමණක් නොව වරාය භාවිතා කරන්නා වූ වාප්පු ලිපිකරුවන්, ආපන ශාලා සේවක කාර්ය මණ්ඩල, ලොරි රථ රියදුරන්, වරාය පොලිසිය, ශ්‍රී ලංකා රේගුව ආදිය සේවක මහත්ම මහත්මීන් මෙන් ම අපගේ සහෝදර බහලු පර්යන්ත වන SAGT, CICT හි කාර්ය මණ්ඩල ආදියෙහි ද නියැදි පරික්ෂාවට ලක් කෙරුණි. පරික්ෂාවට ලක්කෙරුණු සියළු දෙනාගේ ප්‍රතිඵල මත වරාය පරිශ්‍රය වූකලී කොවිඩ් - 19 මුක්ත කලාපයක් බැව් සෞඛ්‍ය අමාත්‍යංශය විසින් තහවුරු කරන ලදී. ඒ සඳහා දායකත්වය සැපයූ ප්‍රධාන වෛද්‍ය නිළධාරීතුමිය ඇතුළු වෛද්‍ය කොට්ඨාශයේ සියලු වෛද්‍යවරුන් හා සමස්ථ කාර්ය මණ්ඩලය ට වරාය සේවක ප්‍රජාවගේ ප්‍රණාමය හිමිවිය යුතු ම ය. බියෙන් සැකෙන් තොරව සේවයට වාර්තා කිරීමට අවශ්‍ය වටාපිටාවක් ගොඩනංවාලීමට ඔවුන් නිරන්තරයෙන් ඇප කැප වූ හ. මේ මොහොතේදීත් ඊට සියළු ආකාරයෙන් අනුප්‍රාණය දෙමින් සිය ආයතනය වෙනුවෙන් තනතුරු භේදයකින් තොරව කිසිදු ලාභාපේක්ෂාවකින් තොරව සේවය නිසි ලෙසින් ඉටු කිරීම පැසසිය යුතු ය.

මාර්ගෝපදේශ සංග්‍රහය සම්පාදනය කිරීම ද වෛද්‍ය කොට්ඨාශයේ මැදිහත්වීමෙන් කළ එළි දුටු සාර සංග්‍රහයකි. සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශයේ නිර්මාණ දායකත්වයෙන් යුතුව අතිරේක කළමණාකාර අධ්‍යක්ෂතුමාගේ නායකත්වයෙන් සම්පාදනය කළ මෙම කොවිඩ් - 19 මාර්ගෝපදේශ සංග්‍රහය තුළ අන්තර්ගත වූ කරුණු සියළු කොට්ඨාශ ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඒ ඒ පරිශ්‍ර තුළ ක්‍රියාවට නැංවීමට පියවර ගන්නා ලදී.

මෙලෙස වරාය අධිකාරියේ කොවිඩ් මර්ධනය කිරීමේ සාර්ථකතවයේ කතා පුවත තුළ වෛද්‍ය කොට්ඨාශයේ දායකත්වය ට ශක්තිමත්ම වූ සියළු ම කොට්ඨාශයන්ගෙන් ලැබුණු අනුපමේ ය සහාය පිළිබඳ ප්‍රධාන වෛද්‍ය නිළධාරිනී යූ.එස්. ජයසේකර මහත්මිය සිය ප්‍රණාමය සියළු පර්ශවයන් වෙත පුද කර සිටින්නී ය.



# තොටමුණ

## ශ්‍රී ලංකා වරාය අධිකාරිය - ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සමඟ ගිවිසුමක



ශ්‍රී ලංකා වරාය අධිකාරියේ භාවිතා වූ NEC දුරකතන හුවමාරු පද්ධතිය යාවත්කාලීන කරමින් ඉදිරි වසර 10 සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සමඟ කටයුතු කිරීමට අදාළ ගිවිසුම පසුගිය දා සිදු කරන ලදී.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ජෙනරල් දයා රත්නායක මහතා සහ ටෙලිකොම් ආයතනයේ ප්‍රධාන විධායක නිළධාරී කේ.ජේ.කේ. පෙරේරා මහතා අතර මෙම ගිවිසුම සිදු වි ය.

ජපානයේ නිෂ්පාදිත NEC නාමකරණයෙන් යුත් වරායේ භාවිතා වූ දුරකථන හුවමාරු පද්ධතියේ පැවති යාවත්කාලීන කිරීමේ අපහසුතා ,නඩත්තු කිරීමේ අපහසුතා ආදිය මග හරවා ප්‍රශස්ත ක්‍රමවේදයක් ඔස්සේ මෙම දුරකථන හුවමාරු පද්ධති යාවත්කාලීන කිරීමට කටයුතු කරන ලදී.

එහි ප්‍රතිඵලයක් ලෙසින් නිසි ටෙන්ඩර් පටිපාටිය ඔස්සේ ජපානයේ NEC සමාගම විසින් නිෂ්පාදිත රුපියල් මිලියන 63 ක (+වැට්) පිරිවැයකින් යුතු දුරකථන හුවමාරු පද්ධතිය ලබා ගැනීමට කටයුතු යෙදුණි.

මෙහිදී ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මැදිහත් වෙමින් ඒ සඳහා වසර 10 කට ගිවිසුම් ගත වෙමින් මෙම දුරකථන හුවමාරු පද්ධතිය ශ්‍රී ලංකා වරාය අධිකාරියට ලබා දීමට එකඟ වි ය.

## ජනාධිපති කෝවිඩ් 19 සහන අරමුදලට වරාය අධිකාරියේ සේවක දායකත්වයෙන් රු.මිලියන 18.6 ක්



ශ්‍රී ලංකා වරායාඅධිකාරියේ සේවක මහත්ම මහත්මීන්ගේ දායකත්වයෙන් යුතුව ජනාධිපති කොවිඩ් -19 සහන අරමුදල සඳහා මුල්‍යමය පරිත්‍යාගයක් සිදුකිරීම පසුගියදා සිදුවිය.

රුපියල් මිලියන 18.6 ක වටිනාකමකින් යුත් චෙක්පත කොවිඩ් 19 සහන අරමුදල වෙත ලබා දීම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වැ.බ. උපසභාපති /කළමණාකාර අධ්‍යක්‍ෂ ඩබ්.එස්.වීරමන් මහතා විසින් අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්‍ෂ මැතිතුමා වෙත පිරිනමන ලදී. මෙම අවස්ථාවට වරාය හා නාවික ගරු අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු, වරාය හා නාවික අමාත්‍යාංශ ලේකම් එම්.එම්.පී.කේ. මායාදුන්නේ, අතිරේක කළමණාකාර අධ්‍යක්‍ෂ උපාලි ද සොයිසා යන මහත්වරු එක්වූ හ.

## සැප්තැම්බර් මාසයේ දී අනුරාධපුර නිවාඩු නිකේතනය සේවක අයිතියට





බෞද්ධ සංගමය මගින් අනුරාධපුරයේ පූජා නගරයේ ඉදිකළ නිවාඩු නිකේතනයේ වැඩ කටයුතු අවසන් කර සැප්තැම්බර් මාසයේ දී වරාය සේවක අයිතිය වෙත පවරා දීමට කටයුතු යොදා ඇත.

එම නිවාඩු නිකේතනයට අවශ්‍ය ගෘහභාණ්ඩ ඇතුළු උපකරණ පරිත්‍යාග කිරීමට ද ඔබට අවස්ථාව ඇති අතර බෞද්ධ සංගමයේ භාණ්ඩාගාරික 07148005687 දුරකථන අංකයට ඇමතීමෙන් ඒ පිළිබඳ වැඩිදුර තොරතුරු ලබා ගත හැකිය.

## හරිත වරායක් ගොඩනැංවීම උදෙසා

### MTCC Asia Webinar

### වැඩමුළුව මහපොළ සමුද්‍රීය විද්‍යායතනයේ දී




හරිත වරායක් ගොඩනැංවීම උදෙසා ආසියානු සමුද්‍රීය තාක්‍ෂණ සහයෝගිතා මධ්‍යස්ථානය (Maritime Technology Cooperation Center - Asia) සංවිධානය කළ MTCC Asia Webinar වැඩමුළුව අතිසාර්ථක ලෙසින් පසුගිය දා පැවත්විණි.

සමුද්‍රීය සම්පත් දායකයින් රැසකගේ දායකත්වයෙන් මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනයේ දී ප්‍රථම වතාවට පැවැති මෙම වැඩමුළුව මුළුමනින් ම අන්තර්ජාල තාක්‍ෂණය ඔස්සේ පැවැත්විණි.

මහාචාර්ය ජින් යෝ ෂිය, මහාචාර්ය ෂී ෂින්, මහාචාර්ය රූ ආන් වේ, ෂැංහයි නාගරික ප්‍රවාහන කොමිසමේ වූ වෙයිෆෙන්ග්, මහාචාර්ය චෙන් යූ ලී, මහාචාර්ය මින් හන් හයට්, COSCO නැව් සමාගමේ කපිතාන් ක්වින් ජින් පියන්, මහාචාර්ය සූ ෆෙංග් ඇතුළු සමුද්‍රීය ක්ෂේත්‍රයේ විද්වතුන් රැසක් මෙම වැඩමුළුවේ සම්පත් දායකත්වයට එක් වූ හ.

# පහන් කණුවක අමතක නොවන දවසක්

සටහන - කාව්‍ය ඉන්ද්‍රජිත්

රැටින් රට, නැවෙන් යන්නේ නාවිකයෝ ය. නාවිකයින් පිළිබඳ නොයෙක් අන්දරයන් පෙර අපර දෙදිගම ජනවහරේ ද සාහිත්‍යයේ ද වෙයි. ලොව සුපතල ''රොබින්සන් කෘසෝ'' වීර චාරිකාව ද ''ප්‍රංශ ලේඛකයන්ට තෝතැන්නක් වූ ''මාසෙල්ස්'' වරාය ද ''වීර කාව්‍යයන්ට නිජබිමක් වූ රෝමයේ ක්‍රීට දූපත ද බුදුන් වහන්සේගේ ජාතක කතාද අරාබි නිසොල්ලාසය ද නාවිකයින්ගේ මිහිරි මතක ද, වීරත්වය ද දුක්ඛ දෝමනස්සයන් ද ගෙනහැර පායි. පාඨකයා අමන්නාදයට පත් කරයි.

හුදකලාවේ රසය සොයන්නෙකුට, නාවිකයන්ට මග කියන ''ප්‍රදීපාගාරයක්'' කදිම ස්ථානයකි. බොහෝ විට මනුෂ්‍ය වාසයෙන් වෙන් වූ නාවික මාර්ගයකට ලංව පිහිටන ප්‍රදීපාගාරය මතක සැමරුමක් කර ගැනීමට බොහෝ දෙනෙකු අභිරුචියක් දක්වයි.

පැරණි ලෝකයේ එක් පුදුමයක් වූයේ ද ඇලෙක්සැන්ඩ්‍රියාවේ පිහිටි ප්‍රදීපාගාරයයි. මහ සයුරේ ගමන් කරන නාවිකයන්ට ගොඩබිමක් පිළිබඳ සංඥාවක් ලැබෙන්නේ ප්‍රදීපාගාරයෙනි.

දූපතක් වූ අපේ රට, ප්‍රදීපාගාර හත අටකට හිමිකම් කියන නාවික කේන්ද්‍රයක් ලෙස අන්තර්ජාතික සමුද්‍රීය සේවා දර්ශකයන් හී ඉහලින්ම සිටී.

''ජගත් මහත්තයා....!! මම කාව්‍ය ... අපි දැන් ගාල්ලෙන් පිටත්වෙනවා... ''

''හරි..... හරි... කාව්‍ය මහත්තයා.... බේරුවලට ඇවිල්ලා කෝල් එකක් දෙන්න.''

අපේ නිල ඡායාරූප ලබා ගැනීමේ අනෙක් ස්ථානය වූයේ බේරුවල ප්‍රදීපාගාරයයි.

ඒ බේරුවල ප්‍රදීපාගාර පාලක (Light House Keeper) ජගත් මහතා සහ මා අතර ඇති වූ දුරකථන සංවාදයයි.

මම - මල්ලී ජගත් මහත්තයට දැන් කෝල් එකක් ගත්තා ද

රසික - (අපේ රියදුරු මහත්තයා) ගත්තා සර්... කියන්න අපි දැන් ඉන්නේ මරදානේ කියලා...

මම - මරදානෙ ... ?

රසික - ඔව් ... මේ බේරුවල මරදාන.

අපි කෙමෙන් බේරුවල මරදාන ධීවර වරායට පැමිණියෙමු. නිල් කැටයක් සේ මධ්‍යහ්න හිරු කිරනෙන් දිලිසෙන මහමුහුද මැද ඈත ඇස් පේනා මානයේ බේරුවල හෙවත් බාබේරියන් ප්‍රදීපාගාරය මහා ප්‍රෞඪ ලීලාවෙන් නැගී සිටින හැටි අපිට පෙනෙයි. මමත් අපේ ඡායාරූප ශිල්පී තෙන්නකෝන් මහතාත් වසන්ත මල්ලීත් රසික මල්ලීත් ඈත ප්‍රදීපාගාරය ඇති දූපත දෙස බලා සිටිමු.

ජගත් මහත්තයා...!! කාව්‍ය මහත්තයා පොඩ්ඩක් ඉන්න... බෝට්ටුවේ එන්ජිම පොඩ්ඩක් ලෙඩ දෙනවා ඉක්මනට ස්ටාට් කරගෙන එන්නම්....

ගතවූයේ සුළු වේලාවකි. ජගත් මහත්තයා ද ඔහුගේ සහයකයින් දෙදෙනා ද අප සිටි ස්ථානයට පැමිණියේ සිනහ පිරි මුහුණි නි. ජගත් මහතා මා මීට පෙර කිහිප වතාවක් මුණ ගැසී ඇති සොඳුරු මිනිසෙකි. ''කාව්‍ය මහත්තයලා එනවා කිව්වම අපිට සතුටුයි. අනෙක මීඩියා එකනේ.. නගින්න නගින්න... පරිස්සමෙන්...

ජගත් මහතා අපව බෝට්ටුවට නංවා ගත්තේ එලෙසිනි. ඔහුගේ සුහදශීලි

පිළිගැනීම අපිට ශක්තියක් විය.

මම - අපි මුහුදෙන් ගිහිල්ලා ගන්න තියන ෆොටෝ ටික ඉස්සර ගමු...

එයට කවුරුත් එකඟ විය. ඉතා නිසල මුහුදක් හා පැහැදිලි අහසක් තිබුණි. ඡායාරූප ශිල්පී තෙන්නකෝන් මහතාට හොඳ ඡායාරූප පෙළක් ගත හැකි විය.

අපේ බෝට්ටුව දූපත වටේම රවුමක් ගසා දූපත ගොඩ වන තොටුපලට පැමිණියේ ය. ඉතා ප්‍රවේශමෙන් අපි තොටුපලට ගොඩවුනෙමි.

''ජගත් මහත්තයලා හරිම වාසනාවන්තයි.'' ''පුදුම ලස්සන දූපතක්නේ...'' මම පැවසීමි. ඔව්.. එකත් ඇත්ත... අපි නම් දැන් අවුරුදු ගානක් මෙහෙම තමයි.


දූපතේ වෙරළේ සිට මුහුදු වැලි ඇතිරූ ගුරු පාරදිගේ තුරු ගොමු අතරින් දූපත ඉහළින් මහා ස්වේත කදම්භයක් සේ දිස්න දෙන ප්‍රදීපාගාරය වෙත ගමන් කළෙමු. හාත්පස වන වදුල පසුකොට පැමිණියේ මනා කොට සකසන ලද පිට්ටනියක් සේ යටිවියන සකසන ලද පොල් වත්තකටය. ඒ මැද පොල් ගස් අතරින් බේරුවල ප්‍රදීපාග ාරය අප ඉදිරියේ විය. යටත්විජිත සමයේ ඉදිකල මෙම ප්‍රදීපාගාරය දෙවැනි වන්නේ දෙවුන්දර ප්‍රදීපාගාරයේ උසට පමණි. වටපිටාව ඉතාම ආකර්ශණීය ය. ''ගෙ ට්ටුගෙදර් එකක් තියන්න කියාපු තැන'' මේක සංචාරක අඩවියක් කරලා වරායට අමතර ආදායමක් ලැබෙන විදියට දියුණු කරන්නත් පුළුවන්. මම කියනවිට ජගත් මහතා හිස වනා එය අනුමත කළේ ය. ජගත් මහතා ඇතුළු කණ්ඩායම ප්‍රදීපාගා-රය අලංකාරව හා ක්‍රමවත්ව තබා ගැනීමට විශාල මෙහෙයක් සිදු කරන බව කිවයුතුය. හාත්පස ඒ තරමටම අලංකාරවත් ය. පිරිසිදුය. ජගත් මහතාගේ සහයකයින් අපට කුරුම්බා සංග්‍රහයක් සූදානම්කොට තිබුණෙන් එයද භුක්ති වින්දෙමු.

අපි ප්‍රදීපාගාරය තුලට ගියෙමු. ප්‍රතාපවත් යෝධයෙකුගේ දියඹ අරා නැගී සිටින වීර ප්‍රසිද්ධ බාබේරියන් ලයිට් හවුස්'' හෙවත් බේරුවල ප්‍රදීපාගාරය තුළ ඇත්තේ පෞරාණික වටිනාකමකින් යුත් ආම්පන්න ය. ප්‍රදීපාගාරයේ රවුම් හැඩයට ඇති දොරක් ද නොයෙක් ගෘහ භාණ්ඩ හා උපකරණ කොටස් ද පෙන්වීමට ජගත් මහතා උත්සුක විය. (ප්‍රදීපාගාර පරිශ්‍රයේ නොයෙක් පැරණි උපකරණ තිබිණි. ජගත් මහතා ඒවා ද අපට පෙන්වීය) ප්‍රදීපාගාරයේ ඉහළට හාත්පස

36 පිටුවට











ඉපැරණි ගෘහ නිර්මාණ ශිල්පයේ මංසළකුණු....

# වරායේ ප්‍රසන්න පරිසරක් ගොඩනැංවීමට

ශ්‍රී ලංකාවේ වටිනාම ආර්ථික මධ්‍යස්ථානයක් වන කොළඹ වරාය ඉතා පිරිසිදු තැනක් බවට පත් කළ යුතු යැයි වරාය, නාවික කටයුතු, මාර්ග සහ මහාමාර්ග සංවර්ධන අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා පැවසුවේ වරාය විශේෂ නිරීක්ෂණ චාරිකාවකට එක්වෙමිනි.


වරාය පරිශ්‍රයේ තැනින් තැන අබලි ද්‍රව්‍ය නොතිබිය යුතු බවත් දැනට තිබෙන අබලි ද්‍රව්‍ය වහාම වරාය පරිශ්‍රයෙන් ඉවත්කල යුතු බවත් අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා එහිදි පැවසීය. විශේෂයෙන් විදෙස් සංචාරකයින් මගී නෞකා ඔස්සේ කොළඹ වරාය පරිශ්‍රයට පැමිණෙන බැවින් ඔවුන්ට මනස්කාන්ත පරිසරයටක් වරාය තුළ නිර්මානය විය යුතු බැව් ඇමතිතුමා මෙහිදී අවධාරණය කළේ ය.

තවද වරාය සේවක මහත්ම මහත්මීන්ට හා සේවාලාභීන් වරාය පරිශ්‍රයේ රැඳෙන කාලය තුළ අපහසුවකින් තොරව රැඳීමට හැකිවන පරිදි ප්‍රසුන්න පරිසරයක් ගොඩ නැගිය යුතු බැව් අමාත්‍යවරයා විසින් වැඩිදුරටත් අවධාරනය කරන ලදී.

හිටපු වරාය සංවර්ධන ගරු රාජ්‍ය අමාත්‍ය කනක හේරත් මහතා කොළඹ වරායේ විශේෂ නිරීක්ෂණයක නිරත වි ය. කොළඹ වරායේ වර්තමාන තත්ත්වය පිළිබඳ යාවත්කාලීන තොරතුරු දැන ගැනීමේ අරමුණෙන් එතුමා මෙම නිරීක්ෂණ චාරිකාවේ නිරත විය.

එහිදී කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය යටතේ ඉදිවූ දියකඩනය, නැගෙනහිර පර්යන්තය, නියමු මධ්‍යස්ථානය, ජයබහළු පාලන මැදිරිය යන ස්ථානයන් හිටපු අමාත්‍ය කනක හේරත් මහතාගේ විශේෂ අවධානයට යොමු විය.

එහිදී කොළඹ වරායේ ඉදිරි සංවර්ධන කටයුතු පිළිබඳ අතිරේක කළමණාකාර අධ්‍යක්ෂ උපාලි ද සොයිසා මහතා විසින් හිටපු අමාත්‍යවරයා වෙත කරුණු දක්වන ලදි.












## කොළඹ වරාය නැගෙනහිර පර්යන්තයේ වැඩකටයුතු ඇරඹීමට පියවර

කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තයේ කාර්යයන් කඩිනමින් ආරම්භ කිරීමට ඇති ප්‍රමාදය පිළිබඳව සහ එම පර්යන්තයේ වැඩ කඩිනමින් ආරම්භ කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳව වහාම වාර්තාවක් තමා වෙත ලබා දෙන ලෙස වරාය හා නාවික කටයුතු, මාර්ග හා මහාමාර්ග සංවර්ධන අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා අමාත්‍යාංශ නිලධාරින්ට නියෝග කරන ලදී.

වරාය හා නාවික අමාත්‍යාංශ නිලධාරින් සමග එම අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ දී පසුගියදා පැවති සාකච්ඡාවේ දී මෙතෙක් ප්‍රමාදව පැවති නැගෙනහිර බහලු පර්යන්තයේ සංවර්ධන කටයුතු වහාම ආරම්භ කළ යුතු බවත් එමගින් කොළඹ වරායේ මෙහෙයුම් ධාරිතාව ඉහළට නැංවිය යුතු බවත් අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කළේ ය.

වැඩිදුරටත් අදහස් දක්වූ අමාත්‍යවරයා, මෙම නැගෙනහිර පර්යන්තයේ වැඩකටයුතු ප්‍රමාදවීම හේතුවෙන් කොළඹ වරායට විශාල මෙහෙයුම් ධාරිතාවක් අහිමිවී ඇති බව ද පැවසීය.

2015 ට පෙර පැවති රජය නැගෙනහිර පර්යන්තයේ වැඩ ආරම්භ කිරීම සඳහා සියලු කටයුතු සැළසුම්කර තිබූ අතර රජය වෙනස්වීමත් සමග තීන්දු තීරණ ගැනීමේ ප්‍රමාදයක් හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු ඇණහිටි බැව් මෙහිදී නිලධාරින් විසින් ප්‍රකාශ කරන ලදී.

කොළඹ වරායේ මෙහෙයුම් ධාරිතාව වැඩි කිරීම සඳහා නැගෙනහිර පර්යන්තයේ කටයුතු කඩිනමින් ආරම්භ කරන ලෙසට වරාය වෘත්තීය සමිති සහ විවිධ පාර්ශවයන් කාලාන්තරයක් තිස්සේ කරන ලද ඉල්ලීම්වලට කඩිනමින් අවධානය යොමු කරමින් අමාත්‍යවරයා විසින් මෙම සාකච්ඡාව පවත්වන ලදී.

# ඇමතිවරු හා සභාපතිතුමා පෙරමුණ ගනී













# කොවිඩ් -19 මර්ධනය වෙනුවෙන් වූ
# ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මාර්ගෝපදේශය එළිදකියි







වරායේ මෙහෙයුම් සඳහා සම්බන්ධ වන සියළුම දෙනාගේ ආරක්ෂාව තහවුරු කරමින් එම මෙහෙයුම් කාර්යක්ෂමව සහ ඵලදායිතාවයෙන් යුතුව අඛණ්ඩව පවත්වා ගැනීමේ අරමුණින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සකස් කරනු ලැබූ කොවිඩ්-19 වසංගතය මර්ධනය සඳහා වූ මාර්ගෝපදේශය පසුගිය දා එළි දක්වනු ලැබීය. එය, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ගරු සභාපති ජෙනරාල් දයා රත්නායක මහතාගේ ප්‍රධානත්වයෙන් මහපොළ වරාය සහ සමුද්‍රීය විද්‍යායතනයේ දී සිදු වි ය.

එහිදී, මේ වන විට ශ්‍රී ලංකාව තුළ සාර්ථකව මැඩපවත්වා ගැනීමට හැකි වී ඇති කොවිඩ්-19 වසංගතය මර්ධනය පිළිබඳව ගරු සභාපති ජෙනරාල් රත්නායක මහතා අදහස් ප්‍රකාශ කරනු ලැබී ය.

මෙම වෛසරය පැතිරීම ආරම්භ වූ අවධියේ සිට ම එනම්, එය ශ්‍රී ලංකාවට පැමිණීමටත් පෙර අති ගරු ජනාධිපතිතුමා විසින් මෙහි ඇති බරපතළකම නිවැරදිව හඳුනා ගනු ලැබුවා. ඉන් පසු රට තුළ වෛරසයේ ව්‍යාප්තිය ආරම්භවීමත් සමග වඩාත් නිවැරදි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට හැකිවුණා. මේ නිසා අපට රටක් හැටියට ඉතාම ආඩම්බර වෙන්න පුළුවන් තත්ත්වයක් මේ වන විට නිර්මාණය වෙලා තියෙනවා. එහෙත්, මෙම වසංගතය විසින් ලබා දී ඇති අභියෝග තව දුරටත් පවතිනවා. එම අභියෝග ජයගැනීම ට අපි සියළු දෙනාගේ ම සහයෝගය ඉතාම වැදගත් වෙනවා. මේක තනි පුද්ගලයෙකුට හෝ එක් කණ්ඩායමකට පමණක් කිරීමට හැකි දෙයක් නෙමෙයි. මෙය අපි සියල්ලන්ට ම එක හා සමාන වගකීමක් පැවරෙන ක්‍රියාවලියක් බැව් ජෙනරාල් රත්නායක මහතා සඳහන් කළේ ය.

''වරාය කියන්නේ ජාතියේ හදවත. මේක රැකුනොත් තමයි රට රැකෙන්නේ. වරායේ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා වූ වැඩපිළවෙල කඩිනම් කිරීම අත්‍යවශ්‍යයි. මෙම වසංගත තත්ත්වය නිසා ලැබුණු අභියෝග වගේ ම අවස්ථාත් රාශියක් අපට තියෙනවා. එම අවස්ථා ලබාගැනීම සඳහා අපි එකතුවෙලා ඉතාම අවංක කැපවීමෙන් කටයුතු කළ යුතුයි. ඒ සඳහා මා සියලු දෙනාගේම සහයෝගය බලාපොරොත්තු වෙනවා, එහිදී ඔහු වැඩිදුරටත් පැවසී ය.

ඉන් පසුව සභාව ඇමතූ අතිරේක කළමණාකාර අධ්‍යක්ෂක උපාලි ද සොයිසා මහතා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් එළිදක්වනු ලැබූ කොවිඩ්-19 වසංගතය තුරන් කිරීමේ මාර්ගෝපදේශය ගැන කෙටි පැහැදිලි කිරීමක් කළේ ය.

මෙම මාර්ගෝපදේශ මාලාව පිළිපැදීමෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ වරායේ මෙහෙයුම් වලට සම්බන්ධ සියළුම දෙනාගේ සෞඛ්‍ය ආරක්ෂාව තහවුරු කිරීම අපේ ප්‍රධාන අරමුණයි. එසේ ම වරායේ මෙහෙයුම් කාර්යක්ෂමව සහ ඵලදායිතාවයෙන් යුතුව අඛණ්ඩව පවත්වා ගැනීමට මෙමගින් පිටිවහලක් ලැබෙනවා", සොයිසා මහතා ප්‍රකාශ කළේ ය.

ඉන් අනතුරුව, කොවිඩ්-19 වසංගතය තුරන් කිරීමේ මාර්ගෝපදේශයේ පළමු පිටපත ගරු සභාපති ජෙනරාල් දයා රත්නායක මහතාට පිළිගන්වනු ලැබී ය. අතිරේක කළමණාකාර අධ්‍යක්ෂක උපාලි ද සොයිසා මහතාගේ ප්‍රධානත්වයෙන් යුතු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවය කරන නිලධාරී මහත්ම මහත්මීන් කණ්ඩාමක් විසින් ඉහළ කළමණාකාරිත්වයේ සහ කොට්ඨාශ ප්‍රධානීන්ගේ මෙන්ම සේවක මහත්ම මහත්මීන්ගේ උපදෙස් සහ යෝජනා අනුව මෙම මාර්ගෝපදේශය සකස් කරනු ලැබී ය.

---

09 පිටුවෙන්

## වරාය පරිශ්‍රයේ කොරෝනා....

ඒ සඳහා සංගීත වැඩසටහන් රසවිදීමේ පහසුකම් සලසාලමින් නිරතුරුවම සේවක මහතුන් ධනාත්මක ආකල්පයන් වෙත යොමු කිරීමට, ඔවුන් දිරිමත් කිරීමට කළමණාකාරිත්වය සෑම මොහොතකම කටයුතු කළා.

**රංගල නාවික හමුදා කඳවුර තුළ කොවිඩ් -19 පැතිරී ඇති බවට කසු කුසු පැතිරුණු මොහොතේ කෙසේද ඒ සඳහා ක්‍රියාත්මක වූයේ...?**

ඔව්. නාවික හමුදාවේ රණවිරුවන් අතර කොවිඩ් වෛරසය ආසාදනය වීමේ ප්‍රවණතාවයක් ඇති බවට තොරතුරු අනාවරණය වීමත් සමග සැකකටයුතු නාවික හමුදා සේවක මහතුන් නැගෙනහිර පර්යන්තයේ සියලු පහසුකම් සහිත නේවාසිකාගාරයක හුදෙකලා කොට නිරෝධායන ක්‍රමෝපයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු සම්පාදනය කළා. ඒවගේම වරාය ප්‍රවේශ දොරටුවල සේවා සැපයූ නාවික නිලයන් එම කටයුතු වලින් නිදහස් කිරීමටත් පියවර ගනු ලැබුවා.

**වරායට සුවිශේෂී වූ මර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳවත් කතා කරමු...?**

ජාතියේ හදවත බඳු වූ වරාය කිසි ලෙසකින් අඩාල නොකොට අඛණ්ඩව පවත්වාගෙන යාමට කළමණාකාරිත්වයට අවශ්‍ය වුණා. කොවිඩ් 19 මාර්ගෝපදේශ සංග්‍රහය බිහි වන්නේ මේ පදනම තුළයි. සෞඛ්‍ය අමාත්‍යංශයේ අපදෙස් මාලාව පදනම් කරගෙන වරායට සුවිශේෂී වූ ලෙසින් මෙම මාර්ගෝපදේශ සංග්‍රහය සම්පාදනය කිරීමට හැකිවීම මේ මොහොතේ වරාය අධිකාරිය ලැබූ ජයග්‍රහණයක් ලෙස සැලකීමට මා කැමතියි. එම මාර්ගෝපදේශ සංග්‍රහයේ නියාමනයන්ට අනුකූලව අද දවසේ වරායේ මෙම සෞඛ්‍යාරක්ෂක ක්‍රමවේදයන් ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන්ම මේ වනවිට වරාය සේවක මහතුන් PCR පරීක්ෂණ වලට යොමුකර එම රෝග ව්‍යාප්තිය පාලනයට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනවා.

**බාහිර පාර්ශවයන් වරාය වෙත පැමිණීම අවම කිරීමට ගත් ක්‍රියාමාර්ග මොනවාද..?**

පසුගිය පෙබරවාරි මාසයේ අවසානයේ හා මාර්තු මුල් වකවානුව තුළ කොළඹ වරායට පැමිණී මගී නෞකා මගීන් හට කොළඹ වරායට ගොඩ බැසීමට අවශ්‍ය පහසුකම් සලසා දුන්නා. ඒ සඳහා ආගමන විගමන දෙපාර්තමේන්තුවේ සහයෙන් එම සංචාරක මගීන්ගේ සෞඛ්‍ය වාර්තා ලබාගෙන එය සතුටුදායක නම් පමණක් ඔවුන් ගොඩ බැස්වීමට පියවර ගත්තා. කිසියම් මගියෙකු උණ රෝගයෙන් පෙළේ නම් ඔවුන්ට නිසි ක්‍රමවේද ඔස්සේ සෞඛ්‍ය පහසුකම් ලබා දී වෙන්කර තැබීමට පියවර ගත්තා. නමුත් මෙම රෝගී තත්ත්වය ව්‍යාප්ත වීමත් සමග සංචාරක මගී නෞකාවල පැමිණෙන සංචාරකයින් කොළඹ වරායට ගොඩ බැසීම මුළුමනින්ම නවතා දැමුවා. මගී නෞකාවලට අවශ්‍ය සේවා පමණක් සම්පාදනයට පියවර ගත්තා.

**කොරෝනා සමගින් වරායේ හෙට දවස...?**

සේවක මහත්ම මහත්මීන් නිසි ක්‍රමවේදයන් ඔස්සේ සෞඛ්‍යාරක්ෂිතව උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව සේවයේ යෙදවීමට ගරු සභාපතිතුමා ප්‍රමුඛ වරාය කළමණාකාරිත්වය නිරන්තරයෙන් කටයුතු කරනවා. මෙහිදී සේවක මහත්ම මහත්මීන් ආයතනයේ දියුණුවට ලබාදුන් අනුපමේය දායකත්වය පිළිබඳවත් කළමණාකාරිත්වය වෙනුවෙන් මම ස්තුතිවන්ත වෙනවා. ඔවුන් බොහෝම හොඳින් කණ්ඩායම් හැගීමෙන් යුතුව කටයුතු කරමින් සිටීම අගය කළ යුතුමයි. ඒ හැරුණුකොට සුපුරුදු පරිදි කෙටි කාලීන, මධ්‍ය කාලීන, දිගු කාලීන සැලසුම් ක්‍රියාවට නැංවීම සඳහා කටයුතු කරමින් සිටිනවා.

ඒ වගේම මාර්ගෝපදේශයේ දැක්වෙන පරිදි සෞඛ්‍යාරක්ෂිත වෙමින් අවශ්‍ය දුරස්ථ භාවය රැකගෙන එදිනෙකා රාජකාරි කටයුතු පවත්වා ගැනීමට අවශ්‍ය සේවක පිරිස සම්බන්ධ කර ගනිමින් වරායේ ක්‍රියාකාරිත්වය ප්‍රශස්ත ලෙස පවත්වා ගැනීමට අප බලාපොරොත්තු වෙනවා.

## ශ්‍රී ලංකා වරාය අධිකාරියට අභිමානවත් සේවාවක් ඉටු කළ
# විශ්‍රාමික සේවක මහත්ම මහත්මීන් රනින් ඇගැයේ








ශ්‍රී ලංකා වරාය අධිකාරියට අභිමානවත් සේවාවක් ඉටුකර, සේවයෙන් විශ්‍රාම ලැබූ සේවක මහත්ම මහත්මීන් අගයමින් රන් තිළිණ ප්‍රදානය කිරීමේ උත්සවය උත්කර්ෂවත් ලෙසින් පැවැත්විණි.

පසුගිය දා අරලියගහ මන්දිර පරිශ්‍රයේ පැවැත්වූ මෙම රන් තිළිණ ප්‍රදානෝත්සවය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරුණි.

වරාය හා නාවික ගරු අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු, වරාය සංවර්ධන හිටපු ගරු රාජ්‍ය අමාත්‍ය කණක හේරත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ජෙනරල් දයා රත්නායක යන මහත්වරුන්ගේ සහභාගීත්වයෙන් මෙම රන් තිළිණ ප්‍රදානෝත්සවය පැවැත්විණි.







මෙහිදී උත්සව සභාව ඇමතු වරාය, නාවික හා මහාමාර්ග ගරු අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා ශ්‍රී ලංකා වරාය අධිකාරියට අභිමානවත් සේවාවක් ඉටුකර, සේවයෙන් විශ්‍රාම ලැබූ සේවක ඔබ සැම අගයමින් අරලියගහ මන්දිරයේ දී ''රන් තිළිණ'' ප්‍රදානයට එක්වීම සැබවින්ම සතුටට කාරණාවක් බවත්, තමා විශ්වාස කරන පරිදි සේවා කාලයේ දී එක් වරකදී පමණක් පිරිනමනු ලබන මෙම රන් තිළිණ ප්‍රදානයට සුදුසුකම් ලැබූ ඔබ සියලු දෙනාම ඉතාම වාසනාවන්ත බවත් පැවැසී ය. වැඩිදුරටත් අදහස් දැක්වූ අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා, පසුගිය කාලයේ දී වරාය සම්බන්ධයෙන් ගත් තීන්දු තීරණ ඉතා අයහපත් ලෙසින් වරාය සංවර්ධනයට බලපා ඇති බවත්, එබැවින්, වරාය සම්බන්ධ තීන්දු තීරණ ගැනීමේ දී වරායට, එහි සේවක මහත්ම මහත්මීන්හට, සමස්ත රටට ඉතාමත් ඵලදායි වූ තීරණ මත හිඳ කටයුතු කිරීමට තමා ඇප කැප වෙන බැව් පැවසී ය. ඒ සඳහා අතිගරු ජනාධිපතිතුමාගේත්, ගරු අගමැතිතුමාගේත්, පූර්ණ සහයෝගය ලැබීම තමා ලැබූ භාග්‍යක් බවද අවධාරණය කළේ ය.

මෙම රන් තිළිණ ප්‍රදානෝත්සවයේ දී සිය අදහස් දක්වූ හිටපු වරාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය කණක හේරත් මහතා වරායේ දියුණුවට අතහිත දුන් සියළු නායකයින් මේ මොහොතේ අගය කළ යුතු බවත්, මෙය වරාය අධිකාරියේ සමස්ත සේවක මහත්ම මහත්මීන් ම ලබන ගෞරවයක් ලෙසට තමා අගයන බවත්, තම සේවා ආයතනය වූ වරාය අධිකාරිය වෙනුවෙන් අනුපමේය සේවාවක් ඉටුකළ සේවක මහත්ම මහත්මීන්ට පමණක් නොව ඔවුන්ගේ දුවා දරුවන්ට ද මෙය අති ගෞරවණීය අවස්ථාවක් බැව් පැවසීය. එමෙන්ම, මේ අවස්ථාව වරාය සිය මානව සම්පත අභිප්‍රේරණයට ගත් විශිෂ්ට ක්‍රියාමාර්ගයක් ලෙසට සලකන බැව් වැඩිදුරටත් කරුණු දක්වමින් පැවසීය.

මෙහිදී අදහස් දැක්වූ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ජෙනරල් දයා රත්නායක මහතා, සිය සේවය ඉටු කළ ආයතනය තමාව රනින් ඇගැයීම තුළ ඔබ වාරයේ දියුණුව, කාර්යක්ෂමතාව අභිවෘද්ධිය නංවාලීමට ඇප කැප වූ සේවක මහත්මයෙකු, මහත්මියක ලෙසින් සැබවින්ම ඔබට සතුටු විය හැකි බවත්, එය ඔබට පමණක් නොව ඔබේ දුවා දරුවන්ටත් ආඩම්බර වීමට කරුණක් බැව් පැවසීය. වරාය සංවර්ධනය පිළිබඳව අදහස් දක්වූ සභාපතිවරයා මේ වන විට වරායේ ධාරිතාව උපරිම මට්ටම කරා පැමිණ තිබෙන බවත්, ඒ නිසා ඉදිරියේ දී නැගෙනහිර පර්යන්තය පිළිබඳ හොඳ ස්ථාවරයකට පැමිණිය හැකියැයි තමා විශ්වාශ කරන බැව් පැවසීය. පසුගිය කාලයේ සිදු වූ අදූරදර්ශී ක්‍රියා කලාපයන් පසෙකලා වරායේ සියලු ක්ෂේත්‍ර ගොඩනැංවීමට වේගවත්ව ක්‍රියාත්මක වීමට අපට සිදුවෙන බවත්, ඒ සඳහා සියලු සේවක මහත්ම මහත්මීන්ගේ කැපවීම ඉතා වැදගත් බැව් පැවසී ය.

සේවා කාලයේ දී එක් වරකදී පමණක් පිරිනමනු ලබන මෙම රන් තිළිණ ප්‍රදානය ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙනුවෙන් අනුපමේය සේවාවක් ඉටුකළ සේවක මහත්ම මහත්මීන් ඇගැයීමට ලක් කිරීමකි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවා කාලය වසර 15 ක් හෝ ඊට වැඩි සහ වසර 25 ට අඩු, සේවා කාලය වසර 25 ක් හෝ ඊට

26 පිටුවට

































# නැගෙනහිර පර්යන්තය පිළිබඳ කිසිසේත් බිය විය යුතු නෑ...

## සංජය කුමාර වැලිගම - සභාපති - වාණිජ කර්මාන්ත හා සේවා ප්‍රගතිශීලී සේවක සංගමය -වරාය

සටහන - උපුල් ගුරුගේ

ශ්‍රී ලංකා වරාය අධිකාරිය නැගෙනහිර පර්යන්තය සම්බන්ධ සත්‍යමය තොරතුරු අනාවරණය කිරීමේ අරමුණින් ප්‍රබල වෘත්තීය සංගම් කිහිපයක නිලධාරීන්ගේ මාධ්‍ය හමුවක් කොළඹ වරාය වාණිජ කර්මාන්ත හා සේවා ප්‍රගතිශීලී සේවක සංගම් පරිශ්‍රයේ දී 2020 පෙබරවාරි 19 වැනි දින පැවැත්විණි.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය වාණිජ කර්මාන්ත හා සේවා ප්‍රගතිශීලී සේවක සංගමය, ඉංජිනේරු සංගමය, විධායක නිලධාරීන්ගේ සංගමය, කාර්මික නිලධාරීන්ගේ සංගමය, කාර්මික පරිපාලක සංගමය, සහකාර ගබඩා භාරකරුවන්ගේ සංගමය, සමස්ථ ගබඩාකරුවන්ගේ සංගමය නියෝජනය කරමින්, නිලධාරී මහත්වරුන් රැසක් මෙම අවස්ථාවට එක් වී ය.

මෙම මාධ්‍ය හමුවේ දී අදහස් දැක් වූ වාණිජ කර්මාන්ත හා සේවා ප්‍රගතිශීලී සේවක සංගමයේ ලේකම් ශ්‍යාමාල් සුමනරත්න මහතා, වරායේ වැඩිම සේවක පිරිසක් සම්බන්ධ වෘත්තීය සමිතිය ලෙසින් නැගෙනහිර පර්යන්තයේ හෙට දවස සුරක්ෂිත කර ගැනීම උදෙසා තම සංගමය නිරන්තරයේ කැප වන බවත්, විධායක නිලධාරීන්ගේ සංගමය, ඉංජිනේරු සංගමය ඇතුළු ප්‍රබල සංගම් වාණිජ කර්මාන්ත හා සේවා ප්‍රගතිශීලී සේවක සංගමය සමග එක්ව සිටීම පිළිබඳ තමා බෙහෙවින් සතුට ට පත්වන බවත් පැවසී ය. තව ද, දුර දක්නා නුවනකින් හෙබි වරාය හා නාවික කටයුතු, මාර්ග හා මහාමාර්ග ගරු අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු, වරාය සංවර්ධන ගරු රාජ්‍ය අමාත්‍ය කනක හේරත් යන අමාත්‍යවරුන්ගේ මග පෙන්වීම හා සභාපති ජෙනරල් දයා රත්නායක මහතාගේ සභාපතිත්වය වරාය අධිකාරියට ලැබීම සමස්ථ සේවක ප්‍රජාවගේ ම යහපතට හේතු වන්නක් බවත් පැවසී ය. තව ද 2014 වන විට ECT පර්යන්තය සඳහා මිල දී ගැනීමට සැලසුම් කර තිබූ ලුන්ට් දොඹකර ගෙන්වීම අවලංගු කිරීමට අමාත්‍ය අර්ජුන රණතුංග ගත් අදූරදර්ශී තීරණය හේතුවෙන් වරායට ඩොලර් මිලියන බිලියන ගණනක පාඩුවක් සිදු වී ඇති බැව් අනාවරණය කළේ ය. එම තත්ත්වය නිවැරදි කරමින් වත්මන් පාලනාධිකාරිය විසින් නැගෙනහිර පර්යන්තයේ මෙහෙයුම් ආරම්භ කිරීමට කටයුතු කිරීම වරාය සේවක මහත්ම මහත්මීන්ගේ හෙට දවස සුරක්ෂිත කිරීමක් බැව් පැවසී ය.





වැඩිදුරටත් කරුණු දැක් වූ ශ්‍යාමාල් මහතා අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ රජය යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය නැගෙනහිර පර්යන්තය පිළිබඳ කිසිසේත් බිය විය යුතු නොමැති බවත්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය මේ වන විටත් කිසිදු රජයක් සමග මේ සම්බන්ධයෙන් ගිවිසුම් ගත වී නොමැති බවත් පැවසී ය.

මෙහි දී අදහස් දැක්වූ වාණිජ කර්මාන්ත හා සේවා ප්‍රගතිශීලී සේවක සංගමයේ සභාපති සංජය කුමාර වැලිගම මහතා, තම වෘත්තීය සේවක සංගමය විසින් පසුගිය දිනෙක ගරු අගමැති මහින්ද රාජපක්ෂ මහතා හමු වූ මොහොතේ නැගෙනහිර පර්යන්තය වරාය අධිකාරිය යටතේ මෙහෙයුම් කිරීමට කටයුතු කරන බවට පොරොන්දුවක් දුන් බවත්, එබැවින් නැගෙනහිර පර්යන්තය පිළිබඳ කිසිසේත් බිය නොවිය යුතු බවත්, පසුගිය පාලනාධිකාරිය විසින් ජය බහලු පර්යන්තයේ මේ වන විටත් සංකල්පයකට සීමා වූ අදියර V අංගනය සඳහා ගෙන්වීමට ඉල්ලුම් කර ඇති දොඹකර, නැගෙනහිර පර්යන්තය සඳහා යොදා ගැනීමට වත්මන් පාලනාධිකාරිය කටයුතු කිරීම සමස්ථ වරාය අධිකාරියේ ම භාග්‍යයක් බවත් අවධාරණය කළේ ය.

මෙහි දී අදහස් දැක් වූ ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඉංජිනේරු සංගමයේ සභාපති ආර්.පී.ආර්. ක්‍රිෂාන්ත මහතා, ශ්‍රී ලාංකේය අර්ථ ක්‍රමය ට වැඩිම ආදායමක් එක් කරනා ආයතනය ලෙසින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය යන ගමන අඩාල කිරීමට කිසිසේත් තම සංගමය ඉඩ නොදෙන බවත්, ඉංජිනේරු වෘත්තීය සමිතිය ලෙසින් හම්බන්තොට වරාය බේරා ගැනීමට ද උද්ඝෝෂණ කළ බවත්, එවක පාලනාධිකාරියේ අයහපත් ක්‍රියාකාරීත්වය තුළින් මේ දේශයේ සම්පතක් අහිමි වීම සමස්ථ ජාතියට ම සිදු වූ පාඩුවක් බවත් අවධාරණය කළේ ය. එබැවින් නැගෙනහිර පර්යන්තය සම්බන්ධයෙන් මෙලෙස වරායේ පිළිගත් වෘත්තීය සංගම් සමග තම සංගමය එකතු වූ බවත් පැවසී ය.

මෙම අවස්ථාවට විධායක නිලධාරීන්ගේ සංගමයේ සභාපති ඩබ්. සෙනවිරත්න, ලේකම් සමන් පෙරේරා, ඉංජිනේරු සංගමයේ කමිටු සාමාජික එම්.එම්.එස්.ආර්. සිල්වා, කාර්මික නිලධාරීන්ගේ සංගමයේ සභාපති ඩබ්ලිව්.එච්.එස්. වීරවර්ධන, භාණ්ඩාගාරික එල්.පී.එස්.එල්. සේනාරත්න, කාර්මික පරිපාලක සංගමයේ සභාපති ජේ.එන්. ප්‍රියදර්ශන, ලේකම් ටී.කේ. රුබේරු යන මහත්වරුන් එක් වූ හ.

> "නැගෙනහිර පර්යන්තය පිළිබඳ කිසිසේත් බිය නොවිය යුතු බවත්, පසුගිය පාලනාධිකාරිය විසින් ජය බහලු පර්යන්තයේ මේ වන විටත් සංකල්පයකට සීමා වූ අදියර V අංගනය සඳහා ගෙන්වීමට ඉල්ලුම් කර ඇති දොඹකර, නැගෙනහිර පර්යන්තය සඳහා යොදා ගැනීමට වත්මන් පාලනාධිකාරිය කටයුතු කිරීම සමස්ථ වරාය අධිකාරියේ ම භාග්‍යයක්"



# ජාතික බෝවන රෝග විද්‍යායතනයට
# නව හෙද නේවාසිකාගාරයක්





අංගොඩ පිහිටි ජාතික බෝවන රෝග විද්‍යායතනයේ සේවයේ යෙදෙමින් කොවිඩ් 19 වසංගතය මර්දනය කිරීමේ කාර්යයේ නිරත වී සිටින හෙද සේවිකාවන්ගේ නවාතැන් පහසුකම් වැඩි දියුණු කිරීමේ අරමුණින් ඉදිකළ නව හෙද නේවාසිකාගාරය සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා ගරු අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මැතිණිය මැයි මස අටවැනිදා විසින් විවෘත කරනු ලැබුවා ය.

කොවිඩ් 19 දරුණු ගෝලීය වසංගතය ශ්‍රී ලංකාවේ ද ආසාදනය වෙමින් පවතින ආවස්ථාවේ ඊට මුහුණ දීම පිණිස අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් පිහිටවනු ලැබූ කොවිඩ් 19 වසංගත පාළන කාර්ය සාධක බලකාගේ රැස්වීමක දී අංගොඩ බෝවන රෝග විද්‍යයතනය වෙත හෙද නේවාසිකාගාරයක අවශ්‍යතාව මතු වූ මොහොතේ ඒ සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීමට එම බලකායේ සමාජික හිටපු යුධ හමුදාපති, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ජෙනරාල් දයා රත්නායක මහතා පූර්ණ ලෙස මැදිහත් විය.

ඔහුගේ මැදිහත්වීමෙන් ඇමරිකා එක්සත් ජනපදයේ පිහිටි කොළඹ රාජකීය විද්‍යාලයීය ආදි ශිෂ්‍යන්ගේ ඊස්ට් කෝස්ට් පදනමේ ලේකම් සේනක සෙනවිරත්න මහතාගේ සම්බන්ධීකරණයෙන්, එම සංගමයේ සභාපති වෛද්‍ය සුකුමාර් නාගේන්ද්‍රන් මහතාගේ රුපියල් මිලියන 15ක මූල්‍ය ප්‍රදානයෙන් මෙම අංග සම්පූර්ණ හෙද නේවාසිකාගරය ඉදිකිරීමට හැකි වි ය.

විවෘත කිරීමේ උළෙලට සහභාගී වෙමින් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා ගරු අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මැතිණිය සඳහන් කළේ, ජාතික බෝවන රෝග විද්‍යායතනය රටට ඇති ජාතික සම්පතක් බවයි.

ඉන් පසු, ශ්‍රී ලංකාව වරාය අධිකාරියේ සභාපති ජෙනරාල් දයා රත්නායක මහතා උත්සව සභාව අමතමින් වත්මන් ජනාධිපතිතුමාගේ නිවැරදි නායකත්වය සහ නියමිත කාලයට ගන්නා තීන්දු තීරණ නිසා අපි රටක් ලෙස මෙම වසංගතයට එරෙහිව කටයුතු කිරීමේ දී ඉතාම හොඳින් මුහුණ දෙමින් සිටිනවා. එසේම, වෛද්‍යය සුකුමාර් මහතා ඇතුළු මීට දායක වූ සියලුම දෙනාගේ දායකත්වයෙන් මෙම ව්‍යාපෘතිය මේ අකාරයෙන් සම්පූර්ණ කිරීමට ලැබීම ගැන මා ආඩම්බර වෙනවා. අනාගතයේදී මීට වඩා විශාල ව්‍යාපෘතියක් සඳහා අවශ්‍යය සැලසුම් මේවන විටත් අපි සකස්කොට තිබෙන බැව් පැවසී ය.

වර්ග අඩි 3300ක බිම් ප්‍රමාණයකින් යුක්තව, කාමර 16කින් යුක්තව ඉදිකරන ලද මෙහි හෙද නිළධාරීන් තිස් දෙදෙනෙකුට (32) නේවාසික පහසුකම් සැලසේ. එමෙන් ම මෙම නේවාසිකාගාරය සඳහා අවශ්‍ය සියළු ම ගෘහභාණ්ඩ සහ අනෙකුත් පහසුකම් සියල්ල සපයා ඇති අතර, මෙම නේවාසිකාගාරය භාර දුන් මොහොතේ පටන් එය භාවිතා කිරීමේ හැකියාව හෙද නිළධාරීන්ට තිබේ. මෙම ව්‍යාපෘතිය සඳහා සම්බන්ධීකරණ සහ තාක්ෂණික සහය සපයනු ලැබුවේ ශ්‍රී ලංකා වරාය අධිකාරියයි.

# වරාය පරිශ්‍රයන්හි නව කොරෝනා වෛරසය පැතිරීම වැළැක්වීමට පියවර







කොළඹ වරාය මගී පර්යන්තය වෙත පැමිණෙන සංචාරක මගී නෞකාවන්ගෙන් මෙරට පැමිණෙන සංචාරකයින්ගේ සෞඛ්‍ය පහසුකම් නංවාලීමේ විශේෂ වැඩපිළිවෙල නිරීක්ෂණය කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සභාපති ජෙනරල් දයා රත්නායක මහතා පසුගිය දා එක්විය.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ජෙනරල් දයා රත්නායක මහතාගේ උපදෙස් මත ක්‍රියාවට නැංවෙන මෙම විශේෂ වැඩසටහන තුළින් සංචාරකයින්, නිසි ලෙසින් වෛද්‍ය පරීක්ෂාවට ලක් කරමින්, රෝගී තත්වයන් හැඳින ගැනීමත් හා කිසිදු අයුරකින් සංචාරකයින් අපහසුතාවයට පත් නොකර වෛද්‍ය පරීක්ෂණ වෙත යොමු කෙරේ. නෞකාවන්ගේ ආසාධිත හෝ ආසාධිත බවට සැක කෙරෙන හා උණ රෝගීන් වේනම් ඔවුන් පරීක්ෂා කිරීමට හා හුදෙකලා කර නිසි ප්‍රතිකාර ලබා දීමට ද, සෞඛ්‍යාරක්ෂිතව හා ප්‍රවේශම් සහගත ලෙස නිර්දේශිත රෝහල් කරා යෑමට අවශ්‍ය සියලු පහසුකම් සම්පාදනයට ද විශේෂ අවධානය යොමු කරන ලෙස සභාපති දයා රත්නායක මහතා විසින් අදාල සියලු පාර්ශවයන් වෙත දන්වන ලදී. ඒ අනුව, මේ සඳහා කොළඹ වරාය පරිශ්‍රයේ මගී පර්යන්තය තුළ විශේෂිත කුටියක් ඉදිකර ඇති අතර, එහි නිරීක්ෂණ කටයුතු ද සභාපතිතුමාගේ නිරීක්ෂණයට ලක් වී ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිරෝධායන වැඩසටහන් අධ්‍යක්ෂ වෛද්‍ය එස්.එම්.ආනල්ඩ් මහතාගේ සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ රොෂාන් සම්පත් මහතාගේ පූර්ණ දායකත්වයෙන් සිදුකරනු ලබන මෙම නිරෝධායන වැඩසටහන ඉතා සාර්ථකව පැවැත්වෙන අතර, කොළඹ වරායට පැමිණෙන සියලු මගී නෞකාවන් දැඩි පරීක්ෂාවට ලක් කෙරේ.

මගී නෞකාවන්ගේ පැමිණෙන සංචාරකයින් හා එම නෞකාවල සේවක මහත්ම මහත්මීන්ගේ වෛද්‍ය වාර්තා නෞකාවේ කපිතාන්වරුන් මගින් ලබා ගෙන පරීක්ෂා කිරීමත් මෙහිදී සිදුවේ.

36 පිටුවට




# නොනිදා සේවයට කැප වන
# ගිනි නිවන අංශය

සටහන -නිරංජලා මීගහකුඹුර

**සයුරද ගොඩබිමද නැත දිවියට ආසා සිව්විසි පැයම එකමුතු වී කර සේවා**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය මඟින් ක්‍රියාත්මක වන ගිනි නිවීමේ ඒකකය තම සේවා කාලය තුළ උපරිම සේවාවක් දායාද කරන්නට කැප වන ආයතනයකි.තම අමිල මෙහෙවර දින,සති,පැය වලින් එතෙරට තබමින් සමාජ මෙහෙවරට දත් බැඳගත් මිනිසුන්ගෙන් අතොරක් නැති ඒකකයක් බව ආයතන වපසරිය අධ්‍යයනයෙන්ම පැහැදිලි වේ.

ආයතන ඉතිහාස පුරාවෘත සොයා යන ගමනේදී, පැය 24 පුරාවටම නොනිමි සේවයක යෙදෙන හදිසි අවස්ථාවකදී පමණක් නොව, සේවය අවශ්‍යතාවය මත පදනම් ව සේවයේ නියුතු, ජනතාවගේ මුරදේවතාවකු යැයි නම් පට බැඳීමකට සුදුසු පිරිසක් වෙසෙන ඒකකයකැයි කියූ විට නිවැරදිය. ගිනි නිවීම යන්න ඇසූ සැණින් ගිනි නිවීමම පමණක් අප සිතට දනුණද, ඊට සමගාමීව හදිසි අවස්ථාවන්ද ආවරණය කරන ඒකකයකි. හදිසි අවස්ථා ලෙසට, සමුද්‍ර දූෂණය වැළැක්වීමේ කටයුතු, ජීවිත බේරා ගැනීම යනාදී කටයුතු ද මෙම ඒකකය මඟින් සිදු කරනු ලබයි.

මුල් කාලයේ ස්වේච්ඡා ගිනි නිවීමේ සේවයක් පැවතුණු අතර, වරායේ ගිනි නිවීම් සම්බන්ධ කටයුතු මෙම අංශය හරහා සිදු කර ඇත. ස්වේච්ඡා ගිනි නිවීමේ ඒකකයේ පැවති භාණ්ඩ ලෙස සටහන් කරමින් අදටත් පරිස්සම් සහගතව තිබෙන ආකාරය දකිය හැකිය. 1983 දී, මෙම ඒකකයට ගිනි නිවන යාත්‍රාවක් ගෙන්වන ලදී. මෙහි පළමු පාලක ධූරය මුසාෆර් මහතාට හිමිවන අතර, එතුමා භාවිත කළ විවිධ භාණ්ඩ නව්‍ය ආකාරයෙන් අදටත් වරාය ගිනි නිවන ඒකකය තුළ දකගත හැකිය.

ආයතන ධූරාවලිය විහිදී යන ආකාරය දෙස බලන විට දී, විවිධ මට්ටම් තුළ ඒ ඒ සේවකයා බෙදා වෙන් කර ඇති ආකාරය සරල, එහෙත් වගකිව යුතු ආකාරයට සේවා මට්ටම් දක්වා තිබේ. එහි දී,

- ගිනි බට
- යාන්ත්‍රික ගිනිබට
- ජ්‍යෙෂ්ට ගිනිබට
- නියාමක ගිනිබට
- ස්ථාන භාර නිලධාරී
- පුහුණු කිරීමේ නිලධාරි
- නියෝජ්‍ය ප්‍රධාන ගිනි නිවන නිලධාරි
- ප්‍රධාන ගිනි නිවන නිලධාරි

යන තනතුරු වලින් සමන්විත වේ.එකිනෙකට වෙනස් තනතුරු වුවද සේවයට කැපවීමේ කර්තව්‍යයේදී පසු නොබසින සේවාවක් ලබා දීමට සේවක මහත්වරු දක්වන යුහුසුළු බව පැහැදිලිව දකිය හැකි ලක්ෂණයකි.

ආයතනයේ ක්‍රියාවලිය පිළිබඳ පිරික්සා බලන විටදී, මෙම ඒකකය කොටස් 03 න් සමන්විත වන ආකාරය දක්විය හැකිය.

- මෙහෙයුම් -Operation
- ගිනි ආරක්ෂණ -Prevention
- ගිනි නිවන යාත්‍රා -Mega

යන කොටස් මෙහිදී දැක්විය හැකිය.වගකීම් පැහැර හරිනවා වෙනුවට හැකි සෑම විටම තම සේවාව සැපයීමට මෙම සේවකයන් කැපවන ආකාරය දක්විය හැකිය.එනම්, ගාල්ල ගිනි නිවීමේ ඒකකයේ සේවකයන් ද ඇතුළුව මෙම ඒකකය තුළ සමස්ථ සේවක පිරිස 120 ක් පමණ වන අතර, දිනකට පැමිණ සිටින සේවක මණ්ඩලය කොටස් වලට බෙදා සේවා සැපයීමට වර්ග කර දක්වීම මෙහිදී සිදු කරනු ලබයි. එකිනෙකාට නිශ්චිතව හිමිකර තිබූ කාර්යයට වඩා මෙම ක්‍රමවේදය තුළින් කාර්‍යශූර,සේවයට ප්‍රවීණයන් බිහිවීම දක්නට ලැබේ. නිසි කායික යෝග්‍යතාවයක් සහිත පිරිසක් බිහි කරවීම සහ සතතාභ්‍යාසය හෙවත් නිතර ලබන පුහුණුව තුළ ප්‍රවීණයකු වීමට ඇති හැකියාව යන කරුණු මුල් කර ගත්විට මෙම සේවකයන් නිවැරදිව දිනපතා පුහුණු කටයුතු වල නිරත වන පිරිසකි. එක කණ්ඩායමකට 12 බැගින් සියලුම පිරිස් ආවරණය වන පරිදි විවිධ පුහුණු ක්‍රම උපයෝගී කොටගෙන පුහුණු කටයුතු සිදු කරනු ලබයි. එය prevention හරහා සිදු කරනු ලබයි. චක්‍රාකාර ලෙස සිදු වන මෙම ක්‍රියාවලියේ අවසානයක් දකිය නොහැකි වන අතර, එය දිනපතා

> ආයතන ඉතිහාස පුරාවෘත සොයා යන ගමනේදී, පැය 24 පුරාවටම නොනිමි සේවයක යෙදෙන හදිසි අවස්ථාවකදී පමණක් නොව,සේවය අවශ්‍යතාවය තැන දී නොමැලිව සේවයේ නියුතු, ජනතාවගේ මුරදේවතාවකු යැයි නම් පට බැඳීමකට සුදුසු පිරිසක් වෙසෙන ඒකකයකැයි කියූ විට නිවැරදිය.





**එස්.ඒ.ආර්. ජයතිලක**
**ප්‍රධාන ගිනි නිවන නිළධාරී**

සිදුවන ක්‍රියාවලියකි. විමර්ශනශීලීත්වයේ පුරෝගාමීන් ලෙසට හැඳින්විය හැකි මෙම ඒකකය සතුව ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් සෑම අංශයක්, ගො ඩනැගිල්ලක් පිළිබඳවම දළ සැලසුම්, විස්තර පවතින අතර, නිසි ගබඩා කිරීමක් සහ වසරකට වරක් එම තොරතුරු පිරික්සා බලන ක්‍රමවේදයක් මෙම ඒකකය මගින් සිදුකරන නිසා ආයතනයේ කාර්යය සාර්ථකව සිදු කර ගැනීමට පහසු බවක් ආයතනය විසින් පවත්වා ගනු ලබයි. ආයතනයකට අවශ්‍ය නිසි නඩත්තු කිරීම් තුළ ආයතනයක සාර්ථක බව පැහැදිලිව දකගත හැකිය. බොහෝ නඩත්තු කිරීම් කටයුතු සේවක මහතුන් විසින්ම සිදු කර ගනු ලබන හෙයින් උපකරණ නඩත්තුව, පිරිසිදු කිරීම් කටයුතු, පිළිසකර කිරීම් යනාදී සෑම කටයුත්තක්ම අන්‍යයන්ගේ උපකාරයක් නොමැතිව සිදු කරනු ලබන්නේ ගිනි නිවීම් ඒකකයේ සේවය කරන සේවකයන්ගේ දහඩිය මහන්සිය සමඟ මුසු වූ සියුම් සන්තුෂ්ටියක් ද මුසු කර ගනිමිනි.

ආයතනය තුළ තම සේවා සාර්ථක කර ගැනීමේ කර්තව්‍යය සඳහා ආයතනය සතුව පවතින විවිධ උපකරණ ඒ ඒ අවශ්‍යතාවන්ට සරිලන ආකාරයට ඔවුන් සතුව පවතියි. එහි දී, මුහුද හා නැව් සම්බන්ධ ගින්නකදී ඒ සඳහා ම සකස් කළ නවීන යාත්‍රාවක් මොවුන් සතු වේ. මෙහි Remote Control Tower සහිත වේ. එය මීටර් 16.5 ඉහළට එසවීමට හැකියාව පැවතීම සුවිශේෂීත්වය ගෙනදෙන කරුණකි. එහි Foam 16,000 ක්, Dry Cemical Power, වැනි ගිනි නිවීමට අවශ්‍ය කරන ගින්නට තිත තැබිය හැකි අංශ ලෙසට මෙම යාත්‍රාව දැක්විය හැකිය.

තවද වෙනත් ගිනි නිවන සේවාවල නොමැති යාත්‍රාවක් ද ගිනි නිවන ඒකකය සතු වනු ඇත. ඇ.එ.ජ. (U.S.A) මඟින් ගෙන්වීමට නියමිත නවීන රථයක් වන මෙය ඉදිරි කාල වකවානුව තුළ මිලියන 160ක වියදමක් දරා ගෙන්වීමට කටයුතු සූදානම් කර තිබේ. මෙහි විශේෂත්වය නම්, මීටර් 16 පමණ උසට එසවිය හැකි වීමයි. ගිනි ගැනීමකදී ඔක්සිජන් වායුව අභ්‍යන්තරයට ගලා ගිය විට ගින්න වර්ධනය වීමක් සිදුවේ. මෙම ගිනි නිවන රථය හරහා අභ්‍යන්තරයට ජලය විදීමක් සිදු කරමින් ගින්න මැඩලීමේ කාර්ය සාර්ථකව අවසන් කරගත හැකිය.

මෙම ආයතනය මඟින් සිදු කරන සේවා පිළිබඳ කතිකාවේදී, ආපදාවක් ඇතිවීමට පෙර එය වැළැක්වීමට කටයුතු යොදා තිබීම වැදගත් බව මෙම ඒකකය දරන මතවාදයයි. විවිධ දියුණු තාක්ෂණික උපකරණ, ක්‍රමවේද තම කටයුතු වලදී භාවිත කරමින් ඉහළ සේවයක් සමාජගත කිරීම සේවකයන්ගේ අභිප්‍රායයි. ආපදාව සිදු වූ පුද්ගලයන්ගේ සමාජ මට්ටම්, තරාතිරම නොබලා හැකි සෑම උත්සාහයක් තුළින්ම ජීවිත බේරා ගැනීමේ ක්‍රියාවලියට අතහිත දීමට මෙම සේවකයන් දෙවතාවක් නොසිතයි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ගිනි නිවීමට අමතරව, කොළඹ නගරයේ යම් තැනක සිදු වන ගිනි නිවීම් ආදී තම සේවාව අවශ්‍යමයි යන හැඟීම පෙරටු කර ගනිමින් කටයුතු කරන ඒකයක් නිසා වගකීමෙන් බැඳෙමින් මෙම ක්‍රියා හා එක්වෙන පිරිසක් ලෙස දැක්විය හැකිය. නාගරික ගිනි නිවීමේ අංශය උපකාරයක් ඉල්ලූ විට තම සේවාව නොමසුරුව ලබා දීමට කැපවන අතර හොඳ මහජන සම්බන්ධතාවක් ගොඩනගා ගැනීමට එය පුළුල් තෝතැන්නක් කර ගැනීමට ද මෙම අංශය අමතක නොකරයි. ඒ ආදී සමාජ සත්කාර ක්‍රියාද මෙම අංශය මඟින් සිදු කරනු ලබයි. තවද රසායනික ද්‍රව්‍ය බහුල ලෙසට හුවමාරු වන ස්ථානයක් වන වරාය ආයතනය තුළ ඇතිවන ගැටලුකාරී තත්ව වලදී පරිසර හානිය අවම කරමින් නිසියාකාරව ආරක්ෂාව සැපයීම සහ ස්වබාදම් දිනිතියගේ දායාදයක් වූ පරිසරය සුරැකුම් ක්‍රියාවලියට සෑම විටෙකම ඉහළ ගුණත්වයක් සැපයීම මෙම ඒකකය තුළින් සිදුවන මහඟු සේවයකි.

ආපදාවක් සිදු වූ විගස මෙම ආයතනය සහසම්බන්ධ වන සන්නිවේදන ක්‍රියාවලියක්ද මෙහි දී පවතින අතර, දුරකථන මාර්ග සහ VHS Channels යන ක්‍රමවේද මෙහි දී මූලිකත්වය ගනු ලබයි. Channel 16 සහ 18 හරහා ගිනි නිවන ඒකකයේ VHS Channels වලට පණිවිඩය ලබා දෙනු ලබයි.

මෙතෙක් ආ ගමන්මග තුළ ආයතනයට කීර්තිය සැපයූ විවිධ අවස්ථා සිහිපත් කිරීමේදී ප්‍රධාන ලෙසටම MSC නැව බේරා ගැනීමේ ක්‍රියාවලිය දැක්විය හැකිය. නාවික සැතපුම් 200 ඈතට ගමන් කළ නෞකාවක් නාවික සැතපුම් 100 පමණ ලංකාව දෙසට ගෙන එමින් නැව බේරා ගැනීමේ ක්‍රියාවලියේ නිරත වූ අවස්ථාව මෙහි දී වැදගත් වේ. මෙම ක්‍රියාවලිය භාරව සිටි නෙදර්ලන්ත ජාතික ගිනි නිවන ඒකකය නියෝජනය කළ 10න් සම්පූර්ණ පිරිස අභිබවා යාමට මෙම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ගිනි නිවන ඒකකයට හැකියාව ලැබීමම ස්වර්ණමය අවස්ථාවක් ලෙස දැක්විය හැකිය. තවද 1979 සිදුවීම තුළ ශෝචනීය ස්වභාවයක් ඉස්මතු වූ අවස්ථාවක් ද දැක්විය හැකිය.

මෙතෙක් අමිල මෙහෙවරක් සැපයූ මෙම ගිනි නිවන ඒකකය ලැබූ අමරණීය නාමය සමඟ එකිනෙකට ගෙත්තම් කළ අනාගත බලාපොරොත්තු බොහෝමයක් ඔවුන් සතු වන ආකාරය දක්නට හැකිය.වරාය සංවර්ධනය සමඟ ආරක්ෂාව පෙරටු කර ගනිමින්,සෑහීමකට පත් විය හැකි ආකාරයට නිශ්චිත තත්වානුරූපී ක්‍රමවේදයක් ආයතනය සතු කර ගැනීමට ඔවුන් කටයුතු කරනු ලබයි.













ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක මහත්ම මහත්මීන්ගේ පරිත්‍යාගයෙන් මහනුවර නිත්තවෙල ප්‍රදේශයේ අඩු ආදායම් දරුවන් වෙත පාසල් උපකරණ ලබාදීමේ අවස්ථාවට සභාපති ජෙනරල් දයා රත්නායක මහතා සහභාගි වූ මොහොත.....



නාවික හමුදාපති වයිස් අද්මිරාල් පියල් ද සිල්වා මහතා සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ධූරයට අභිනවයෙන් පත් වූ ජෙනරාල් දයා රත්නායක මහතාගේ විශේෂ හමුවක් අද දින (2020.01.06) සභාපති කාර්යාල පරිශ්‍රයේ දී සිදුවිණි. නව සභාපති ජෙනරාල් දයා රත්නායක මහතා හට සුභාසිංශන පිරිනමමින් නාවික හමුදාපති වයිස් අද්මිරාල් පියල් ද සිල්වා මහතා සිය ධූර කාලය තුළ ආයතන දෙක අතර, පවත්නා සුහද සම්බන්ධතාව අඛණ්ඩව වර්ධනය වනු ඇතැයි තමා බලාපොරොත්තු වන බැව් පැවසී ය. සමුද්‍රීය ක්ෂේත්‍රයේ වර්තමාන සංවර්ධනය හා කොළඹ වරායේ මගී නෞකා මෙහෙයුම් සඳහා පහසුකම් සැලසීම පිළිබඳව ද මෙහි දී සාකච්ඡා කරන ලදී. අනතුරුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය සභාපති ජෙනරාල් දයා රත්නායක මහතා සහ නාවික හමුදාපති වයිස් අද්මිරාල් පියල් ද සිල්වා මහතා අතර විශේෂ ඵලක හුවමාරුවක් ද සිදුවි ය. මෙම අවස්ථාවට ශ්‍රී ලංකා වරාය අධිකාරිය කළමණාකාර අධ්‍යක්ෂ කපිතාන් අතුල හේවාවිතාරණ මහතා ද එක් වි ය.

## 2020 වසරේ "වරාය අධිකාරිය සම්මානය" සහ "වරාය යටිතල පහසුකම් සංවර්ධනය" සඳහා වන ග්ලෝබල් පෝර්ට් ෆෝරම් සම්මාන ද්විත්වය ශ්‍රී ලංකා වරාය අධිකාරියට





ග්ලෝබල් පෝර්ට් ෆෝරම් විසින් පවත්වන ලද සම්මාන උළෙලේ දී **''වසරේ වරාය අධිකාරිය සම්මානය''** සහ **''වරාය යටිතල පහසුකම් සංවර්ධනය''** සඳහා වන සම්මානය දිනා ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමත් විය. අඛණ්ඩව තෙවැනි වරටත් ඩුබායි හි හයාට් රීජන්සි හෝටල් පරිශ්‍රයේ පැවති මෙම සම්මාන උළේලේදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය නියෝජනය කරමින් අධ්‍යක්ෂ (සේවා සැපයුම්) උපුල් ජයතිස්ස මහතා සහ අධ්‍යක්ෂ (මෙහෙයුම්) ජයන්ත පෙරේරා මහතා විසින් එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ විදේශ කටයුතු හා ජාත්‍යන්තර සහයෝගිතා සහකාර ගරු අමාත්‍ය මොහෝමඩ් ෂරාෆ් සහ ඩුබායි වරාය සමූහයේ හිටපු ප්‍රධාන විධායක නිළධාරී සහ ගෝලීය වරාය සංසදයේ සභාපති තෝමස් එන්ග් මැතිතුමාගේ සුරතින් මෙම සම්මානය ලබා ගන්නා ලදි.

මෙවර සම්මාන උළෙලේ දී ප්‍රශස්ත දායකත්වය හා වෘත්තීයමය ස්වභාවයෙන් යුතුව කටයුතු කරනා වෙසෙස් ප්‍රදේශයන් හි වරාය සහ පර්යන්ත පිළිබඳ සහ ඒවායේ සාර්ථකත්වය ළඟා කර ගැනීම පිළිබඳ අවධානය හා ඇගැයුමට ලක් කරමින් ක්ෂේත්‍ර ගණනාවක් යටතේ මෙම සම්මාන පිරිනැමීම සිදු කෙරිණි.

**''වසරේ වරාය අධිකාරිය''** සම්මානය ට ශ්‍රී ලංකා වරාය අධිකාරිය පසුගිය 2018, 2019 වර්ෂවල ද සම්මානයට පාත්‍රවීම සිදු වූ අතර අඛණ්ඩව 2020 වසරේදීත් එය හිමිකර ගැනීමට හැකිවීම ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු විශිෂ්ටත්වය හෙළි කිරීමකි.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෙසා සුවිසල් ජයග්‍රහණයෙහිලා වරාය මෙහෙයුම් ක්‍රියාවලිය සම්බන්ධ සියළුම පාර්ශවයන්ගේ දායකත්වය හා වෘත්තිය සමිති මෙන්ම සමස්ථ වරාය සේවක මහත්ම මහත්මීන් අතර පැවති සහ සම්බන්ධතාවය ඉතා ප්‍රශස්ත ලෙස වර්ධනය වී තිබීම ද මෙවන් ජයග්‍රහණයක් කරා ළඟා වීමට හේතු වී තිබේ.

වරාය හා නාවික ගරු අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා ශ්‍රී ලංකා වරාය අධිකාරියට හිමි වූ මෙම ජයග්‍රහන පිළිබඳ සිය සුබ පැතුම් එක් කරමින්, වරායේ කඩිනම් සංවර්ධනයක් කරා පිය නැගීමට කටයුතු කරන බවත්, වරාය සම්බන්ධ තීන්දු තීරණ ගැනීමේදී වරායට, එහි සේවක මහත්ම මහත්මීන්ට, සමස්ථ රටට ඉතාමත් ඵලදායි වූ තීරණ මත හිඳ කටයුතු කිරීමට පියවර ගන්නා බැව් පැවසීය.

වරාය හා නාවික ගරු අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතාගේ මග පෙන්වීම සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ජෙනරල් දයා රත්නායක මහතාගේ නායකත්වය යටතේ වරාය අධිකාරියේ සංවර්ධන ක්‍රියාවලිය වේගවත් කර තිබේ. වරායේ බහලු මෙහෙයුම් ධාරිතාවය තව දුරටත් ඉහළ නංවමින් ශ්‍රී ලංකාව ආසියාවේ සමුද්‍රීය මධ්‍යස්ථානය ලෙසින් ගොඩනැංවීමට ඉලක්ක කර තිබේ.



ධර්ඩන්ස් රෝහල් කළමණාකාරිත්වය සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය අතර සහයෝගිතාවය වර්ධනය කර ගැනීමේ අරමුණෙන් ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව පලතුරු පැය 100 ක් ලබා දුන් අවස්ථාව සංකේතවත් කරමින් සම්බුද්ධ ජයන්ති චෛත්‍ය පරිශ්‍රයේ දී පැලයක් රෝපනය කළ අවස්තාව....

19 පිටුවෙන්...

### රන් තිළිණ ප්‍රදානය..

වැඩි සහ වසර 35ට අඩු, සේවා කාලය වසර 35 ක් හෝ ඊට වැඩි යන කාණ්ඩ ඔස්සේ විශ්‍රාමික සේවක මහත්ම මහත්මීන් 438 දෙනෙකු වෙත මෙම රන් තිළිණ ප්‍රදානය සිදුවේ.

2014 වසරේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 35 වැනි සංවත්සරයට සමගාමීව ආරම්භ කරන ලද මෙම රන් තිළිණ ප්‍රදානය මෙවර පැවැත්වූයේ අඛණ්ඩව 10 වැනි වතාවට ය.

මෙම අවස්ථාවට වරාය හා නාවික අමාත්‍යංශ ලේකම් එම්.එම්.පී.කේ. මායදුන්න, වරාය හා නාවික අමාත්‍යංශ අතිරේක ලේකම් කේ.එන්. කුමාරි සෝමරතන, ශ්‍රී ලංකා වරාය අධිකාරිය උප සභාපති ඩබ්ලිව්.එස්. වීරමන්, කළමණාකාර අධ්‍යක්ෂ කපිතාන් අතුල හේවාවිතාරණ, අතිරේක කළමණාකාර අධ්‍යක්ෂ උපාලි ද සොයිසා ඇතුළු අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික මහත්ම මහත්මීන්, වරාය කළමණාකාරීත්වයේ උසස් නිළධාරීන්, සේවක මහත්ම මහත්මීන් රැසක් එක් වූ හ.

# කොළඹ උතුරු වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වන ශඛ්‍යතා අධ්‍යයනයට උපදේශන සේවා ලබා ගනී





ශ්‍රී ලංකාවේ ප්‍රධානත ම වෙළෙඳ නගරය වන කොළඹ නගරය තුළ වරාය පිහිටුවා තිබීම මේ වන විට අභියෝගයක් වෙමින් තිබේ. ඒ, වරාය තුළ දිනෙන් දින වර්ධන වන ප්‍රතීනැව්ගත බහලු මෙහෙයවීම හා දේශීයව සිදු කෙරෙන ආනයන හා අපනයන භාණ්ඩ මෙහෙයුම් සඳහා අමතර ඉඩ පහසුකම් සොයා ගැනීමට යාමේ දී ය. එම ගැටළුවට විසඳුමක් ලෙස ඉඩකඩ ප්‍රමාණයක් කොළඹ වරාය තුළ ම අලුතින් ඇති කර ගැනීමට අවධානය යොමුව තිබේ.

දැනට පවතින කොළඹ දකුණු වරාය තුළ, ඉන්දියානු කලාපයේ කේන්ද්‍රීය වරායක් ලෙස ප්‍රතීනැව්ගත බහලු මෙහෙයවීමට අවශ්‍ය ඉඩකඩ වැඩි කිරීමේ දී, අනෙකුත් මෙහෙයුම් සඳහා වන ඉඩ කඩ ඇහිරී එම භාණ්ඩ මෙහෙයුම් ධාරිතාව පහත වැටෙන තත්ත්වයක් උද්ගතව ඇත.

රටේ බලශක්තිය සඳහා වන ඉල්ලුම සැලකීමේ දී කොළඹ නගරය තුළ සිදුවන සුවිශාල සංවර්ධනය හේතුවෙන් විශාල ඉල්ලුමක් දැකිය හැකි ය. මේ හේතුවෙන් ආනයනික ස්වභාවික ගෑස් හා ඉන්දන මෙහෙයවීම සඳහා ආරක්ෂාකාරී පහසුකම් අත්‍යවශ්‍ය වේ. දැනට පවතින එම පහසුකම් වඩාත් පුළුල් කරමින් කොළඹ වරායට යාබද ව වෙනත් ස්ථානයක පැවැත්වීමට සාකච්ඡා වෙමින් පවතී.

කොළඹ දකුණු වරාය ප්‍රතිඅපනයනය හා දේශීය බහලු මෙහෙයුම් හි ධාරිතාව උපරිමයකට යොමු වෙමින් තිබේ. දැනට පවතින කොළඹ වරායේ දියකඩනයට ආවරණය වන පර්යන්ත තුළ ධාරිතාව වර්ෂයකට බහලු මිලියන 12කි. එය බටහිර පර්යන්තය (WTC) ඉදි වී මෙහෙයුම් ආරම්භ වීමෙන් පසු මිලියන 15ක් දක්වා වර්ධනය වනු ඇත.

එය ඉදිරි වසර 10 තුළ දී සිදු කිරීමට අවශ්‍ය ශඛ්‍යතා අධ්‍යයනය හා තාක්ෂණික ඇගයීම් සම්පූර්ණ කර ක්‍රියාත්මක කිරීමට සුදුසු මට්ටමක පසු වේ.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඉදිරි වසර 30 සඳහා වරාය සැලසුම් සිදු කරමින් සිටී. ඒ අනුව දැනට පවතින දකුණු වරායට අමතරව උතුරු වරායක් ඉදි කිරීමට සැලසුම් කොට ඇත. ඒ තුළින් වාර්ෂික බහලු මෙහෙයුම් ධාරිතාව මිලියන 35ක්

උතුරු වරාය ස්ථාපිත කිරීම සඳහා යෝජනා කරණුයේ කැළණි ගං මෝය මෙපිට මෝදර කලාපයේ සිට දැනට ඇති උතුරු දියකඩනය දක්වා විහිදී ඇති ප්‍රදේශයයි. මෙම වරාය ව්‍යාපෘතිය තුළින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය බලාපොරොත්තු වන්නේ දියර නැව් බඩු, තොග කඩන නැව් බඩු, වාහන මෙහෙයුම් හා වෙනත් බහලු මෙහෙයුම් සඳහා පර්යන්ත හා නැංගුරම් පොළ පහසුකම් ඇති කිරීමටයි. මෙම ව්‍යාපෘතියේ සක්‍රීය පදනම වනුයේ, ඇතිවන වරාය පහසුකම් පිළිබඳ ඉල්ලුමයි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා වන යටිතල පහසුකම් හා සේවා පහසුකම් ලබා දීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය බලාපොරොත්තු වේ.

ඒ අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය, නාවික වෙළෙඳ ක්ෂේත්‍රයේ ඉල්ලුම පදනම් කර ගනිමින් ඇති වන මෙහෙයුම් ධාරිතාවට අවශ්‍ය පර්යන්ත හා නැංගුරම් පොළ පහසුකම් සංවර්ධනය සඳහා මෙම ව්‍යාපෘතිය ඇති කිරීමට අවශ්‍ය ශඛ්‍යතා අධ්‍යයනයක් සඳහා සැලසුම් කොට ඇත.

ආසියානු සංවර්ධන බැංකුවෙන් හිමි වන ප්‍රවාහන පහසුකම් වැඩි දියුණු කිරීමේ මූලාධාර ව්‍යාපෘතියක් යටතේ මේ සඳහා ශඛ්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමට සූදානම් වන අතර, එය මාස 15ක් තුළ දී නිම කිරීමට බලාපොරොත්තු වේ.

ඒ අනුව රජයේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියට අනුව මේ සඳහා මිල කැඳවා කොළඹ උතුරු වරාය සංවර්ධන ව්‍යාපෘතිය ශඛ්‍යතා අධ්‍යයනයක් සඳහා ආයතනයක් තෝරා ගැණිනි. ඒ සඳහා විෂය භාර කැබිනට් අමාත්‍යවරයාගේ අනුමැතිය ප්‍රකාරව ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා එක්සත් රාජධානියේ Infrastructure & Environment (AECOM) ආයතනය සමග 2020.02.20 දින ගිවිසුමකට එළැඹියේ ය.

මේ සඳහා වරාය හා නාවික විෂය භාර ගරු අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතාගේ ද, ගරු රාජ්‍ය අමාත්‍ය කනක හේරත් මහතාගේ ද පූර්ණ මගපෙන්වීම ලබා දීම ද විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

# ගාලු වරායේ නෞකා පැමිණීමේ වර්ධනයක්









2020 පළමු කාර්තුවේ පෙබරවාරි 11 වැනි දින වන විට ගාලු වරායට පැමිණි නෞකාවන්ගේ කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරයි.

ක්ලින්කර් රැගෙන පැමිණෙන යාත්‍රා ප්‍රමාණය 23 ක අගයක් ගන්නා අතර, අනෙකුත් නෞකා ප්‍රමාණය 9 කි. එදිනට පැමිණි සමස්ථ නෞකා ප්‍රමාණය 32 කි. වරාය සීමාවෙන් බැහැර සේවා සැපයීම් 1119 ක් වන අතර, නැංගුරම් දැමීමේ පහසුකම් යටතේ වෙනත් නැංගුරම් යාත්‍රා 23ක්, නැංගුරම් පහසුකම් සලසා ගෙන තිබේ. එදිනට පැමිණි රුවල් යාත්‍රා ප්‍රමාණය 20 කි.

2019 වසරේ ක්ලින්කර් යාත්‍රා 170 ක් ගාලු වරායට පැමිණි අතර, 2018 වර්ෂයේ එය 64 කි. 2019 වසරේ පැමිණි සෙසු යාත්‍රා ප්‍රමාණය 110 ක් වන අතර, එය 2018 වර්ෂයේ 48 කි. 2019 වසරේ ගාලු වරායට පැමිණි සමස්ථ නෞකා ප්‍රමාණය 283කි. එය 2018 වසරේ 119 කි. පසුගිය වසරේ වරාය සීමාවෙන් බැහැර සේවා සැපයීම් 8586 ක් වාර්තා වන අතර, එය 2018 වර්ෂයේ දී 7867 කි. පසුගිය වසරේ ගාලු වරායට පැමිණි සමස්ථ රුවල් යාත්‍රා ප්‍රමාණය 68කි. එය 2018 වර්ෂයේ දී 35කි.

මෙලෙස 2020 අවසන් වන විට ගාලු වරාය වෙත පැමිණෙන නෞකාවන්ගේ කැපී පෙනන වර්ධනයක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අපේක්ෂිත කරයි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමණාකාරීත්වය, නිසි ක්‍රමවේදයන් ඔස්සේ ප්‍රාදේශීය වරායයන් සංවර්ධනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙසින් මෙලෙස නෞකාවන් පැමිණීමේ වර්ධනයක් දැකගත හැකි අතර, වත්මන් සභාපති ජෙනරල් දයා රත්නායක මහතාගේ නායකත්වයත්, ගරු වරාය හා නාවික කටයුතු ගරු අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු, වරාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය කනක හේරත්, කළමණාකාර අධ්‍යක්ෂ කපිතාන් අතුල හේවාවිතාරණ යන මහත්වරුන්ගේ සුවිශේෂී මගපෙන්වීම තුළින් ගාලු වරායේ සුවිශේෂී වර්ධනයක් ලඟා කර ගැනීමට අපේක්ෂිත ය.

11 පිටුවෙන්...

## ජාත්‍යන්තර මට්ටමේ..

පෙර අපි වෙත ඇවිත් රැජින පර්යන්තය (QCT) PPP ක්‍රමවේදය යටතේ මෙහෙයුම් කිරීමට යෝජනා කළා. නමුත් අපි ඒ මොහොතේ එම යෝජනාව ප්‍රතික්ෂේප කළා. අවසානයේ ඔවුන් ඕමානයේ 'සලලා' නමින් වරායක් 30%ක ආයෝජනයෙන් යුතුව ඉදි කළා. සලාලා වරාය අද බහලු මිලියන 3.5ක් මෙහෙයුම් සිදු කරනවා.

සිංගප්පූරුව වරාය අධිකාරියටත් අප ට සිදු වූ දෙය ම සිදු වුණා. Maersk Line අප ට ලෙසින් ම ඔවුන්ටත් PPP පදනම යටතේ වරායක් ඉදිකෙරුමට ආරාධනා කළා. නමුත් සිංගප්පූරු වරාය අධිකාරියත් අපි වාගේ ම ඒ යෝජනවා ප්‍රතික්ෂේප කළා. අවසානයේ මොක ද වුණේ? සිංගප්පූරුවට කි.මී. 50ක් දුරින් පිහිටි මලයාසියාවේ ඔවුන් වරායක් ඉදි කළා. ටැංජින් පෙල පාස් (PTP) නමින් හැඳින්වෙන එම වරාය අද ලෝකයේ හොඳ ම බහලු මෙහෙයුම් වරාය අතර 18 වැනි වරාය බව ට පත් වී තිබෙනවා. මෙන්න මේ වගේ ත්ත්වයක් අද දවසේ අපි ට හැඳින ගන්න පුළුවන්.

**8 මෙවන් ජාත්‍යන්තර තත්ත්වයන් හමුවේ වරාය අධිකාරියක් ලෙසින් අපි කොහොමද අභියෝග ජයගන්නේ?**

පසුගිය කොරෝනා සමය තුළ සේවකයින් 3000කට අඩු ප්‍රමාණයකින් වරායයේ මෙහෙයුම් ක්‍රියාවලිය කිසිදු අතපසුවීමකින් තොරව පවත්වාගෙන යෑමට වරාය කළමණාකාරීත්වයට හැකි වුණා. ඒ තුළ සිතන්නට බොහෝ කරුණු තිබෙනවා. ඒ වගේ ම ඒ සඳහා කැප වූ සියළු දෙනාට ම කෘතවේදීත්වය පළ කරන්නත් මම කැමතියි.

දකුණු ආසියාවේ රජයක් සතු විශාලත ම පර්යන්තය වන්නේ අපගේ ජය බහලු පර්යන්තයයි. මීටර් 1292කින් යුතුව, ප්‍රධාන නැංගුරම් පොළ හතරකින් සමන්විත ව ක්‍රියාත්මක වීම තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය ට පර්යන්ත මෙහෙයුම් කරන්න හැකි බව මේ වන විට ඔප්පු කර තිබෙනවා. නමුත් ඒ සඳහා අවශ්‍ය ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතු සේවා සැපයීමේ ක්‍රියාවලිය තුළ සන්නද්ධ වීමට නම් අපි සේවකයින් ලෙසින් අපේ උපරිම ශක්තිය ලබා දිය යුතුයි. එය ට සියළු දෙනාගේ දායකත්වය නියත වශයෙන් ම අවශ්‍ය වනවා. එසේ නොවුණහොත් අපි මේ තරගකාරී සමුද්‍රීය වෙළඳාමෙන් ඉබේ ම ඉවත් වෙනවා.

**9 දවසින් දවස බහලු නෞකා අඩු වන ප්‍රවණතාවක් තියෙනවා.**

ඔව්. එය ඇත්ත. මොක ද නිෂ්පාදනය වන නෞකාවන්ගේ විශාලත්වය සමග එන නැව් ප්‍රමාණය අඩු වෙනවා. ඒත් සමග ම සේවා සැපයීමේ ක්‍රියාවලියත් අඩුවෙනවා. මට මතකයි ලෝකයේ නැව් සමාගම් 20ක් තිබුණා. නමුත් ඉන් සමාගම් 08ක් ක්ෂේත්‍රයෙන් ඉවත් වුණා. අද යාවත්කාලීන වී ඇත්තේ නැව් සමාගම් 12ක් පමණයි. ඒ වාගේ ම අද දවසේ නිෂ්පාදනය වන නෞකා දිගින්, පළලින්, ගැඹුරින්, ධාරිතාවයෙන් වැඩිනිසා දොඹකර ඇතුළු තාක්ෂණික මෙවලම් යාවත්කාලීන විය යුතුයි.

**10 ආසියාවේ අවසන් නැව් තොට වන්නේ කොළඹ වරායයි. වරායට විශාලත්වයෙන් වැඩි නෞකා ගෙන්වා ගැනීමට කළ යුතු උපායමාර්ගික සැලසුම් මොනවා ද?**

සිංගප්පූරුව, මැලේසියාව ට වඩා ගැඹුරු වරායක් අප සතු විය යතුයි. මොක ද කියනවා නම්, කොළඹ වරායට පැමිණෙන නෞකාවක් එහි බහලු ගොඩබෑම් සිදු කර යළි පවත්වාගෙන යෑම ට ආදාල අවශ්‍යතා ප්‍රශස්ත ලෙසින් සපුරාලිය යුතුයි. මේ වන විට ඒ සඳහා අපි ට වරායක් තිබෙනවා. අවශ්‍ය උපකරණ තිබෙනවා. නමුත් ධාරිතාවය නැහැ. CICT පර්යන්තය නිරතුරුව ම නෞකාවන්ගෙන් පිරී පවතිනවා. ඒ නිසා අලුත් නැව් සේවාවක ට පැමිණෙන්න ඉඩක් නැහැ. අලුත් නැව් සේවාවත් අප වෙත පැමිණෙන්න කැමැත්ත පළ කළත් නෞකා මෙහෙයුම ට CICT හි ඉඩක් නැත්නම් ඒ නැව් සේවා අපෙන් ගිලිහී යනවා. ඒ සඳහා ප්‍රශස්ත ම උපාය මාර්ගය වන්නේ නැගෙනහිර පරර්යන්තයේ මෙහෙයුම් කටයුතු Mega Max වර්ගයේ නෞකා මෙහෙයවීමට සරිලන ලෙසින් කඩිනමින් ස්ථාපිත කිරීමයි. ඒ වගේ ම සිංගප්පූරු වරාය මේ වන විට බහලු මිලියන 65ක් මෙහෙයවීමට හැකි ටුවාස් (Tuwas) නම් නව වරායක් ගොඩ නැංවීමට පියවර ගනිමින් සිටිනවා. මෙතෙක් නාවික භාවිත කළ පර්යන්ත සංචාරක ප්‍රවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට සැලසුම් කර තිබෙනවා. ඒ තුළ අපටත් ඉගෙනුමට බොහෝ කාරණා තිබෙනවා.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය ලෙසින් අපට ඉතා ම දක්ෂතා සපිරි, කැපවීමෙන් කටයුතු කරන විශිෂ්ට මට්ටමේ සේවක පිරිසක් සිටිනවා. ඔබ සියළු දෙනා ම වරාය ට සම්පතක්. කෙතරම් අගනා සම්පතක් වුවත් මිනි කැටයක් පොළෝ තලයේ තිබූ පමණින් සම්පතක් වන්නේ නැහැ. එහි වටිනාකම මතු කරගන්න ට නම් එය කපා ඔප දමා ගත යුතුමයි. සේවක ඔබ සතු ව විසල් හැකියාවන් තිබෙනවා. ඔබ සතු මේ සියළු හැකියාවන් මනාව සංවිධානය කර මාන සම්පතක් ලෙස කණ්ඩායම් හැඟීමෙන් එකසත්ව, එක්සිත් ව කටයතු කරන්නට හැකි නම් අපි ට හෙට දවස ජය ගැනීම කිසිසේත ම අපහසු වන්නේ නැහැ කියා මම විශ්වාස කරනවා. නමුත් ඒ සඳහා වරායේ සිටින සේවකයින් 9900 ම එක ම අරමුණෙන් වරායේ දියුණුවට සිය ශක්තිය යෙදවිය යුතුයි. එවිට පෞද්ගලික පර්යන්ත පවා මවිත වන අයුරින් තරගකාරීත්වයක් දිය හැකියි කියා මම විශ්වාස කරනවා. ඒ වාගේ ම ඒ ශක්තිය සේවක ඔබ සතුව නොඅඩුව තිබෙන බවත් මම තරයේ විශ්වාස කරනවා. යුගයේ අවශ්‍යතාවයට ආයතනයේ පණ ගැන්වීමට සිය උපරිමයෙන් කැප වී ඔබගේ යුතුකම් ඉෂ්ට කිරීමේ කාලය දැන් එළැඹ තිබෙනවා. ඉතින් අපි එක්සත්ව එක්සිත්ව ජාත්‍යන්තර මට්ටමේ විශිෂ්ට සේවාවක් සැපයීමට අත්වැල් බැඳගනිමු.

07 පිටුවෙන්

## ජාතියේ හදවත නම් වූ..

අයෙකුට සේවයට එන්නට හැකියාව තිබෙනවා. නමුත් අපේ රටේ තිබෙන වාතාවරණයට සාපේක්ෂවයි එය තීරණය කළ යුත්තේ. මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කරමින් ඉදිරියේදී සියලු දෙනාට සේවයට වාර්තා කිරීමට ඒ අනුව අවස්ථාව ලැබේවි.

**වරායේ සංවර්ධන කටයුතු සඳහා ඔබතුමා යෝජනා කරනා ඉදිරි සංවර්ධන වැඩසටහන පිළිබඳවත් අපි කතා කරමු..?**

ඉදිරි සංවර්ධන සැලැස්ම පිළිබඳ සැලකිල්ලට ගතහොත් ඉදිරි වසර තුන ඇතුළත කොළඹ වරායේ නව වර්යන්ත 3ක් නිර්මාණය වෙනවා. නැගෙනහිර පර්යන්තය, බටහිර පර්යන්තය හා මගී පර්යන්තය. ඒ සමගම තව විශාල ව්‍යාපෘතියක් වරාය ඇතුළේ නිර්මාණය වෙනවා. ඒ තමයි සේවා සැපයුම් කේන්ද්‍රයක් (Logistic Hub) ගොඩ නැගීමට නියමිතයි.

මේ කටයුතු හැරුණු විට අපේ ආයතනය දිහා හැරී බලන විට අපේ ආයතන ව්‍යුහය යම් මට්ටමකට කඩා වැටී තිබෙනවා. අපේ අය පුරුදු පුහුණු වල දේවල් වලට අඩුපාඩු රැසක් පවතිනවා. වරායේ පරිසරය ගතහොත් එය ඉතාම දූෂිත තත්වයේ තිබෙන්නේ. අපේ සේවකයින්ගේ කෑම බීම, ඉඳුම් හිටුම්, ඇඳුම් පැළඳුම් ඇතුළු මූලික වශ්‍යතා ඉතාම කණගාටුදායක තත්වයක පවතින්නේ.

ඒ වගේම අවට පරිසරය බෙහෝම ජරාජීර්ණ වෙලා තියෙන්නේ. මේ සියල්ල නිසි ක්‍රමවේද ඔස්සේ සකස් කරලා ජාතියේ හදවත නම් වූ මේ අපේ ආයතනය නියම ශ්‍රී ලාංකේය හදවත බවට පත් කිරීමයි අපේ අරමුණ වෙන්නේ.

**ඔබතුමා මීට පෙර කිහිපවතාවක් අවධාරණය කළා නාවික කටයුතු පිළිබඳ වෘත්තීයවේදින් බිහිකිරීම රටක් හැටියට අපිට බොහෝ ආදායම් ලැබිය හැකි කාරණාවක් කියා..?**

එය අපිට ඉඳුරාම සම්බන්ධ විෂයක් නොවුණත් වරාය ආශ්‍රිතව අපිට ඒ සඳහා සියලු පහසුකම් තිබෙනවා. අපේ මහපොළ වරාය සමුද්‍රිය විද්‍යායතනය තුළින් න්‍යායාත්මක පදනම ලබා දෙන්න පුලුවන්. ප්‍රායෝගික පුහුණුව ලබා දීමටත් අප සතුව සම්පත් තිබෙනවා. මේ සෑම අංශයක් ම අප සතු නිසා මේ කටයුත්තට අපිට යොමුවීමට උපරිම ශක්‍යතාවය තිබෙනවා. එබැවින් ඉදිරියේදී මේ පිළිබඳ ක්‍රමික පුහුණු පාඨමාලා දියත් කර ජාතික සැලැස්මක් ඔස්සේ ජාත්‍යන්තරය ජය ගැනීමට කටයුතු කරනවා.

04 පිටුවෙන්...

## කොළොම්තොට කොවිඩ් මර්ධන..

හා එක් ව කඩිනම් ක්‍රියාමාර්ග ගනු ලැබිණි. එහි ප්‍රතිඵලයක් ලෙසින් පැමිණෙන පිළිවෙල අනුව නෞකාවන් සඳහා වන ප්‍රමාද ගාස්තු වලින් නිදහස් කර සහන ලබා දීමට පියවර ගැණිනි. එමෙන් ම වරායේ අනුසාංගික ක්‍රියා යහපත් අයුරින් පවත්වා ගැනීමේ අදිටනින් වරාය හා ආශ්‍රිත සේවා අඛණ්ඩව පවත්වාගන යාමට අවශ්‍ය වන්නා වූ ඇඳිරි නීති බලපත්‍ර ලබා ගැනීමට අදාල ආයතන වෙත පහසුකම් සලසා දීම සිදු කරන ලදී.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් නිකුත් කරන පුද්ගල හා වාහන බලපත්‍ර කල් ඉකුත් වීම සඳහා ද නිසි ක්‍රමවේදයක් ඔස්සේ අදාල ආයතන වෙත සහන සලසා දෙනු ලැබී ය.

වරාය හා නාවික ගරු අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා වෙත ආනයනික වෙළඳ කාර්මාන්ත නියෝජිත ආයතනයන් විසින් කරන ලද ඉල්ලීමක් සලකා බලා අප්‍රේල් 14 වන දින සිට මැයි මස 07වැනි දින තෙක් කාලසීමවට මූලික අංගන හා කුලී ගාස්තු පමණක් අයකර ගැනීමට පියවර ගන්නා ලදී. එමෙන් ම එම කාලසීමාව සඳහා වන ආනයනික දේශීය බහලු දඩ ගාස්තු වලින් මුළුමනින් ම නිදහස් කිරීමටත් කටයුතු සලසා දී තිබීම නම්‍යශීලී ආයතනයක දිගු කාලීන පැවැත්ම පසක් කරයි.

ගෝලීය වසංගත රෝග ව්‍යාප්තවීම් අර්බුද සමයක සිය රාජකාරි ස්ථානයට වාර්තා කිරීම මෙන් ම එහි සේවයේ නිරත වීම ද අතුරේ යෑම මෙන් වූ අවදානම් සහගත තත්ත්වයකි. මෙවන් සාමාජීය තත්ත්වය පිළිබඳ හොඳින් දැන හැඳින සේවයට පැමිණෙන සේවක මහත්ම මහත්මීන් ආයතනයක ට මහඟු සම්පතකි. මාර්තු මස 13වැනි දින සිට වරාය මෙහෙයුම් ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වා ගැනීමට දිරි දුන් සියළු ම සේවක මහත්ම මහත්මීන් හට ප්‍රණාමය හිමිවිය යුතු ම ය. සේවක මහත්ම මහත්මීන් විසින් සිය සේවාව තුළින් සෑහීමකට පත් නොවී සියළු ජාතික ආපදා වන් හි දී ක්‍රියාත්මක කළ අයුරින් මෙවර ද සිය වේතනයෙන් දිනක වැටුප පරිත්‍යාග කිරීමට පෙළ ගැසීම වරාය සේවක මහත්ම මහත්මීන්ගේ උදාර මනුසත්කම ප්‍රකට කිරීමකි.

වරායේ මෙහෙයුම් සඳහා සම්බන්ධ වන සියළු ම සේවක මහත්ම මහත්මීන්ගේ ආරක්ෂාව තහවුරු කරමින් එම මෙහෙයුම් කාර්යක්ෂමව හා ඵලදායීව අඛණ්ඩව පවත්වා ගැනීමේ අරමුණින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සම්පාදනය කරන ලද කොවිඩ් 19 වසංගත මර්ධනය සඳහා වූ මාර්ගෝපදේශය එළි දැක්වීම කොළොම්තොට කොවිඩ් මර්ධන මානුෂීය මෙහෙයුමේ සුවිශේෂී සන්ධිස්ථානයකි. එම මාර්ගෝපදේශ යාන්ත්‍රණය අත්පොතක් සේ ගෙන එහි ප්‍රකාරව කටයුතු කිරීම අත්‍යන්තයෙන් කළ යුතු කාර්යකි.

සියළු ම වරාය පරිශ්‍රයන් හී ගෝලීය වසංගත රෝග ව්‍යාප්ත වීම් තත්ත්වය පාළනය කිරීමේ ජාතික/ ජාත්‍යන්තර ප්‍රතිපත්තීන්ට අනුගත ව ප්‍රමිතිගත තත්ත්වයන් පවත්වා ගෙන යෑමට සියළු සේවක මහත්ම මහත්මීන් තිර අදිටනකින් සිට කටයුතු කළ යුතු ය. පවත්නා උවදුර හමුවේ රට යථාවත් කිරීමට මෙන් ම, වරාය අධිකාරිය නම් වූ සුවිශේෂ ආයතනයට ජීවය සපයන්නා වූ ඔබ සෞඛ්‍ය සම්පන්න ක්‍රමවේදයන් මත පමණක් සියළු කටයුතු කිරීම යුක්ති යුක්ත වන්නේ ය.

# ශ්‍රී ලංකා වරාය අධිකාරියට නව නියමු යාත්‍රා 2 ක්

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නාවික කටයුතු සඵලදායි කර ගැනීමේ අරමුණෙන්, ශ්‍රී ලංකා වරාය අධිකාරියට නව නියමු යාත්‍රා 2 ක් ලබා ගැනීම පසුගියදා කොළඹ නැව් තටාකාංගනයේ දී (Colombo Dock Yard PLC ) සිදුවිය.

මාර්ග, මහා මාර්ග, වරාය හා නාවික කටයුතු ගරු අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතාගේ ප්‍රධාත්වයෙන් හා වරාය සංවර්ධන රාජ්‍ය ගරු අමාත්‍ය කනක හේරත්, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ජෙනරල් දයා රත්නායක යන මහත්වරුන්ගේ සහභාගීත්වයෙන් පැවති ශ්‍රී ලංකා වරාය අධිකාරියට නියමු යාත්‍රා ලබා ගැනීමේ උත්සව අවස්ථාවේ අදහස් දක්වූ මාර්ග, මහාමාර්ග, වරාය හා නාවික කටයුතු ගරු අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා, සභාව අමතමින් මෙය සුවිශේෂී අවස්ථාවක් ලෙස තමා විශ්වාස කරන බවත්, සමුද්‍රීය ක්ෂේත්‍රයේ කීර්තිමත් නාමයක් හිමිකරගත් කොළඹ නැව් තටාකාංගනය මෙම නිෂ්පාදන සිදුකිරීම තුළ දේශීය නිෂ්පාදන අගය කිරීමට අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සංකල්පයන් සමග නිසි ලෙසින් ගැලපෙන බවත් පැවසී ය.

තවද, මේ තුළින් ශ්‍රී ලාංකේය ආර්ථිකය ශක්තිමත් කිරීමට ප්‍රබල දායකත්වයක් සැලසෙන බවත් පැවසීය.





පසුගිය කාලය තුළ පැවති අකාර්යක්ෂම පාලනය සහ සහරාන්ගේ ප්‍රහාරය හමුවේ රටේ ආර්ථික තත්වය බිඳ වැටුණු බවත්, මෙම කොළඹ නැව් තටාකාංගනය සතු වූ ඩොලර් මිලියන 50 ක ඇණවුම් අවලංගු වීම සමස්ථ ආර්ථිකයටම සිදු වූ ප්‍රබල පහරක් බැව් පැවසීය.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් 2019 පෙබරවාරි මස 01 වැනි දින නියමු යාත්‍රා 2 ක් නිෂ්පාදනය කර භාරදීමට එකඟව කොළඹ නැව් තටාකාංගනය සමගින් ගිවිසුම් ගතවිය. මීටර් 19 ක දිගින් යුතුව නියමුවන් සිව්දෙනෙකු (04) හා නාවිකයින් සිව්දෙනෙකු (04) හට පහසුවෙන් සිය කටයුතු ඉටු කළ හැකි ලෙසින් නිමවා ඇති මෙම නියමු යාත්‍රා ද්විත්වය, ශ්‍රී ලංකාවේ පවතින ඕනෑම කාලගුණ තත්ත්වයක් යටතේ නාවික සැතපුම් 22 ක වේගයෙන් යාත්‍රා කළ හැකි ලෙසින් නිෂ්පාදනය කර තිබේ.

මාස 10 ක කාලයක් තුළ කොළඹ නැව් තටාකාංගනයේ නිෂ්පාදනය කරන ලද මෙම නියමු යාත්‍රා මෙරට නිෂ්පාදනය කිරීම තුළ සෘජු හා වක්‍ර ලෙසින් ශ්‍රී ලාංකේය තරුණ ප්‍රජාව වෙත රැකියා අවස්ථා සහ නවමු තාක්ෂණික දැනුම ලබා ගැනීමට ද අවකාශය සැලසීම විශේෂිත ය.

# "කොළොම්තොට ගී මියැසිය" රසෝඝයක් වූ දා...













ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බෞද්ධ සංගමය විසින් අනුරාධපුර පූජා නගරයේ ඉදිකරනු ලබන නිවාඩු නිකේතනයේ අවසන් අදියර වැඩ කටයුතු සම්පූර්ණ කරගැනීම සඳහා වූ අරමුදල ශක්තිමත් කර ගැනීම උදෙසා පසුගිය දා මහරගම ජාතික යොවුන් රඟහලේදී ඉදිරිපත් කළ 'කොළොම්තොට ගී මියැසිය' සාර්ථක ලෙසින් පැවැත් විණි. ශ්‍රී ලාංකේය සුභාවිත ගීතය පෝෂණය කළා වූ ක්ෂේත්‍ර ත්‍රිත්වයක අති දක්ෂ ගායනවේදී දෙපලකගේ සහ ගායනවේදිනියකගේ හඬ මාධූර්යයෙන් එදා යොවුන් රඟහල නිම්නාද වූයේ සුභාවිත ගීතයට පෙම් පදින ප්‍රේක්ෂකාගාරයක් පවතින බව සනාථ කරමිනි.

# මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනයට සම්මානයක්

නව දනුම කුසලතා ආකල්ප ඔස්සේ වරායේ මානව සම්පත යාවත්කාලීන කරමින් මතුනොව ශ්‍රී ලාංකේය සමුද්‍රීය ක්ෂේත්‍රයටම අගනා මෙහෙයක් ඉටුකරනා මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය පසුගියදා සුවිශේෂි සම්මානයකින් පිදුම් ලැබීය.

කම්කරු අමාතකාංශය විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන සමාජ සංවාද හා සේවා ස්ථාන සහයෝගීතා සම්මාන උළෙල 2019 හි ලෝකඩ සම්මානය දිනා ගැනීමට මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය සමත් විය.

මේ පිළිබඳ අදහස් දක්වූ ප්‍රධාන අභ්‍යාස කළමණාකරු සරත් දයානන්ද මහතා,




වරාය කළමණාකරණ ඩිප්ලෝමා පාඨමාලාව, ඇතුළු පාඨමාලා 150 කට අධික ප්‍රමාණයක් පවත්වනු ලබන අප ආයතනයට මෙම සම්මානය හිමිවීම සමස්ත වරාය සේවක මහත්ම මහත්මීන් ලැබූ ජයග්‍රහණයක් ලෙස මම දකිනවා. මහපොළ ආයතනයේ සියලු සේවක මහත්ම මහත්මීන්ගේ කැපවීම හා දායකත්වය තුළින් මෙම ජයග්‍රහණය කරා එළඹීමට අපිට හැකිවුණා. කම්කරු අමාත්‍යාංශය වාර්ෂිකව සංවිධානය කරනු ලබන Social Dialog & workplace Cooperation Aword 2019 සම්මාන උළෙල දිවයිනේ ප්‍රමුඛතම ආයතන අතර ඉහළම තත්වයේ ගුණාත්මක නිර්ණායකයන් සැලකිල්ලට ගනිමින් මෙම සම්මාන ප්‍රදානය සිදු කරනු ලබනවා. එහිදී අපට ලෝකඩ සම්මානය දිනා ගැනීමට හැකිවීම තුළ අපගේ පුහුණු පාඨමාලා පිළිබඳ සෑහීමකට පත්වීමේ අවකාශය අපිට හිමිවෙනවා. ඒ වගේම හෙට දවස වඩා යහපත්ව මේ සඳහා මුහුණ දීමට අවශ්‍ය ශක්තිය මේ සම්මානයෙන් අපිට හිමිවෙනවා.

# ජාත්‍යන්තර කාන්තා දිනය නිමිති කරගනිමින්

## ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි අභිමානවත් සැමරුම් උළෙලක්





ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව පසුගියදා විශේෂ උත්සවයක් මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනයේ ලලිත් ඇතුලත්මුදලි ශ්‍රවණාගාරයේ දී සංවිධානය කෙරිණි. ශ්‍රී ලංකා වරාය අධිකාරිය සේවා වනිතා ඒකකයේ පුරෝගාමීත්වයෙන් පැවැති මෙම ජාත්‍යන්තර කාන්තා දින සැමරුමෙහි තේමාව වූයේ 'ඇය දිරිමත් - රට සවිමත්' යන්නයි.

මෙම සැමරුම් උත්සවය විචිත්‍රවත් කිරීම සඳහාත්, එයට සුවිශේෂි වටිනාකමක් ආදේශ කිරීම සඳහාත් විශේෂාංග රැසක් එක් කර තිබූ අතර, රුක්රෝපණ වැඩ සටහන ඒ අතර කැපී පෙනුණි. එමෙන් ම ෂ් රක්ෂණ සමාගම මගින් පැවැත්වූ අභිප්‍රේරණ වැඩසටහන, පොලිස් මාධ්‍ය අංශය මගින් පැවැත්වූ විශිෂ්ට කාන්තාවක් වැඩසටහන, විලංගු නම් නාට්‍යමය ජවනිකාව ඇතුළු වැඩසටහන් රැසකින් මෙම උත්සවය වර්ණවත් වි ය.





මෙම අවස්ථාවට සහභාගි වූ ශ්‍රී ලංකා වරාය අධිකාරිය සභාපති ජෙනරල් දයා රත්නායක මහතා සභාව අමතමින් සිය සුභාසිංශන එක් කළ අතර, ලෝක කාන්තා දිනයට සමගාමීව කොළඹ වරායේ වැඩසටහන් රැසක් දියත් කළ බවත්, මෙම රුක්රෝපණ වැඩසටහන ද එහි ප්‍රධාන අංගයක් ලෙස සැලකීම කාන්තාව මූලික කරගත් සමාජයක පරිසරයට දක්වන ගෞරවාදරයක් බැව් පැවසීය. ලෝක කාන්තා දිනය නමින් දිනයක් නම්කර තිබුන ද, ශ්‍රී ලාංකේය සමාජය තුළ සෑම දිනකම මව සහ කාන්තාව වෙත හිමිවන්නේ සුවිශේෂි ස්ථානයක් බවත්, අප අනාදිමත් කාලයක සිට කාන්තාවට මූලික තැන ලබා දී කටයුතු කරන පිරිසක් බැව් අවධාරණය කළේ ය. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රගමනය වෙනුවෙන් කාන්තාවන් ලබා දෙන දායකත්වය ඉතා වැදගත් බවත්, එය නිරන්තරයෙන් ආයතනික ඵලදායීතාව වෙනුවෙන් අවශ්‍ය වන බවත් සඳහන් කළේ ය.

එම අවස්ථාවේ දී සභාව ඇමතූ සේවා වනිතා ඒකකයේ සභාපතිනී දමයන්ති රත්නායක මහත්මිය, උසස් හමුදා නිළධාරියෙකුගේ බිරිය වශයෙන් ඔහුගේ ජයග්‍රහණ සඳහා ඔහුට ලබාදුන් ශක්තිය මේ අවස්ථාවේ දී සියළු දිරිය කතුන්ට උදාහරණයක් සපයන බැව් පැවසී ය.





# කොළඹ වරාය

## සුහුරු වරායක් කිරීමේ වැදගත්කම

සටහන - ප්‍රභාෂනී දිලූපා චන්ද්‍රසිරි

ශ්‍රී ලංකාව ලෝකයේ සුවිශේෂී ස්ථානයක පිහිටා තිබීම හේතුකොටගෙන විවිධ වරප්‍රසාද රැසක් ස්වභාව ධර්මයෙන්ම දායාද වී ඇත. මැදපෙරදිග හා ඈත පෙරදිග රටවල් යා කෙරෙන නාවික වෙළෙඳ ගමන් මාර්ගයක්, සුදුසු නැංගුරම් පලවල් සහිත වෙළඳ තීරයක් පැවතීම හේතුකොටගෙන ජාත්‍යන්තරයේ නිබඳ සොයාබැලීමකට ලංකාව යටත් විය. මෙහි වාසිදායක තත්ත්වය තේරුම්ගත් පැරැන්නන් ලංකාව රටවල් අතර භාණ්ඩ ප්‍රවාහනය කරන ප්‍රධාන මධ්‍යස්ථානයක් ලෙස නිර්මාණය කිරීම ආරම්භ කළහ. 14 වන සියවසේදී ශ්‍රී ලංකා දකුණු වෙරළ තීරයේ නාවික කටයුතුවල වර්ධනයක් පෙන්නුම් කළ අතර ඒ හා සමගාමීව බටහිර වරායත් දියුණුවට පත්විය. පසුකාලීනව ජාත්‍යන්තර වෙළඳාමේ කීර්තියට ශ්‍රී ලංකාව පත්වනුයේ කොළොම්තොට හෙවත් කොළඹ නැව් තොට හේතුකොටගෙනය.

ඉන්දීය සාගරයේ නැගෙනහිර හා බටහිර යා කරන මුහුදු මාර්ගයේ ප්‍රධාන උපාය මාර්ගික වරාය ලෙස කොළඹ වරාය ලොව 26 වන ස්ථානය හිමිකරගෙන ඇත. වාර්ෂික බහාලුම් ධාරිතාවය මිලියන 4.1 ක් වන මෙහි මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් 4.8 කි. ශ්‍රී ලංකාව තුළ ලිහන ලද නැව් බඩු හැසිරවීමේ බලය ලත් එකම ආයතනය වන ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ කොළඹ වරාය පරිපාලන කටයුතු සිදු වන අතර දිනකට නැව් බඩු ඒකක 600 කට වඩා මුදාහරින ප්‍රධාන පර්යන්ත තුනකින් සමන්විත වරායක් ලෙස කොළඹ වරාය හඳුනාගත හැකිය .ශ්‍රී ලංකා වරාය අධිකාරිය ආරම්භ වී මේ වන විට වසර හතළිහක් පමණ වන අතර වරායට පිවිසීමේදී සිදු කරනු ලබන ආරක්ෂක කටයුතුවල පටන් අනෙක් සියළුම කටයුතු වරාය අධිකාරිය මඟින් සිදු කරනු ලැබේ.

නවීන තොරතුරු තාක්ෂණය උපයෝගී කරගනිමින් කාල උපයෝජනයට වැඩි වටිනාකමක් ලබා දෙමින් එදිනෙදා කාර්යයන් කාර්යක්ෂමව හා කඩිනමින් ඉටු කරගැනීමේ නූතන සමාජ ප්‍රගමනය තුළ ජාත්‍යන්තර තරඟකාරීත්වයට මුහුණ දීම සඳහා කොළඹ වරාය සුහුරු වරායක් බවට පත්කිරීමේ වැඩපිළිවෙළ ඉතා වැදගත් ය. ආයතනික සම්පත් අවභාවිතයට ලක් වීමට ඉඩ නොදී සඵලදායි වැඩ පරිසරයක් ආයතනය තුළ ක්‍රියාත්මක කරගැනීම සඳහාත් ආයතනයේ ලාභ උපරිම කිරීමේ අරමුණු ඉටුකරගැනීම සඳහාත් සුහුරු වරාය සංකල්පය බෙහෙවින් ඉවහල් කරගත හැකිය.

> කොළඹ වරාය සුහුරු වරායක් කිරීමේ ව්‍යාපෘතිය තුළ වරාය දොරටු ස්වයංක්‍රියකරණ පද්ධතියක්, අංගන ස්වයංක්‍රියකරණ පද්ධතියක්, පර්යන්ත ස්වයංක්‍රියකරණ පද්ධතියක්, ප්‍රධාන මාර්ග, බුද්ධි තොරතුරු මෙවලම්, වෙබ් අඩවි නිර්මාණය ඉතා වැදගත්ය

සුහුරු වරායක ප්‍රධාන ලක්ෂණය වන්නේ සම්පත් හැසිරවීම පරිගණක හා තොරතුරු තාක්ෂණයේ ප්‍රමුඛතාවය මත සිදු වීමයි. මෙහිදී වරාය තුළ කාර්යක්ෂම පාරිභෝගික හා සේවක ප්‍රජාව සඳහා ඵලදායී ලෙස තොරතුරු හුවමාරුව විධිමත්ව සිදු කර ගැනීමට හැකියාව ලැබේ. තාක්ෂණය භාවිතය නිසා තොරතුරු සන්නිවේදනය සීඝ්‍රතාව මත වැඩ කටයුතු පහසුවෙන් ඉටුකර ගැනීමට හැකියාවක් ලැබේ.

කොළඹ වරාය සුහුරු වරායක් කිරීමේ ව්‍යාපෘතිය තුළ වරාය දොරටු ස්වයංක්‍රියකරණ පද්ධතියක්, අංගන ස්වයංක්‍රියකරණ පද්ධතියක්, පර්යන්ත ස්වයංක්‍රියකරණ පද්ධතියක්, ප්‍රධාන මාර්ග, බුද්ධි තොරතුරු මෙවලම්, වෙබ් අඩවි නිර්මාණය ඉතා වැදගත්ය. මෙහිදී භාණ්ඩ හැසිරවීම, ඉන්වොයිස් ඇණවුම්, අනුමැතින් ලබාගැනීම, ඩිජිටල් අත්සන් භාවිතය, ගෙවීම් කටයුතු, e තාක්ෂණය ඔස්සේ සිදු කරමින් මුදල් කළමනාකරණය, තොගබඩු, මෝටර් රථ මෙහෙයුම්, ඍජු බෙදාහැරීම් සේවක නිවාඩු යැවීම් ආදී බොහෝ කටයුතු සිදුකළ හැකිය. දැනට වරාය තුළ සිටින සේවකයන් හට කිසිදු බලපෑමකින් තොරව වරාය වෙත නැවක් පැමිණීමේ සිට වරායෙන් පිටතට ප්‍රවාහනය කිරීම තෙක් සියලු ක්‍රියාදාමයන් සිදු කළ හැකිය.

අතින් කළ යුතු අධික ප්‍රමාණයක ලේඛනගත කිරීම්, වැරදීම් මගහරවා ගනිමින් e – docs මගින් ඉතා කඩිනමින් හා පහසුවෙන් සේවා ලබාගැනීමට හා ලබාදීමට හැකියාව ඇත. මෙයින් සේවක හා පාරිභෝගික යන පාර්ශව දෙකෙහිම කාලය ඵලදායීව හසුරුවාගැනීමට හැකි වන අතර ජාත්‍යන්තර නැව් සමාගම් සමඟ නිරන්තරයෙන් කටයුතු කරන නිසා ඊට ඔබින ලෙස ලිපි ලේඛන ජාලගත කිරීම තුළින් කඩිනම් සේවයක් ලෝකයට ලබාදීමට හැකියාවක් ඇත .

Barcode සහ GPS උපාංග සවි කිරීම හරහා භාණ්ඩ නිශ්චිතව හඳුනාගැනීමට මෙන්ම (කන්ටේනර් පෙට්ටි) තිබෙන තැන් හා අනුපිළිවෙල නිවැරදි හඳුනා ගැනීමට හැකියාව ලැබේ. මෙයින් ගොඩබෑමේ දී හා ගේට්ටු අවහිරතා අවම කර ගැනීමට හැකියාව ලැබෙන අතර ඊ- ගේට්වේ අවසර පත් හා ඍජුවම ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙතින් විමසීම් කිරීම සඳහා යොදාගත හැකි ස්මාර්ට් දුරකථන මෘදුකාංග ඇතුළු ප්‍රධාන පෙළේ තාක්ෂණයන් හරහා කාර්යයන් වඩාත් පහසු වේ.

වරාය ප්‍රජාව වෙනුවෙන් සැලසුම් කෙරුණු නැව් බඩු කළමනාකරණ පද්ධතිය (CMS) මගින් සේවා ඉල්ලුම්, අන්තර්ජාලය හරහා ගෙවීම්, (ඔන්ලයින්) හා යාත්‍රා නැංගුරම් ලෑම් පිළිබඳ තත්ත්ව විස්තර වැනි පරිපාලන කාර්යයන් ගණනාවක් ඉටු කිරීමට හැකියාව ලැබේ. මේ සියල්ල SMS හා e - mail මගින් කිරීම විශේෂත්වයකි. නැව් බඩු ලාභීන්ට මිනිත්තු 5ක් ඇතුළත තම ඉන්වොයිස් නිර්මාණය කරගනිමින් වරාය අධිකාරියේ අනුමැතිය ලබාගත හැකි අතර එය පැරණි ක්‍රමයට වඩා බෙහෙවින් නිවැරදි හා කාර්යක්ෂම ක්‍රමයකි. මෙමගින් රටේ ඕනෑම තැනක සිට විද්‍යුත් ක්‍රමවේදය ඔස්සේ ලිපිලේඛන කඩිනමින් ඉදිරිපත් කිරීමේ හැකියාව පාරිභෝගිකයන්ට ලැබේ.

ශ්‍රී ලංකා රේගුව හා වරාය අතර නැවු බඩු කළමනාකරණ කටයුතු ඩිජිටල් තාක්ෂණය ඔස්සේ සිදුකිරීමෙන් දත්ත සැකසුම් කාලය හා ආයතන අතර ගමන් කිරීමේදී දත්ත අවභාවිතාවට ඇති ඉඩකඩ අඩුකරගත හැකිය. වරාය අධිකාරිය වෙනුවෙන් කරන ගෙවීම් කටයුතු පහසු කිරීමට නැව් බඩු කළමනාකරණ පද්ධතිය සමඟ රාජ්‍ය බැංකු දෙකක් හා පෞද්ගලික බැංකු තුනක් තොරතුරු තාක්ෂණය ඔස්සේ සම්බන්ධ කිරීමෙන් පාරිභෝගික කටයුතු වඩාත් කාර්යක්ෂම කරගත හැකිය.

වරාය අධිකාරිය සතු ගබඩාවල ත්‍රිමාන (3D) දර්ශන ලබාදීම මගින් විවෘත කිරීමේ ක්‍රියාවලියට පෙර ගබඩාවේ ඉඩකඩ නැව් බඩු සඳහා වෙන්කිරීමට මෙහෙයුම්කරුවන්ට අවස්ථාව සැලසේ. එයින් ඕනෑම ගබඩාවක් තුළ ඇති ඉඩකඩ පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබාගැනීමට ද මෙහෙයුම්කරුවන්ට අවස්ථාව ලැබේ.

කෙසේ වෙතත් වර්ධන වේගය අතින් ශ්‍රී ලංකාව ගෝලීය මුහුදු වරායන් අතර ඉහළ තලයකට සීඝ්‍රයෙන් ගමන් කිරීමත් සමඟ, උසස් තාක්ෂණ භාවිතයන් කොළඹ වරාය පද්ධති කටයුතු සඳහා යොදාගැනීම තුළින් ජාත්‍යන්තර තරඟකාරීත්වයට මුහුණදීමට ඇති අපහසුතාව මගහැරී යනු ඇත. නැව් බඩු හැසිරවීමේ ගෝලීය මධ්‍යස්ථානයක් ලෙස කොළඹ වරාය තවදුරටත් රඳවා ගැනීමට නම් පවතින තාක්ෂණයන් තව තවත් විධිමත් හා ක්‍රමවත් කිරීම පිළිබඳ අවධානය යොමුකළ යුතුය.

# ගණකාධිකාරී කතුවරයා
# රොෂාන් විජේසිංහ

සංලාපය -දිලක්ෂි නයනිකා ජයවීර

ආත්මය සුවපත් කිරීමේ කලාව ලෙසින් කතුවරයා විසින් හඳුන්වා දෙන "ජීවිතයට යෝධ පිම්මක්......" කෘතිය පසුගියදා එස් ගොඩගේ ආයතනයේදි එළි දැක්විණි. ධනාත්මක චින්තනය මෙන්ම පෞරුෂත්ව වර්ධනය හා සම්බන්ධ ඉතා වටිනා කරුණු රාශියක් අඩංගු මෙය රෝෂන් නිශාන්ත විජේසිංහ ගේ නවතම ග්‍රන්ථයයි. ඔහු ශ්‍රී ලංකා වරාය අධිකාරියෙ මුදල් කොට්ඨාශයෙ සහකාර ගණකාධිකාරිවරයෙන්. මේ ඔහු සමග තීර්ථ කරපු සංවාදය.



**ඔබ මෙම ග්‍රන්ථය හඳුන්වා දෙන්නේ කොහොමද?**

ජීවිතය ඔහේ ගෙවා දැමීමට වඩා යමක් මේ ජීවිතය තුළ ඇති බව කියාදෙන හා ඒ වටිනාකම් සොයා යාමට ඔබට පාර කියාදෙන පොතක්.

**ඇයි ඔබ මෙවැන්නක් ලියන්න හිතුවෙ?**

බොහෝ කාළයක් තිස්සේ හිතේ පැවතුන අධිෂ්ඨානයක්. ලෝකය පුරා දිනෙන් දින දියුණුවට පත්වන මිනිසුන් ඇසුරුකරන මේ දැනුම අපේ රටේ මිනිසුන්ටත් ලබාදිය යුතුයි කියලා මම හිතුවෙ බොහෝ කලකට පෙර. ජාත්‍යන්තරව ලියවුනු පොත්පත් රාශියක් මම කියවලා තියෙනවා. ඒ වගේම මෙවැනි දැනුම ලබාදෙන වැඩසටහන් රාශියකට මං සහභාගී වෙලා තියෙනවා. ඒ සියල්ලටමත් වඩා මෙම නවතම දැනුම තුලින් මගේ ජීවිතය ආලෝකවත් කරගෙන තියෙනවා. මං හිතුවා ඒ ආශ්‍රය කරගෙන අපේ මිනිසුන් වෙනුවෙන් සිංහල භාෂාවෙන් පොතක් ලියන්න ඕන කියලා.

**ඔබ මේ ග්‍රන්ථය තුළින් ඉලක්ක කරගන්නෙ කුමන පිරිසක්ද?**

වඩාත්ම බලාපොරොත්තු වන්නෙ තරුණ පරපුරට මේ දැනුම ලබාදෙන්න. ඔවුන් තමයි රටේ අනාගතය. ඔවුන් ධනාත්මකවීම මුලු රටම ධනාත්මක වීමක් ලෙසයි මං දකින්නෙ. ඒත් වැඩිහිටියන්ටත් මේ දැනුම බොහොම ප්‍රයෝජනවත් වෙනවා. සත්තකින්ම වයස් බේදයක් නෑ. ඊට අමතරව ව්‍යාපාරික පිරිසට මේ පොතෙන් යමක් ලබාගන්න පුලුවන්.

**ඔබ මුලින්ම කිව්වෙ තරුණ පරපුර ගැන. ඇත්තටම ඔවුන් ධනාත්මක නැද්ද?**

නැහැ. මට ඒක පැහැදිලි කරන්න හරිම ලේසියි. අලුත් පරම්පරාවෙ ජනප්‍රිය ගීත කීපයක් අහලා බලන්න. මේවා නිකම්ම නිකං ඇඬියාවල්. මේ වගේ සිංදු කාලයක් තිස්සෙ අහනවා කියන්නෙ තරුණයන්ගෙ ජීවිත කාලකණ්ණි වෙලාම යනවා. අලුත් දෙයක් හිතන්න හයියක් නැතිවෙනවා. සත්තකින්ම ඔවුන් අඬන්නන් පිරිසක් බවටම පත්වෙනවා.


**එහෙම වෙන්නෙ කොහොමද? සරලව පැහැදිලි කලොත්....?**


ඇත්තටම ඒක සරලයි. ඍණාත්මක.... එහෙමත් නැත්නං බැට්එසඩැ දේවල් ඇසුරු කරනවා කියන්නෙ අපේ හිතත් ඒ අදහස් වලට හුරුවෙනවා. අපේ හිත, අපි උඩු හිත සහ යටි හිත කියලා කොටස් දෙකකට බෙදනවා. අපි නිතර ඇසුරු කරන උඩුහිතෙන් හිතන දේවල් කාලයක් තිස්සෙ සිදුවෙනකොට ඒක යටි හිතේ පුරුද්දක් ලෙසින් තැන්පත්වෙනවා. මේ පුරුදු ඉවත් කරන එක ලේසි වැඩක් නෙවෙයි. එයාට (ඒ කියන්නෙ යටි හිතට) කිසිවක් තේරුම්කරලා දෙන්න ඔබට බෑ. ඒකයි අපි කියන්නෙ වැරදි පුරුදු ඇතිකරගන්න එපා කියලා.

**ඔබ කතාවක් අයුරිනුයි මේ දැනුම ලබාදෙන්නෙ.....?**

ඔව්. ඒකෙන් බලාපොරොත්තු වුනේ කියවීමේදී ඇතිවන ඒකාකාරී බව නැතිකිරීම. මං හිතනවා ඒක සාර්ථකයි කියලා.




ඔබ අධ්‍යාත්මික කරුණු රාශියක් මේ පොතෙන් සාකච්ඡා කරනවා කියලයි මට දැනුනෙ.

ඒක සත්‍යයක්. පොතේ අග භාගයේදි සම්පූර්ණයෙන්ම කතාකරන්නෙ අධ්‍යාත්මික කරුණු ගැන. සෑම ආගමකම කියවෙන සැබෑ සත්‍යය ස්පර්ශ කරන්නයි මං මෙතනදි උත්සාහ කරන්නෙ. ඒ වගේම ඒ දේවල් සරල භාෂාවෙන් පැහැදිලි කරන්නත් මං වගබලා ගත්තා.

**ඔබ අතින් ලියවුනු වෙනත් ග්‍රන්ථ මොනවද?**

මගේ මුල්ම නවකතාව" කෙලෙස්බර" 2017 දි හොඳම අත්පිටපත විදියට සම්මානයට පාත්‍ර වුනා. ඒ වගේම මම "හිම කන්දේ සුරතලිය " නමින් පරිවර්තනයක් කරලා තියෙනවා. මුහුණු පොතේ මං කවි ලියනවා. එයින් කොටසක් එකතු කරලා "මැටි පිඬක් මම" නම්වූ කවි පොතක් එළි දැක්වූවා. එළෙසම නොබෝ දිනකින් මගේ දෙවැනි නවකතාව ප්‍රකාශයට පත්වීමට නියමිතයි.

**අවසාන වශයෙන් ......... ඔබේ නිර්මාණ පිළිබඳව ඔබ තෘප්තිමත්ද?**

ඒක බොහොම සංකීර්ණ දෙයක්. කාලයත් එක්ක අපි වෙනස්වෙනවා. අද අපේ මානසිකත්වය නෙවෙයි හෙට තියෙන්නෙ. මොහොතින් මොහොත වෙනස්වෙනවා. ඉතිං පොතක් ලියනකොට හිටපු පුද්ගලයා නෙවෙයි ඊට පස්සෙ ඉන්නෙ වෙනස'ම චරිතයක්. "ජීවිතයට යෝධ පිම්මක්" පොතේ මේ කාරණාව මං හොඳින් පැහැදිලි කරලා තියෙනවා. ඉතිං මීට කලින් කරපු දෙයක් අපි නැවත බලද්දි සියයට සියයක් තෘප්තිමත් වෙන්නෙ නෑ. ඒත් ඒක අසතුටක් නෙවෙයි.

# හෙට ලොව කිරුළු දරනා විශිෂ්ටයන් ඇගයේ...

හෙටලොව කිරුළ පලඳින්ට වෙර දරන දක්ෂයින් අතරේ විශිෂ්ටයින් දෙදෙනෙකුට ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් පසුගි- යදා විශේෂ ඇගැයුමකට ලක්කෙරිණි. මෙලෙස ඇගැයුමට ලක් වූයේ,

2019 වසරේ අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස්පෙළ විභාගයට නව නිර්දේශය යටතේ ගණිත අංශයෙන් පෙනී සිට දිවයිනේ ප්‍රථමයා වූ කොළඹ ආනන්ද විද්‍යාලයේ ඉගෙනුම ලැබූ තරුෂ ඩිහාන් ෆොන්සේනා හා 2019 වසරේ අධ්‍යාපන පොදු සහතිකපත්‍ර විභාගයට ගණිත අංශයෙන් පැරණි විෂය නිර්දේශයෙන් දිවයිනේ ප්‍රථමයා වූ පින්නවල මධ්‍ය මහා විද්‍යාලයේ ඉගෙනුම ලැබූ දර්ශණ ඉසුරුසිරි සම්පත් යන දරුවන් දෙදෙනාය. වරාය හා නාවික





කටයුතු ගරු රාජ්‍ය අමාත්‍ය කණක හෙරත් මහතා හා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමණාකාර අධ්‍යක්ෂ අතුල හේවාවිතාරණ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අතිරේක කළමණාකාර අධ්‍යක්ෂ උපාලි සොයිදා යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙටන් රාජ්‍ය අමාත්‍ය කාර්යාලයේ දී මෙම කෙටි චාම් උත්සවය පැවැත්විනි.

මෙහිදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනයට අනුගතව ප්‍රායෝගික හා න්‍යාත්මකව වරාය ක්ෂේත්‍රය පිළිබඳ විශේෂ පුහුණුවක්, ශ්‍රී ලංකා ජාතික විශ්වවිද්‍යාල පද්ධතියට අනුගතව උසස් අධ්‍යාපන හදාරණතෙක් නොමිලේ ලබා දීමටත්, පුහුණු කාලසීමාව තුළ නොමිලේ දිවා ආහාරය හා මාසික මූල්‍ය දීමනාවක් ලබා දීමට ද තීරණය විය.

## துறைமுக அபிவிருத்தி இராஜாங்க அமைச்சர் கனக ஹேரத் அவர்களின் கொழும்பு துறைமுகத்தின் கண்காணிப்பு விஜயம்



துறைமுக அபிவிருத்தி இராஜாங்க அமைச்சர் கனக ஹேரத் அவர்கள் கொழும்பு துறைமுக விசேட கண்காணிப்பு பயணமொன்றை அண்மையில் மேற்கொண்டார். கொழும்பு துறைமுகத்தின் தற்போதைய நிலை பற்றிய தகவல்களை பெற்றுக்கொள்ளும் நோக்கில் இப்பயணம் மேற்கொள்ளப்பட்டமை குறிப்பிடத்தக்கது.

கொழும்பு துறைமுக விரிவாக்கல் திட்டத்தின் கீழ் நிர்மாணிக்கப்பட்ட அலைதாங்கி, கிழக்கு முனையம், கட்டுப்பாட்டு மத்திய நிலையம், ஜய கொள்கலன் கட்டுப்பாட்டு நிலையம் ஆகியவை அமைச்சரின் விசேட கவனத்திற்கு கொண்டுவரப்பட்டன. அங்கு கொழும்பு துறைமுகத்தின் எதிர்கால அபிவிருத்தி நடவடிக்கைகள் குறித்து, மேலதிக முகாமைத்துவப் பணிப்பாளர் உபாலி த சொய்ஸா அவர்கள் அமைச்சர் அவர்களுக்கு விளக்கியுள்ளார்.

இந்நிகழ்வுகளில் துறைமுக அபிவிருத்தி இராஜாங்க அமைச்சரின் செயலாளர் N.P.V.C. பியதிலக்க அவர்களும் கலந்துகொண்டமை குறிப்பிடத்தக்கது.


## குப்பைகளற்ற துறைமுகமாக கொழும்பு துறைமுகத்தை துப்பரவு செய்யும் மாபெரும் வேலைத்திட்டம்



கொழும்புத் துறைமுகத்தை குப்பைகளற்ற துறைமுகமாக மாற்றும் நோக்குடன், மாபெரும் தூய்மையாக்கல் வேலைத்திட்டம் கொழும்பு துறைமுகத்தின் சகல ஊழியர்களினதும் பங்களிப்புடன் துறைமுக வளாகத்தில் மிகச் சிறப்பாக இடம்பெற்றமை குறிப்பிடத்தக்க விடயமாகும்.

துறைமுகங்கள், கப்பற்றுறை மற்றும் வீதி, நெடுஞ்சாலைகள் அபிவிருத்தி அமைச்சர் ஜோன்ஸ்டன் பெர்னாண்டோ அவர்களின் எண்ணக்கருவுக்கமைய செயற்படுத்தப்பட்ட இத்துப்புரவாக்கும் வேலைத்திட்டத்தினூடாக, தூய்மையான குப்பைகளற்ற துறைமுகமாக மாற்றுவதற்கு எதிர்பார்த்துள்ளோம்.

துறைமுக ஊழியர்கள், சேவை பெறுநர்கள் துறைமுக வளாகத்தில் தங்கியுள்ள கால எல்லையில் சிரமங்கள் இன்றி இருக்கக்கூடிய மனோரம்மியமான, மனதிற்கினிய சூழலை கட்டியெழுப்புவதே, தமது அபிப்பிராயமாகுமென இவ்வேலைத்திட்டத்தின் கண்காணிப்பு பயணத்தில் இணைந்து கொண்ட அமைச்சர் கருத்து தெரிவித்தார்.



# கொழும்பு துறைமுகத்தின் வரலாறு

உலகின் மிக முக்கிய கேந்திர இடத்தில் இலங்கை அமைந்துள்ளது. மத்தியகிழக்கு நாடுகளையும் தூர கிழக்கு நாடுகளையும் இணைக்கின்ற கடல்வழி வியாபார மார்க்கம் நாட்டுக்கு அண்மையிலே உள்ளது. அத்தோடு நங்கூரம் இடுவதற்கு பொருத்தமான கரையோர தளங்கள் இலங்கையில் காணப்படுகின்றன. இதனால் இந்த கடல் வழிப் பாதையின் ஊடாக பயணித்த வியாபாரிகளும் ஏனைய கடற் பயணிகளும் பண்டைய காலத்திலிருந்தே இந்த அழகான தீவை நேசித்தார்கள். மானசீகமாக இணைந்திருந்தார்கள். எமது பண்டைய அரச புத்திரர்களும் கூட வெளிநாடுகளுடன் தொடர்பை கட்டியெழுப்புவதற்காகவும் பொருட்களையும் சேவைகளையும் பரிமாறிக் கொள்வதற்காகவும் கடல்வழி நடவடிக்கைகளுடன் அதிகம் தொடர்புபட்டிருந்தனர். அதன்படி பதிமூன்றாம் நூற்றாண்டு வரை மன்னார் துறை என்கின்ற மாந்தோட்டை (மஹாதித்த) பிரதான துறைமுகமாக பயன்படுத்தப்பட்டது. அதன் பிறகு பல்வேறு காரணங்களினால் கோக்கன்ன (திருகோணமலை), ஜம்புகோளப்பட்டினம் (காங்கேசன்துறை), ஊராதோட்ட (ஊர்காவற்றுறை), அம்பலந்தொட (கொடவாய), இலங்கை பட்டணம், காலித்துறை போன்ற துறைமுகங்கள் பயன்படுத்தப்பட்டன.

இப்னு பதூதா எனும் நாடுகாண் பயணி தெவிநுவர துறைமுகத்திலிருந்து காலி துறைமுகம் வரை கடல்வழியாக வருகை தந்ததாக குறிப்பிடப்படுவதோடு அப்போது கொழும்புதுறை வளர்ந்த ஒரு நகரைக் கொண்ட ஒரு பிரதான துறைமுகமாக காணப்பட்டதாகவும் மேலும் குறிப்பிடப்படுகின்றது. அப்படியாயின் பத்தாம் நூற்றாண்டின் நடுப்பகுதியிலிருந்து பன்னிரண்டாம் நூற்றாண்டு வரையான காலப்பகுதியில் கொழும்பு துறைமுகம் முன்னேற்றம் அடைந்த நிலையில் இருந்ததாக நம்பப்படுகிறது. அரபு வியாபாரிகளின் பின்னர் ஆரியச் சக்கரவர்த்திகளின் கீழ் இவ்வாறு கொழும்பு துறைமுகம் முன்னேற்றம் அடைந்ததாகவும் இங்கு வியாபார நடவடிக்கை அரபு வியாபாரிகளினால் தொடங்கி வைக்கப்பட்டதாகவும் கூறப்படுகின்றது. கோட்டை இராசதானி யுகம் வரைக்கும் கொழும்பு துறைமுகம் இப்படி பிரபலம் வாய்ந்த சர்வதேச வர்த்தக கேந்திர நிலையமாக பயன்படுத்தப்பட்டு வந்துள்ளது.

1506 ஆம் ஆண்டில் கோவாவிலிருந்து கொழும்பு துறைமுகத்தை நெருங்கிய லொரென்சோத அல்மேதா தலைமையிலான 9 கப்பல்களில் போர்த்துகேய படையினர் கோட்டையை ஆட்சி செய்த முதலாவது விமலதர்மசூரிய அரசனின் அனுமதியின் பேரில் கொழும்பு துறைமுகத்தில் இறங்கி பின்னர் அங்கு வர்த்தக களஞ்சியம் ஒன்றையும் தேவஸ்தானம் ஒன்றையும் நிறுவி ஒரு கோட்டையை கட்டினார். பறங்கியர் கொழும்பை லோரன்ஸோ துறை என்றே அழைத்தனர். அன்றிலிருந்து, ஒன்றரை நூற்றாண்டுகள் கொழும்பு துறைமுகம் அடங்கலாக இலங்கையின் கரையோரம் போர்த்துக்கேயர்களால் ஆட்சி செய்யப்பட்டது. 1658 ஆம் ஆண்டில் இங்கு வந்த ஒல்லாந்தர்கள் போர்த்துக்கேயர்களைத் துரத்தி விட்டு கொழும்புக் கோட்டை நகரம் மற்றும் துறைமுகத்தைக் கைப்பற்றி மேலும் ஒன்றரை நூற்றாண்டுகள் ஆட்சி செய்தனர். 1796 இல் ஒல்லாந்தர்களையும் திருகோணமலையில் ஆட்சியில் இருந்த பிரான்ஸ் படையினரையும் துரத்தி விட்டு நாட்டுக்குள் நுழைந்த ஆங்கிலேயர்கள் 1815 இல் கொழும்பு துறைமுகத்தை முக்கிய கேந்திர நிலையமாகக் கொண்டு முழு இலங்கையையும் தமது கட்டுப்பாட்டுக்குள் கொண்டு வந்தனர்.

(தொடரும்)

**By - M.F.F. Farzana**



වරාය අධිකාරියේ සේවා සැපයුම් කොට්ඨාශයේ සේවය කළ කේ.ජී.එස්. ලක්ෂමන් මහතා සේවයෙන් විශ්‍රාම ගත් දා ...



වරාය අධිකාරියේ සේවා සැපයුම් කොට්ඨාශයේ සේවය කළ එම්.කේ. විජේරත්න මහතා සේවයෙන් විශ්‍රාම ගත් දා ...



වරාය අධිකාරියේ මුදල් කොට්ඨාශයේ සේවය කළ ඩී.එම්. තිලකනන්ද මහතා සේවයෙන් විශ්‍රාම ගත් දා ...



වරාය අධිකාරියේ සාම්ප්‍රදායික නැව්බඩු අංශයේ සේවය කළ පී.සී. පෙරේරා මහතා සේවයෙන් විශ්‍රාම ගත් දා ...



වරාය අධිකාරියේ සේවා සැපයුම් කොට්ඨාශයේ සේවය කළ ඩී. තිලකරත්න මහතා සේවයෙන් විශ්‍රාම ගත් දා ...



වරාය අධිකාරියේ ආරක්ෂක කොට්ඨාශයේ සේවය කළ කේ.ආර්. කරුණාරත්න මහතා සේවයෙන් විශ්‍රාම ගත් දා ...



වරාය අධිකාරියේ ජය බහලු පර්යන්තයේ සේවය කළ ඩබ්.ජී.එස්. ෆොන්සේකා මහතා සේවයෙන් විශ්‍රාම ගත් දා ...



වරාය අධිකාරියේ ආරක්ෂක කොට්ඨාශයේ සේවය කළ එස්.ජේ. ජයසූරිය මහතා සේවයෙන් විශ්‍රාම ගත් දා ...



වරාය අධිකාරියේ විශේෂ වැඩ පරීක්ෂක අංශයේ සේවය කළ එච්.ජී.පී. පෙරේරා මහතා සේවයෙන් විශ්‍රාම ගත් දා ...



වරාය අධිකාරියේ ආරක්ෂක කොට්ඨාශයේ සේවය කළ යූ.එල්. පද්මසිරි මහතා සේවයෙන් විශ්‍රාම ගත් දා ...



වරාය අධිකාරියේ ජය බහලු පර්යන්තයේ සේවය කළ එම්.එස්. පෙරේරා මහතා සේවයෙන් විශ්‍රාම ගත් දා ...



වරාය අධිකාරියේ නියමු ස්ථානයේ සේවය කළ වී.පී. විජේදාස මහතා සේවයෙන් විශ්‍රාම ගත් දා ...



වරාය අධිකාරියේ ජය බහලු පර්යන්තයේ සේවය කළ කේ.ඩී.එස්. ආනන්ද මහතා සේවයෙන් විශ්‍රාම ගත් දා ...



වරාය අධිකාරියේ සුභ සාධක කොට්ඨාශයේ සේවය කළ අනුලා පද්මසිරි මහත්මිය සේවයෙන් විශ්‍රාම ගත් දා ...



ගාල්ල වරායේ ආරක්ෂක කොට්ඨාශයේ සේවය කළ රංජිත් ගුණසේකර මහතා සේවයෙන් විශ්‍රාම ගත් දා ...



වරාය අධිකාරියේ සිවිල් ඉංජිනේරු කොට්ඨාශයේ සේවය කළ ඩී.එල්. ගෝමස් මහතා සේවයෙන් විශ්‍රාම ගත් දා ...



වරාය අධිකාරියේ සිවිල් ඉංජිනේරු කොට්ඨාශයේ සේවය කළ ජී.ඒ. කුලරත්න මහතා සේවයෙන් විශ්‍රාම ගත් දා ...



වරාය අධිකාරියේ නියමු ස්ථානයේ සේවය කළ ගමගේ මහතා සේවයෙන් විශ්‍රාම ගත් දා ...



වරාය අධිකාරියේ සිවිල් ඉංජිනේරු කොට්ඨාශයේ සේවය කළ ලක්ෂ්මන් පෙරේරා මහතා සේවයෙන් විශ්‍රාම ගත් දා ...



වරාය අධිකාරියේ ජය බහලු පර්යන්තයේ සේවය කළ කේ.ඩී. සුනිල් මහතා සේවයෙන් විශ්‍රාම ගත් දා ...



වරාය අධිකාරියේ තොරතුරු පද්ධති කොට්ඨාශයේ සේවය කළ අයි.එන්. ගුණවර්ධන මහතා සේවයෙන් විශ්‍රාම ගත් දා ...



වරාය අධිකාරියේ ප්‍රවාහන අංශයේ සේවය කළ එල්. අබේකෝන් මහතා සේවයෙන් විශ්‍රාම ගත් දා ...



වරාය අධිකාරියේ ඉංජිනේරු කොට්ඨාශයේ සේවය කළ ඩබ්ලිව්.ඒ.ඒ. ජයරත්න මහතා සේවයෙන් විශ්‍රාම ගත් දා ...



වරාය අධිකාරියේ බණ්ඩාරනායක තටාකයේ සේවය කළ ඩබ්ලිව්.ඩී. අමරසේන මහතා සේවයෙන් විශ්‍රාම ගත් දා ...

15 පිටුවෙන්

## පහන් කණුවක.....

වටපිටාවම හොඳින් දිස්වේ. කළුතර බෝධිය ද, සමනල කන්ද ද, කොළඹ තුඩුව ද, ඈත දියඹ ද මනස්කාන්තය. පොල් රුප්පාවෙන් ප්‍රදීපාගාර හා මුහුදෙන් වටවූ දූපත ඉහළ සිට බලන්නෙකුට ත්‍රාසය මුසු සොඳුරු හැඟීමක් ගෙන දෙයි.

මම - අපි එහෙනම් බහිමු පහලට ... ජගත් මහත්තයා අපි ආයෙමුකුත් තියෙනවද බලන්න.

ඔව්.. ඔව්.. යමු පහළට මෙකෙන් වතුර ස්ටොක් කරලා තියෙන ටැංකි දෙන ඒක තියෙන්නේ පොළව යට එකක් අඩි අටක් විතර උසයි. තනිකරම කළු ගලෙන් බැඳලා තියෙන්නේ. ඉහළ කොටස ආරුක්කුවක් වගේ පහළට බසින බව ඔහු පැවසී ය.

මේ තියෙන්නේ ටැංකි දෙක. මේ වහලෙන් එන වැහි වතුර කෙලින්ම මේකට ඇවිල්ල පිරෙනවා. අපි බොන්නෙත් මේ වතුර. එය සැබවින්ම විස්මිත නිර්මානයකි.

දූපත අසල තොටුපළේ ඇති ආරක්ෂිත කොටස සුරක්ෂිත ප්‍රදේශයකි. එය තථාකයක් බඳුය අපි සැම දෙනාම එහි බැස නෑවෙමු. ගමනේ විඩාව එයින් තුරන් විය. මෙය සංවර්ධනය කලහොත් සංචාරක තෝතැන්නකි. කුඩා දුරක් බෝට්ටුවකින් ගොස් දූපතක විනෝදවීමට කවුද අකමැති... එම පරිසරය එතරම්ම සුන්දරය.

අපි නැවත ප්‍රදීපාගාරයට යන විට ජගත් මහතා ඇතුළු පිරිස අපිට තේ සූදානම් කොට තිබුණි. ෆෑන් කේක් හා තේ බී ජගත් මහතාට ඔහුගේ සහයකයින්ට ද සමුදී අපි ගුරුපාර දිගේ පල්ලම් බැස්සේ ඔවුන්ට සුභ පතමිනි. ජගත් මහතා ද අපි සමග ජැටියට පැමිණියේ ය.

බේරුවෙල ප්‍රදිපාගාරය අමතක කළ නොහැකි සොඳුරු ඉසව්වකි. එහි ජගත් මහතා ඇතුලු පිරිස ගත කරන කටුක සොඳු ජීවිතය අගය කළ යුතුය. හාබර මාස්ටර් තුමණී. මේ ඔබේ අවධානයටයි.



ලෝක කාන්තා දිනයට සමගාමීව ම්බුද්ධ ජයන්ති පරිශ්‍රයේ පැවැති රුක්රෝපණ වැඩසටහනට එක් වෙමින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ජනරල් දයා රත්නායක මහතා විසින් පැලයක් සිටුවා එයට සත්කාර කරන අවස්ථාව. එහි දී අදහස් දැක් වූ සභාපතිතුමා, පරිසරයේ තුළිතතාවය නංවාලීමට දායකත්වය ලබාදීම යුගයේ කාර්යභාරයක් බවත්, ඒ සඳහා සියලු දෙනාගේ සහයෝගය ඉතා වැදගත් වන අතර, ඒ සඳහා ද කාන්තාවට සුවිශේෂි වගකීම් රැසක් ඇති බව පැවසීය.

23 පිටුවෙන්

## වරාය පරිශ්‍රයන්හි....

පසුගියදා මගීන් 1952 කින් හා 872 ක කාර්ය මණ්ඩලයකින් සමන්විතව කොළඹ වරායට ලඟා වූ Sun Princess නෞකාව සහ සංචාරක මගින් 2470 ක් සහ 1425 ක කාර්ය මණ්ඩලයකින් සමන්විත Queen Mary 2 නෞකාව, හා සංචාරක මගීන් 583 කින් හා 366 ක ගේ කාර්ය මණ්ඩලයකින් සමන්විතව කොළඹ වරායට ලඟා වූ Boudicca නෞකාවේ පැමිණි මගින් හා කාර්ය මණ්ඩලය ද මෙම විශේෂ නිරෝධායන වැඩසටහනින් පරීක්ෂාවට ලක්කෙරිණි.

එහිදි Boudicca නෞකාවේ කපිතාන් Mikael Degerlund මහතාගේ ඇරයුමෙන් වරාය සභාපති ජෙනරල් දයා රත්නායක මහතා ප්‍රමුඛ උසස් නිලධාරීන් කණ්ඩායමක් නෞකාව තුළ විශේෂ පිළිසඳරකට ද එක්විය. එහිදී අදහස් දක්වූ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති දයා රත්නායක මහතා,

කොරෝනා වෛරසය සමග ඇති අභියෝග ජය ගැනීමට සියලු පාර්ශව සමග එකතු වී ජාත්‍යන්තර ප්‍රමිතියට අනුගතව සියලු කටයුතු සම්පාදනය කිරීමට කොළඹ වරාය ප්‍රමුඛ වරාය අධිකාරිය ලෙසින් ඇප කැප වන බැව් අවධාරණය කළේ ය.

සංචාරක මගී නෞකාවන්ගෙන් පැමිණෙන විදෙස් සංචාරකයින් සඳහා ශ්‍රී ලාංකේය අනන්‍යතාවය පදනම් කරගත් සමරු තිළිණ, තෑගි භාණ්ඩ, අලෙවිසැල් නිරීක්ෂණයට ද සභාපති දයා රත්නායක මහතා එක්විය.

37 පිටුවෙන්

## වරාය සේවක හද දිනූ ....

ලැබී තිබේ. මේ අනුව සාමාජිකයාට වැඩි මුදලක් ඉතිරි කර ගැනීමටත්, ඒ හරහා වැඩි ප්‍රතිලාභ බුක්ති විඳීමටත් අවකාශ ලැබී ඇත. මෙය නව පරිගණක පද්ධතිය ක්‍රියාත්මක කිරීමේදී ක්‍රියාත්මක කරනු ලැබේ.

ඉදිරියේදී ණය රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර ඇති අතර මේ සඳහා අරමුදලක් ගොඩනඟා ගැනීම වෙනුවෙන් ණය පොලී ආදායමෙන් 2%ක මුදලක් වෙන් කරමින් ණය ආරක්‍ෂණ අරමුදලක් පිහිටුවා ඇත.

තවද ඉදිරියේදී කෙටිකාලීන ණය හා ක්ෂණික ණය වැඩි කිරීමටද සැලසුම්කර ඇත.

මෙම සමිතියේ උන්නතිය උදෙසා ගොඩනැගිලි සහ අනෙකුත් පහසුකම් සැපයීම වරාය අධිකාරිය මඟින් සිදු කරනු ලබන අතර ඒ සඳහා සමිතිය වෙනුවෙන් කෘතඥතාවය පිරිනමන බව සභාපතිතුමා පවසයි. සමිතිය බෝට් හවුස් ගොඩනැගිල්ලේ පළමු මහලේ නව කාර්යාල පරිශ්‍රයට මෙම වසරේ සැප්තැම්බර් මාසයේ සපැමිණි අතර එහිදී අතහිත දුන් වරාය අධිකාරියේ සියලුම පාර්ශවයන්ට සමිති අධ්‍යක්ෂ මණ්ඩලය හා කාර්ය මණ්ඩලය වෙනුවෙන් ප්‍රණාමය පුද කරන ලදී. මීට අමතරව සමිතියට මඟ පෙන්වන සමුපකාර දෙපාර්තමේන්තුවේ කොමසාරිස්තුමා ඇතුලු කාර්ය මණ්ඩලය, සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලය හා නන් අයුරින් සහය දෙන සියලු ආයතන කාර්ය මණ්ඩල සඳහා ස්තුතිය පල කිරීමටද ඔහු අමතක නොකලේය.

වරාය අධිකාරියේ සේවකයින්ගේ ජීවන කාර්යයන් සඳහා සහන සලසමින් ඔවුන්ට ඇප උපකාර සිදුකිරීම වෙනුවෙන් තීර්ථ තුලින් ඔවුන්ට අප ස්තුතිය පිරිනමන අතර තවතවත් සේවා සහ සහන සැලසීමට ඔවුන්ට හැකිවේවායි ප්‍රාර්ථනා කරමු.

# කොළඹ වරාය ට නව ග්‍රැන්ට්‍රි දොඹකර ත්‍රිත්වයක්



පසුගිය රජය විසින් ඉදිකිරීමට සැලසුම් කළ ජයබහලු අදියර V ක්‍රියාත්මක නොවුන ද ඒ සඳහා අවශ්‍ය ග්‍රැන්ට් දොඹකර 3ක් ආනයනයට කටයුතු යොදා තිබුණේ ජයබහලු පර්යන්තයේ ඊට අදාල කිසිඳු ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකළ තත්වයකදීය. ජයබහලු පර්යන්තයේ අවශ්‍යතාවයන් ට සරිලන ලෙසින් ඇනවුම් කළ මෙම දොඹකර නැගෙනහිර පර්යන්තයට කිසිසේත් යෝග්‍ය නොවන තත්වයක් තුළ එම දොඹකර නැගෙනහිර පර්යන්තයේ පළමු අදියර පරිශ්‍රයේ ගොඩබෑමට කටයුතු යොදන ලදි.

නැගෙනහිර පර්යන්තය ඉදිකර තිබියදීත් පසුගිය රජය විසින් එමගින් කිසිඳු මෙහෙයුම් ඵලදායිතාවයක් උදෙසා යොදා නොගැනීමට කටයුතු කරමින් එම පරිශ්‍රය අමතකර කර අතහැර දමන ලද ප්‍රදේශයක් සේ වසර 05 ක කලායක් නොසලකා කටයුතු කළ වකවානුව මුලිනුපුටා දමමින් නැගෙනහිර පර්යන්තය නිසි ලෙසින් ක්‍රියාත්මක වනතුරු මෙම ග්‍රැන්ට්‍රි දොඹකර යොදා ගනිමින් මෙහෙයුම් ක්‍රියාවලිය යාවත්කාලීන කිරීමට කටයුතු යොදා තිබීම සමස්ථ වරාය අධිකාරියේම චිරජීවනයට සවියක් ම වනු ඇත.

සමුද්‍රීය කලාපයේ තරගකාරී සලාලා, ඩුබායි, සිංගප්පූරු ආදී වරායයන් සමග උරෙන් උර ගැටෙමින් කටයුතු කරමින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු වැඩිම ගැඹුරකින් යුතු පරියන්තය ලෙසින් නැගෙනහිර පර්යන්තය සිය මෙහෙයුම් ආදිපත්‍ය හොබවන ජයග්‍රාහී අවස්ථාව තෙක් සඵලදායි මෙහෙයුම් ක්‍රියාවලියක් ඔස්සේ සහෝදර පරියන්ත වල දායකත්වය ද සමගින් කොළඹ වරාය සමුද්‍රීය කලාපයේ ම ඔසවා තැබීමට මෙම පියවර ශක්තියක් වනු ඇත.

# වරාය සේවක හද දිනූ
# සී/ස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක සුභසාධක සමූපකාර සමිතිය




සටහන -සන්ධ්‍යා විතාන

දහදිය දුක් සුසුම් අතරින් ජීවිතය සොයා යන කම්කරු ප්‍රජාවගේ ජීවිත නගාලීමේ අරමුණෙන් ආරම්භ කරන ලද සුළු පරිමාණයේ මූල්‍ය ආයතනයක් පසු කාලීනව සමස්ථ සේවක ප්‍රජාවගේම විශ්වාසය හා ගෞරවය දිනාගනු ලබන්නේ ය. වරාය කොමිෂන් සභාවේ සේවය කළ සේවක පිරිස ඉලක්ක කරමින් ආරම්භ වූ මෙම ණය දෙන සමිතිය අද දවසේ වරාය අධිකාරියේ සමස්ථ සේවක ප්‍රජාවගේම නොමඳ ආදර ගෞරවයට පාත්‍ර වීමට තරම් භාග්‍යවන්ත විය.

සී/ස/සේවක සුභසාධක සමූපකාර සමිතිය නම් වූ එහි ආරම්භය වූයේ 1943 නොවැම්බර් 23 දිනය. එදා සාමාජිකයින් 13 දෙනෙකුගෙන් ආරම්භ වූ මෙම සමිතියේ වත්මන් සාමාජිකයින් සංඛ්‍යාව 3600 ක් දක්වා ව්‍යාප්තවීම තුළ එහි ප්‍රගතිය අපට සාක්ෂාත් වේ. මේ වන විට එහි මුළු වත්කම් ප්‍රමාණය මිලියන 380 කි. සමුපකාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවත්වාගෙන යන මෙම සමිතිය ශ්‍රී ලංකාවේ සමුපකාර සඳහා වූ ජාතික කාර්යසාධක 2010 තරගාවලියෙන් ලෝකඩ සම්මානයකින් පිදුම් ලබා ඇත. ඒ සමස්ථ කාර්යය ඇගයීම වෙනුවෙනි.

සෑම සාමාජිකයින් 100 දෙනෙකුට එක් අයෙක් බැගින් සියලුම වැටුප් කාර්යාල ආවරණය වන පරිදි සමස්ථ සාමාජිකත්වය නියෝජනය වන ලෙස නිලවරණයකින් මහසභා නියෝජිතයින් තෝරා පත් කර ගනී. එම මහසභා නියෝජිතයින් අතුරින් 9 දෙනෙකු වාර්ෂික මහසභා රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට තෝරා ගනු ලැබේ. එහි වත්මන් සභාපති ලෙස එස්.එස්.පී. මැදවත්ත මහතා ද, ඩී.එම්.ජේ. බණ්ඩාර මහතා ලේකම් ධූරයේ ද උපසභාපති ලෙස කේ.ඩබ්.එල්. සිල්වා මහතාද කටයුතු කරනු ලබයි.



අධ්‍යක්ෂ මණ්ඩලය ලෙසින් එච්.ඒ.ඩී.එස්. සත්‍යජිත් මයා, බී.ඒ.එන්. කොඩිකාර මයා, ඩබ්.ඒ. ගාමිණී පෙරේරා මයා, ඒ.පී.ජී. රූපිකා මහත්මිය, එම්.එච්.පී. රුවන්චන්ද්‍ර මහතා, ඩබ්.ජී. වීරතිලක මහතා කටයුතු කරනු ලබයි. මෙහි සේවක මඩුල්ල වරායේ සේවක මහත්ම මහත්මීන් නොවන අතර සමූපකාර ක්ෂේත්‍රයේ සහ මූල්‍යමය ක්ෂේත්‍රයේ අත්දැකීම් සපිරි විශිෂ්ටයින් රැසක් සුදුසුකම් මත එහි තනතුරුවල නිරත වේ. ගණකාධිකාරී පී.ඩී.කරුණාරත්න මහත්මියද ඇතුලුව සේවක මණ්ඩලය 10 දෙනෙකුගෙන් සමන්විත වේ.

වරාය අධිකාරියේ ස්ථිර සේවකයින්ට කිසිඳු ගාස්තුවක් ගෙවීමකින් තොරව මෙහි සාමාජිකත්වය ලබා ගත හැකි අතර ඒ සඳහා සමිතියේ රු.100/-ක් වටිනා කොටසක් මිලදී ගත යුතු වේ. එය විශ්‍රාම යාමේදී ආපසු ලබා ගත හැක. මාසිකව අයවන මුදල ස්ථාවර තැම්පත් රු.500 ක්, සාමාන්‍ය ඉතිරි කිරීම් රු.100ක් සහ විශ්‍රාම ආධාර රු.05ක් ලෙස සාමාජිකයාගේම තැන්පතු ගිණුම්වලට බැර කරනු ලැබේ. ආකර්ෂණීය පොලියක් ලබා දෙන බැවින් මෙම මුදල් සාමාජික අවශ්‍යතාවය මත වැඩි කර ගත හැක.

මෙම සමිතියේ විශේෂත්වය වන්නේ නව සාමාජිකයින්ට ද සාමාජික වූ දිනයේම දිනට රු.20,000/-ක ණයක් ලබා ගැනීමට ඇති හැකියාවයි. මීට අමතරව වටිනා තිළිණයක්ද ලබා දෙනු ලැබේ.

**ණය සැපයීමේ ක්‍රමවේදය**

වසර 5ක උපරිම කාලයකට ලබා දෙන කෙටිකාලීන ණය මාස 6ක සාමාජික කාලයක් සම්පූර්ණ කල සාමාජිකයින්ට රු.100,000/- දක්වාද, වසර 3ක සාමාජික කාලයක් සම්පූර්ණ කල සාමාජිකයින්ට රු.200,000/- දක්වාද ලබා ගත හැක. මේ සඳහා ඇපකරුවන් දෙදෙනෙක් අවශ්‍ය වේ.

රු. 100,000/-ක ක්ෂණික ණය මුදල වාරික 20ක උපරිම කාලයකට ලබා දෙන අතර වාරික 03 ක් පමණ අයවීමෙන් පසු නැවත අළුත්කල හැකි වීම මෙම ආයතනයෙන් සාමාජිකයින්හට ලබා දෙන සුවිශේෂී සහනයකි.

සිංහල හා දමිළ අලුත් අවුරුද්ද, රාමසාන් සමය හා නත්තල් සමය පදනම් කරගෙන ලබා දෙනු ලබන පාරිභෝගික ණය සාමාජිකයකුට අවුරුද්දකට එකවරක් පමණක් ලබාගත හැකි වන අතර, මාස 10 ක් ඇතුලත අයකර ගැනීම සිදුවේ.

ඉහත කිසිඳු ණය මුදලක් ලබා ගෙන නොමැති සාමාජිකයින්ට ධනයෝජන ගිණුමෙන් 90%ක ණයක් ලබා ගැනීමට හැකියාව ඇත.

මීට අමතරව ස්ථිර තැන්පතුවල ආයෝජනය කර ඇති සාමාජිකයන්ට තමාගේ ස්ථිර තැන්පතු ඇපයට තබා ඉන්

90%ක් ණය ලබා ගැනීමට හැකියාව ඇත.

සමිතියේ තවත් විශේෂත්වයක් වන්නේ තැන්පතු සඳහා ආකර්ෂණීය පොලියක් ලබා දීමය. ඒ අනුව

වයස අවුරුදු 50ට වැඩි සාමාජිකයින් සඳහා හඳුන්වා දී ඇති ජ්‍යෙෂ්ඨ පුරවැසි ස්ථිර තැන්පත් ගිණුම සඳහා 12%ක පොලියක් ලබා දෙන්නේ විශ්‍රාම යාමට නියමිත සාමාජිකයා ඉතිරියට පෙළඹවීමත්, වැඩි ප්‍රතිලාභයක් ලබා දීමත් සඳහායි.

සාමාන්‍ය වාර්ෂික ස්ථිර තැන්පතුවක් සඳහා 11.5%ක පොලියකුත්, සය මාසික ස්ථිර තැන්පතුවක් සඳහා 10% ක වාර්ෂික පොලියකුත් ලබාදෙන අතර ධනයෝජන තැන්පත් සඳහා පොලිය 9% ක් හා සාමාන්‍ය තැන්පත් පොලිය 5% ක් වේ. සාමාජිකයාගෙන් අය කරන විශ්‍රාම ආධාර මුදල සාමාජිකයා විශ්‍රාම යාමේදී සම්පූර්ණයෙන්ම ලබා දෙන අතර එක් වසරකට රු.250/- බැගින් සාමාජික කාලය වර්ෂ ගණන සඳහා වන වටිනාකම සමිතිය මඟින් ප්‍රධානය කරනු ලැබේ.

එමෙන්ම සෑම වසරකම සාමාජිකයින් සඳහා තිළිණ පිරිනැමීම ද මෙම මූල්‍ය ආයතනයේ තවත් විශේෂත්වයකි.

දැනට භාවිතා කරන පරිගණක පද්ධතියට වඩා ස්වයංක්‍රීය පරිගණක පද්ධතියක් තුළින් සාමාජික සේවාවන් කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය කටයුතු මේවනවිටත් සැලසුම් කර ඇත.

වසර ගණනාවක සිට මුදල් කොට්ඨාශයෙන් කරන ලද ඉල්ලීම්වල ප්‍රතිපලයක් ලෙස 9%ක පොලියක් ලබා දෙන ධනයෝජන ගිණුම සඳහා අයකර ගන්නා මුදල 60% සීමාවට ඇතුළත් කර නොග ැනීමට මුදල් කොට්ඨාශයෙන් අනුමැතිය

36 පිටුවට..

# කාව්‍යාංජලී

## අත්හැරීම හා සැනසීම

බදා වැළඳගත් ජීවිතය
දමා යා නොහැකිව ලතැවෙන
දහසකුත් එකක් ජීවයන් අතර
ඔබ,
තවත් එකම එක ජීවයක් පමණමයි
දයාබර සොයුරිය,
බදා වැළඳගැනීම නොව
අත්හැරීමට
වැළඳගනු හැකිනම්
උතුම් වූ නිවීම හා සැනසීම
එහිම නොවන්නේද...

කේ. කසුනි පෙරේරා
කැළණිය විශ්ව විද්‍යාලය

## දොඹකර ලියන්

මහ සමුදුර තරම් දරු සෙනෙහස මාගේ
පපුවට තුරුළු වූ නුඹ හැර ලා ආවේ
ගත දැඩි නොවූවත් සිත දැඩි වූ යාමේ
දිරියට සවිය එක් වූ දිවියයි මාගේ

උස් අඩි දහස් ගණනක් මා පිය නැග්ගේ
සරිකර ලන්න දිවි මංපෙත නුඹලාගේ
අත් පා වෙව්ළුවද වැඩ කරනා තාලේ
තනියට ඉන්නෙ යකඩයි සුළඟයි මාගේ

ලැබුනත් මිල මුදල් ඇති සැටියෙන් කාලේ
කෙරුවේ පිරිමි සමගින් වැඩ හරි තාලේ
පැසුසම් නොලැබුනද වැඩි වැඩියෙන් දෝසේ
සියුමැලි දෙයත් මට නොදැනිම රළු වූයේ

නැව්තොට නුඹය අප දිවිමග සරු කෙරුනේ
සිරිලක අසිරි මවමින් ලොව රජ කෙරුනේ
දොඹකර ලියක ඇති මහිමය ලොව රැඳුනේ
සුරැකිව බලා දෙනු මැන ලියකගෙ වරුණේ

ලක්මාල් පොතුහැර

## නව මඟ....

රාත්‍රී අහස දෙස බලා
හිරු නැතිදෝ සිතුනා......
දහවල අහස දෙස බලා
සඳ නැතිදෝ සිතුනා....
ඉපල් මත මල්
ඇතිදෝ සිතුනා...
මල් පිපෙන්නේ
සිත් තුළ දෝ සිතුනා...

වින්ද්‍යා වරකාගොඩ

## කාලය මැවූ අරුමය

හිරු රැස් පහස විඳිනට
අනෙකුත් අතුර පරදවා
ඉහළට විහිදුන අතු අග
සුවදැති, සුසිනිදු, සියුමැලි
පුංචිම පුංචි මල් පොහොට්ටුවක්
නටුවෙන් එබී විමසිලිමත්ව..
බැලුවා.....
දුටුවා......
අඳුරින් පිරුනු ගස මුල
පහළට පහළ අත්තක
පෙති ද විසිරි බිමට බත්ව
වියැලි, වියැකී, මැලවුණු මලක්
නටුවෙන් ගිලිහී යන්නට දරන තැත....

අනුෂා පෙරේරා
මානව සම්පත් කොට්ඨාශය

## පිය සෙනෙහස

මග බලා ඈත නුවන් හැම විට
පාර අද්දර මායිමේ
දකින විට දරුවන්ගෙ මුනිවත
දසන් සතුටින් පෙනේ
හද ගැබෙහි පිරී ඉතිරුණු
මහමෙරක් වන පිය සෙනේ
මෙලොව කාහට දිය හැකි ද
පියවරුන් මෙන් දරු සෙනේ
ඈත නොපෙනෙන දුරක ගමනක්
ඔබ ගියත් අද සැඟවිලා
තාම බලනවා ඔබ එතැයි
චූටි දුවෙ මගෙ කිය කියා

නදීශා නිලන්ති
වෛද්‍ය කොට්ඨාශය

## නිල නිවාස ශෝකාලාපය

ගාලු නැව්තොටට එන දුර බැහැර සිට
නොයෙකුත් ගැටළු ඇති දනවෙන සරණයට
ඉදිකල දොලොස් නිවහන් පෙළ විනාසෙට
යනහැටි දුටිමු කන්දෙන කිසිවකුත් නැත

දියසීරා බේරී ඇති සැටි දුටුවා
බිත්ති පලාගෙන ගස් පැලවී ඇතුවා
මිනිසුන් නොමැති නිවහන් වල තතු ඇසුවා
වගකිවයුතු අයෙකු නෙත නොගැටුනු සැටියා

ඉදිකළ පුරෝගාමීන් අද නැතත් මෙහී
සිටියානම් ඔවුන් වැලපෙයි දුකින් නිති
ඇත්ත දැන නැනත් මුනිවත රකින රිසී
කුමට එවන් තනතුරු කිසි වැඩක් නැති

නැව්තොට අසල රූමස්සල බිම් තිරේ
ජපන් සාම වෙහෙරෙහි සමුදුර පාරේ
මනරම් සිත්තමකි රළියන එන වාරේ
කවුරුන් හෝ පැමිණ මෙය විසඳනු රාලේ

මේ නිවහන් නැවත තිබු ලෙස හදන්නට
ලක්‍ෂ ගණන් ඕනෑවෙයි සොයන්නට
මේ අපරාධ මතුවට ඇති නොවන්නට
සිතුවිලි කවිවුනා ඔබ නෙත ගැටෙන්නට

තිලකා ආරියරත්න
ගාල්ල වරාය

## ලඳුනි

නුඹට මතකද එදා
පිදු සෙනේ ආදරෙන්
ලංවෙලා මුළු හදින්
ලොවම අමතක කරන්...

ඇයි ගියේ වෙන හදට
කඳුළු දී මගේ නෙතට
නතුවෙන්න ඔහු පෙමට
අඩුවුනේ කිම නුඹට...

තටු සිඳුන කිරිල්ලක
වෙලා නුඹ හඬනවද
බඹර තුඩ විස බවට
පසක් වෙනවාද අද ...

ශ්‍රීමති කුමාරි ජයකොඩි
වාද්දුව


මේ කුරුල්ලන් අත
එවන්නද මගෙ
හීන ඔක්කොම
කිචි බිචිය ඇහුණම
මතක් වේවිද
මට මතක බව
අත නොහැර සදහට
ඉන්න බව
මං දන්න හින්දම
ජීවිතේ දවසක
පිපෙන බව දන්නවා
මල් අපි වට

\- දිමුතු -

නිවැරදි කිරීමයි...

පසුගිය කලාපයේ 'මගේ සඳ' නමින් පල වූ කාව්‍ය නිර්මාණය සුභාණී නානායක්කර නමින් පල වූයේ තාක්‍ෂණික දෝෂයක් නිසා බැවි කාරුණිකව දැනුම් දෙමි.






දරුවෙකුගේ මුල් ළමාවිය සංවර්ධනය එම දරුවාගේ මතු දියුණුවේ ආයෝජනයක් වන්නේය. කවර හෝ දේශයක වුව ළමා පෙළ එරටේ මතු අනාගතය නියෝජනය කරන්නේය. නිර්මාණාත්මක සන්නිවේදන කුසලතා ඔප් නංවාලමින් දරුවාගේ පෞරුෂය ඔප් නංවාලීම අතිශයින් වැදගත් වන්නේ එහෙයිනි. ශ්‍රී ලංකා වරාය අධිකාරිය දාරකාගාරය මෙම කටයුත්තෙහි ලා ප්‍රමුඛතාවය ගෙන කටයුතු කරන්නේ එබැවිණි. මේ වාර්ෂික ප්‍රසංගයේ දී දාරකාගාරය දූ පුතුන් සිය දස්කම් කරලියේ රඟදැක් වූ අපූර්වත්යයි.













**හේනක වැඩ කරන අය**
ජනනි බිනෝදා / 8 වසර
ආනන්ද බාලිකා විද්‍යාලය -මරදාන



**වෙල්යාය**
දෙව්නිත රුහාන් / 3 වසර
තල්ගස්මෙවේ ක.විද්‍යාලය - ගම්පහ



**ගං ඉවුර**
එසඳි මෙන්තකී / 4 වසර
දෙනියාය මාධ්‍ය. විද්‍යාලය - මාතර



**මුහුදු වෙරළ**
කවීජ රන්තිලු / 1 වසර
උඩුපිල ප්‍රා. විද්‍යාලය - දෙල්ගොඩ



**ගම්බද දර්ශනයක්**
සිනෙත් තාරක / 6 වසර
ශාන්ත ලුසියා විදුහල -කොටහේන



**වන අසිරිය**
සෙනෙත් දිමන්ත / 6 වසර
රාජකීය විද්‍යාලය -කොළඹ



**මුහුදු වෙරළ**
ගෙහන්සා අරුණාදි / 1 වසර
කළුතර බාලිකා ජාතික පාසල -කළුතර




**කාටුන් චරිතයක්**
ඔමින්දි සදෙව්නා / 8 වසර
ශාන්ත පාවුළු බා. විද්‍යාලය

# මුහුදු මාවතේ සොඳුරු ඉසව්ව

# කොළඹ වරාය ඉපැරණි තතු

සටහන - එච්.ඒ.ඩී.ඩබ්. හෙට්ටිආරච්චි

ශ්‍රී ලංකාව ලෝකයේ සුවිශේෂී තැනක ස්ථානගත වී ඇති දූපතකි. මැද පෙරදිග සහ ඈත පෙරදිග රටවල් යා කෙරෙන නාවික වෙළෙඳ ගමන් මාර්ගය ඇත්තේ ශ්‍රී ලංකාවට ආසන්නව ය. එසේම සුදුසු නැංගුරම් පළවල් සහිත වෙරළ තීරයක් ශ්‍රී ලංකාවේ පවතී. මෙනිසා ඈත අතීතයේ පටන්ම මෙම නාවික මගේ ගමන්ගත් වෙළෙන්දන් සහ අනිකුත් නාවිකයෝ මේ සුන්දර දිවයිනට ඇලුම් කළහ. සිත් ලොබ බැඳගත්හ. අතීත රජ දරුවෝද රට රටවල් අතර සබඳතා ගොඩනගා ගැනීම සඳහාත්, භාණ්ඩ හා සේවා හුවමාරුව සඳහාත්, නාවික කටයුතු කෙරෙහි තදින් බැඳී සිටියහ. ඒ අනුව 13 වැනි සියවස දක්වා මන්නාරම් තොට නොහොත් මාන්තොට (මහාතිත්ථ) ප්‍රධාන වරාය ලෙස භාවිතයට ගත්හ. ඉන්පසු නොයෙකුත් හේතූන් මත ගොකණ්ණ (ත්‍රිකුණාමලය), ජම්බුකොළ පටුන (කන්කසන්තුරය), ඌරාතොට (කයිට්ස්), අම්බලන්තොට (ගොඩවාය), ලංකා පටුණ, ගාලු තොට යන නැව් තොට භාවිතයට ගෙන තිබේ.

ඉබන් බතූතා නම් දේශ ගවේෂකයා දෙව්නුවර වරායේ සිට ගාල්ල නැව් තොට දක්වා නාවික ගමනක පැමිණි බව සඳහන් කරන අතර ඒ වන විටත් කොළොම්තොට දියුණු නගරයක් සහිත ප්‍රධාන නැව් තොටක්ව තිබූ බව හෙතෙම පවසයි. එනම්, 10 වැනි සියවස මැද භාගයේ සිට 12 වැනි සියවස අතර කාලයේදී කොළඹ නැව් තොට දියුණු තත්ත්වයකට පත්ව තිබූ බව පවතින විශ්වාසයයි. අරාබි වෙළෙඳුන්ගෙන් පසුව ආර්ය චක්‍රවර්තීන් යටතේ කොළොම්තොට දියුණු වූ බවත්, මෙහි වෙළඳ කටයුතුවල ආරම්භය අරාබි ජාතික වෙළෙඳුන් අතින් සිදුවූ බවත් කියනු ලැබේ. කෝට්ටේ රාජධානිය පැවැති යුගය දක්වා මෙසේ කොළොම්තොට ජාත්‍යන්තර වෙළඳ කේන්ද්‍රස්ථානයක් වශයෙන් භාවිත කර ඇත.

1506 වසරේදී ගෝවේ සිට කොළොම්තොටට ළඟාවන ලොරෙන්සෝද අල්මේදාගේ නායකත්වයෙන් යුත් නැව් 9 ක පෘතුගීසි බළකාය කෝට්ටේ රජ කළ පළමුවන විමලධර්මසූරිය රජුගේ අවසරය මත කොළොම්තොටට ගොඩබැස පසුව එහි වෙළෙඳ ගබඩාවක් සහ දේවස්ථානයක් තනා බළකොටුවක් ද එහි ගොඩනැංවී ය. පරංගීන් කොළොම්තොට හැඳින්වූයේ ලෝරන්ස් තුඩුව ලෙස ය. එතැන් පටන් සියවස් එකහමාරක් දක්වා කොළොම් නැව් තොට ඇතුළු ශ්‍රී ලංකාවේ මුහුදු බඩ තීරය පාලනය කරන ලද්දේ පෘතුගීසීන් විසිනි. 1658 වසරේදී මෙහි පැමිණි ඕලන්ද (ලන්දේසි) ජාතිකයන් පෘතුගීසීන් පලවා හැර කොළඹ බල කොටුව, නගරය හා නැව් තොටේ බලය අල්ලා ගනිමින් තවත් සියවස් එකහමාරක් පාලන බලය ගෙන ගියහ. 1796 දී ඕලන්ද හා ත්‍රිකුණාමලයේ පැවැති ප්‍රංශ බලය පලවා හැර රටට ඇතුළු වූ ඉංග්‍රීසීහු 1815 දී ශ්‍රී ලංකාව මුළු මනින්ම යටත් කරගනු ලැබුවේ කොළඹ නැව් තොටද තම පාලන බලයේ කේන්ද්‍රස්ථානය බවට පත්කරමිනි.

මේ අනුව, රෝමානු-ඊජිප්තු හා ග්‍රීක ජාතිකයන්ගේ බසින් "තැප්‍රොබේනය" ලෙසද අරාබි ජාතිකයන්ගේ හැඳින්වීමට අනුව "සෙරන්ඩිබ්" ලෙසද පෘතුගීසීන්ගේ හැඳින්වීමට අනුව "සයිලෝ" හා ඕලන්ද කරුවන්ගේ බසින් "සයිලාන්" යනුවෙන්ද ඉංග්‍රීසීන් හැඳින්වූ "සිලෝන්" වදනින්ද ලොව පුරා ප්‍රකට වූ ශ්‍රී ලංකාව ජාත්‍යන්තර කීර්තියට පත්වූයේ කෙළොම්තොට මුල්කරගෙන බව පැහැදිලි ය.

පැරැණි රජ දවස සිට 1875 වර්ෂය දක්වා කොළොම් තොට ස්වාභාවික වරායක් විය. අරාබි වෙළෙඳුන්, ආර්ය චක්‍රවර්තීන්, පෘතුගීසීන්, ලන්දේසීන් හා ඉංග්‍රීසීන් වැඩිකලක් මෙසේ කොළඹ වරාය ස්වාභාවික පිහිටීම අනුවම භාවිතයට ගත්හ. එහෙත් නිරිත දිග මෝසම් සුළඟේ බලපෑම නිසා සිදුවන අනතුරු හා අලාභද, විශාල නැව් සඳහා නුසුදුසු වීම හේතුවෙන් ද කොළඹ වරාය පුළුල් කර නවීකරණය කිරීමට බ්‍රිතාන්‍ය පාලනයට සිදුවිය. මේ වනවිට ගාල්ල හා කොළඹ වරාය යන දෙකම ඉංග්‍රීසීන් විසින් ආනයන අපනයන කටයුතු සඳහා භාවිත කරමින් තිබිණි. අවසානයේදී ශ්‍රීමත් හර්කියුලීස් රොබින්සන් ආණ්ඩුකාරවරයාගේ තීරණයක් අනුව කොළඹ වරාය සංවර්ධනය සඳහා අනුමැතිය පළවිය. ඒ අනුව 1875 දෙසැම්බරයේදී කොළඹ වරාය කෘත්‍රිම වරායක් බවට පත් කරමින් බ්‍රිතාන්‍ය කිරුළ හිමි වේල්ස් කුමරු අතින් නිරිත දිග දියකඩනය සඳහා මුල්ගල් තැබිණි. 1885 දී එම දියකඩනය ද, 1906 දී ඊසාන දිග දියකඩනය ද, 1912 දී තවත් දියකඩන කොටසක් එකතු කිරීමෙන් පසු අක්කර 640 ක කෘත්‍රිම වරායක් බවට කොළඹ වරාය පත් විය. මේ වනවිට මීටර් 9 ක් වරාය ගැඹුරු කර තිබූ බැවින් බර නැව් පවා කොළොම්තොටට පැමිණියේ ය. මේ අනුව යටත් විජිත සමයේදී කොළඹ වරාය ලොව තිබූ වරායන් අතර හත්වන ස්ථානයටත් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ තුන්වැනි තැන ගත් වරාය බවටත් පත් වූ බව වාර්තාවල සඳහන් වේ. බ්‍රිතාන්‍යයන් විසින් දිගින් දිගටම සංවර්ධනය කරමින් පැවතුණු කොළඹ වරාය 1912 දී ඇවිල ගිය පළමු ලෝක යුද්ධය හා 1939 දී ඇවිල ගිය දෙවැනි ලෝක යුද්ධය හමුවේ දැඩි බාධාවන්ට හා බලපෑම්වලට ලක්විණි.

මේ අනුව දෙවන ලෝක මහා යුද සමයේදී බ්‍රිතාන්‍යයන් විසින් භාවිතා කරන ලද දෙවන විශාලතම ස්වභාවික වරාය මෙය වන අතර කෙසේ හෝ 1946 න් පසු උදා වූ සාමයත් සමඟ තවදුරටත් කොළඹ වරායේ ආනයන අපනයන කටයුතු සීඝ්‍ර වර්ධනයකට ලක්වූ බව සඳහන් වේ.

කොළඹ නගරයක් ලෙස දියුණු වූයේද පැහැදිලිවම කොළඹ වරාය හේතුකොට ගෙන ය. බැංකු ඇතුළු වෙළෙඳ අධිරාජ්‍යයක් බිහිවීම, මාර්ග පද්ධති, ගබඩා යනාදී රටට අත්‍යාවශ්‍ය අංග කොළඹ වරාය හේතුවෙන් ස්ථාපිත විය. අද වෙරළ තීරයෙහි දක්නට ලැබෙන ප්‍රදීපාගාර ද මෙසේ කොළඹ වරායේ දියුණුව සමග නාවික කටයුතු වෙනුවෙන් ස්ථාපිත කරන ලද ඒවා ය. වරාය ඇතුළු කොළඹ නගරය තුළ ප්‍රදීපාගාර හතරක් පිහිටන අතර, අද කොළඹ කොටුව තුළ පිහිටන ඔරලෝසු කණුව සහිත ප්‍රදීපාගාරය ලංකාවේ මුල්ම ප්‍රදීපාගාරය ලෙස සැලකේ. කොළඹ වරාය තවදුරටත් මෙරට ආර්ථිකයේ කේන්ද්‍රස්ථානය වන අතර වරාය හා නාවික ක්ෂේත්‍රය රටේ ආර්ථික සංවර්ධනයට දායක වන ප්‍රධාන අංගයක් බවට පත්වී ඇත. ප්‍රධානතම වෙළෙඳ වරාය ලෙස කොළඹ වරාය වැදගත් වන අතර තොග බහලුම් භාණ්ඩ, ජාත්‍යන්තර ආයෝජන සඳහා අවම පිරිවැය සහිතව, ප්‍රාග්ධන සංචිත සඳහා රට විවෘත කිරීමේ වාණිජ කේන්ද්‍රය හරහා ශ්‍රී ලංකාව ඉතාම නම්‍යශීලි සහ ආයෝජක හිතකර පරිසරයක් තිබීම ද වාසි සහගත තත්ත්වයකි.




කොළඹ 10, බෝධිරාජාරාම මාවතේ, අංක 06 පිහිටි, සී/ස ප්‍රින්ට් ඇන්ඩ් ප්‍රින්ට් ආයතනය මගින් මුද්‍රණය කරවා, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය මගින් ප්‍රසිද්ධ කරන ලදී.